# දෙසතිය

පුවත් සඟරාව

2024 ජූලි




# ආර්ථිකයේ නව දිශානතිය

# හිමාලයා ගැලැසියර් දිය වේ



ඉන්දියාවේ උතුරු ප්‍රදේශයේ පිහිටි හිමාලයා කඳු පන්තියේ පවතින ගැලැසියර් සීඝ්‍රයෙන් දියවෙමින් පවතින බව සමීක්ෂණ වාර්තා පෙන්වා දෙයි. තාප තරංගවල බලපෑමත් ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමත් හේතුවෙන් පරිසර උෂ්ණත්වය ඉහළ යාම ගැලැසියර් දිය වී යාමට හේතු වී තිබේ. විශේෂයෙන් ජම්මු කාශ්මීර ප්‍රදේශයේත් ලඩාක් ප්‍රදේශයේත් වැඩි වශයෙන් මේ තත්ත්වය දක්නට ලැබේ.

කාශ්මීර නිම්නයේ පිහිටි විශාලතම ගැලැසිරය ලෙස සැලකෙන කෝලාහෝයි ගැලැසියරයේ සියයට 23ක පරිමාවක් පසුගිය දශක කිහිපයේ දියවී ඇති බව වාර්තා වෙයි. හින්දුකුෂ් හිමාලයානු ප්‍රදේශය සැතපුම් 2000ක ප්‍රදේශයක් වටා විහිදෙන අතර ගැලැසියර් 18000කට ආසන්න සංඛ්‍යාවක් ජම්මු කාෂ්මීර් හා ලඩාක් ප්‍රදේශවල පවතින බව සමීක්ෂණ වාර්තා පෙන්වා දෙයි.

'ද හින්දු' පුවත්පතේ ප්‍රවෘත්ති වාර්තාවකින් පෙන්වා දෙන්නේ හින්දුකුෂ් හිමාල කඳුවැටි හරහා ගැලැෂියර් පෙර නොවූවිරූ වේගයකින් දියවෙමින් පවතින බවත් හරිතාගාර වායු විමෝචනය තියුණු ලෙස අඩු නොකළහොත් මේ සියවස අවසානය වන විට 80%ක් දක්වා ගැලැසියර් පරිමාව අහිමිවීමට හේතු විය හැකි බවත් ය.

(අන්තර්ජාලය ඇසුරෙනි)

**ඩබ්ලිව්. එම් ශාන්තප්‍රිය**

# දෙසතිය
පුවත් සඟරාව

වෙළුම 46, කලාපය 07,
2024 ජූලි

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150

උපදේශක සංස්කාරක
**දිනිත් චින්තක කරුණාරත්න**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛකයන්
**රංගිකා අබේසේකර**

ප්‍රවෘත්ති නිලධාරි
**නිල්මිණි ප්‍රනාන්දු**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

බෙදාහැරීම් සම්බන්ධීකරණය
**ඉරේෂා අබේනායක**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**හිතවත් පාඨකයිනි,**

46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව





20
ආර්ථිකයේ නව දිශානතිය



14
මෝදි සහ ශ්‍රී ලංකාව



03
ස්ට්‍රෝබෙරි ගම්මානය



35
කොග්ගල පොත්ගුල නිදහස් මාවතට



07
පල දරන ජනතා අපේක්ෂා



40
පය බරවායට පිටිකර බෙහෙත් බැඳීම

# දෙසතිය
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**

**දෙසතිය**

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ........................................
Address ........................................
........................................
........................................
ID Number ........................ Tel / Mobile ........................
Signature ........................ Date ........................

**දෙසතිය** සඟරා දායකත්වය

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය........................ හා ........................ දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් "ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්" නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05

# සුභාරංචිය යථාර්ථයක් කිරීම

නොබෝද (ජූනි 26) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ විශේෂිත කර්තව්‍යයක් සිදු විය. ඒ, ප්‍රංශයේ පැරිස් නුවරදී මෙරට ප්‍රධාන නිල ද්විපාර්ශ්වික ණය හිමියන් සමග ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා අවසන් කරමින් නිල ණය හිමියන්ගේ කමිටුව සමගත් චීනයේ බෙයිජිං නුවරදී එක්සිම් බැංකුව සමගත් අවසන් එකඟත්වයට එළඹීම ය. එම එකඟතාව සමග විදේශ රටවල සියලු ද්විපාර්ශ්වික ණය වාරික ගෙවීම් 2028 වසර දක්වා කල් දමා ගැනීමටත් ඉන්පසු සහනදායී කොන්දේසි මත සියලු ණය ගෙවා අවසන් කරන්නට 2043 වසර දක්වා දිගු කාලයක් ලබා ගන්නටත් අවස්ථාව ලැබෙයි. ඒ බව සඳහන් කරමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා එදින ජාතිය අමතමින් විශේෂ ප්‍රකාශයක් ද සිදු කළේ ය.


මෙය දේශපාලනික කෝණයෙන් බලා ඇතැම් පිරිස් විවේචනයට ලක් කළ ද ශ්‍රී ලංකා ආණ්ඩුව ගත් මේ ක්‍රියාමාර්ගයට බොහෝ මිත්‍ර පාර්ශ්වික රටවලින් සුබපැතුම් ගලා ආවේ මෙරට ආර්ථිකය ධනාත්මක ඉදිරි පියවරක් තබා ඇති බවට පැසසුම් ද එක් කරමිනි. මේ එකඟතා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන්නේ මේ මස මස 02 දින ය.

දිගුකාලීන අයවැය හිඟය සහ ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීමට මෙන් ම ආර්ථිකයේ අනෙකුත් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පසුගිය වසර ගණනාවක් ශ්‍රී ලංකාවට අඛණ්ඩ ව ජාත්‍යන්තරයේ ණය ගැනීමට සිදුවීමෙන් ණය බර ඉහළ ගිය බව නොරහසකි. ඉහළ පොලී අනුපාතික යටතේ ණය ගැනීමට සිදු වීම, කොවිඩ් 19 වසංගතයත් සමග නිල සංචිතය ක්‍රමක්‍රමයෙන් ක්ෂය වී යාම, මෙවැනි පසුබිමක ආර්ථික අර්බුදයක් නිර්මාණය වීම වැනි කාරණා මත විදේශ ණය ගෙවීම අත්හිටුවීමට සිදු වීම නිසා ජාත්‍යන්තර ප්‍රජාව කෙරෙහි ගොඩනැගුණේ ශ්‍රී ලංකාවේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳ අවිශ්වාසයකි.

එහෙත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යයේ වැදගත් ම පියවර මෙලෙස සාර්ථක කරගත් නිසා ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර විශ්වාසය වැඩි වැඩියෙන් තහවුරු වීම මත ඉදිරියේදී ජාත්‍යන්තර සහයෝගය පුළුල් ව ලැබෙනු ඇත. 2022 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකාව විදේශ ණය ගෙවන්නට බැරි බවට නිල වශයෙන් කළ ප්‍රකාශය අනුව නතර වූ සියලු කාර්යය නැවත ඇරඹීමට හැකි වීම ශ්‍රී ලංකාවට සුබදායී පණිවිඩයකි. ඒ අනුව විදේශ අරමුදල් යොදාගෙන සිදු කළ සියලු ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට ඒ ඒ රටවලට නීත්‍යානුකූල අවකාශය උදාවනු ඇත. ඒ ඔස්සේ රටේ සංවර්ධනය යළි පණ ගැන්වීමට අවකාශ ලැබෙනු ඇත.

ක්‍රමයෙන් රටේ ආර්ථික ස්ථාවරත්වය මෙවැනි ජාත්‍යන්තර සහයෝගිතා වැඩපිළිවෙළ ඔස්සේ තහවුරු කරමින් සිටින මොහොතක, එළඹ ඇත්තේ මැතිවරණ පවත්වන සමයක් නිසා මේ පිළිබඳ කතාබහ උණුසුම් වෙමින් පවතී. ඒ, පාට සහ පක්ෂවලට බෙදී එකිනෙකා විවේචනය කිරීමේ සංස්කෘතියට මුල්තැන දෙමිනි. ඒ නිසා මේ අවස්ථාවේ කළ යුත්තේ රටක් ලෙස එකමුතුව ආර්ථික අභියෝග ජය ගැනීමට පෙළ ගැසීම විනා ජය ගත් ජාත්‍යන්තර විශ්වාසය පළුදු කිරීම නොවේ.

\- සංස්කාරක -





# ස්ට්‍රෝබෙරි ගම්මානය

සමේලා රාජපක්ෂ

නුවරඑළිය ප්‍රදේශයේ ඉදි වන ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්ට්‍රෝබෙරි ආදර්ශ වගා ගම්මානය එම ප්‍රදේශයේ ගොවියන්ට ලැබුණු අනගි අවස්ථාවකි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සුහුරු කෘෂිකර්මාන්ත (SMART Agriculture) වැඩසටහන යටතේ මේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදෙස් මත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මිලියන 55ක ප්‍රතිපාදන මත සිදුකරන මේ ව්‍යාපෘතියේ අරමුණු වන්නේ තරුණ ගොවි ප්‍රජාව සවිබලගැන්වීම, තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය කෙරෙහි දක්වන නැඹුරුතාව වැඩි කිරීම, ගොවී ප්‍රජාවට කුඩා බිම්කඩක වැඩි අස්වැන්නක් ලබා ගැනීමට අවකාශ ලබා දීම, විශේෂයෙන් කාන්තාවන්ට රටේ කෘෂිකර්මාන්තය නැංවීමට දෛනික කාර්ය අතරතුර ඔවුන්ගේ ශ්‍රම දායකත්වය ලබා දීම, විදේශ විනිමය ඉපයීම මෙන් ම ගොවියන්ගේ පෞද්ගලික ජීවන තත්ත්වය නංවාලමින් තිරසර ආදායමක් ලබා ගැනීම ආදියයි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (ගොවි බැංකු) එස්. එම්. පී. කේ. වීරසේකර මැණිකේ ප්‍රකාශ කරන ආකාරයට දේශගුණික විපර්යාසවලට ලක්වන විට වගාවේ අස්වැන්න අඩුවන බැවින් මේ වැඩසටහන යටතේ දේශගුණික කලාපයක් නිර්මාණය කර එමගින් එම ගැටලුවට විසඳුම් ලබාගැනීමට හැකි වේ. ස්ට්‍රෝබෙරි වගාව සඳහා හොඳ ම දේශගුණික තත්ත්වය පවතින්නේ නුවරඑළිය ප්‍රදේශයේ නිසා නුවරඑළිය ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයේ සීතාඑළිය, පැරකුම්පුර, මීපිළිමාන, පට්ටිපොළ, ටොප්පාස් යන ප්‍රදේශවල මේ ස්ට්‍රෝබෙරි හරිත ගම්මාන වැඩසටහන ආරම්භ කර ඇත්තේ ගොවියන් 40 දෙනකු සඳහා ය.

අදහස් දක්වන සහකාර කොමසාරිස් (ගොවි බැංකු) එස්. එම්. පී. කේ. වීරසේකර මැණිකේ: "මුලින් ම ගොවියන් 40දෙනාගෙන් එක් ගොවියකුට ලබාදුන්නා වර්ග අඩි 1000ක හරිතාගාරයක්. ඒ අනුව නුවරඑළියේ වර්ග අඩි 40000ක හරිතාගාර තිබෙනවා. නුවරඑළියේ ගොවිජන සංවර්ධන නිලධාරී බාලසූරිය සහ ඩී. එච්. ඒ. දිල්හානි නියෝජ්‍ය කොමසාරිස්තුමියගේ මැදිහත්වීමෙන් ඔවුන්ගේ ක්ෂේත්‍ර අධ්‍යයන සහ සංචාරවලින් හඳුනාගෙන තිබෙනවා නුවරඑළියේ ගෙවතු වගාවක් ලෙස ස්ට්‍රෝබෙරි වගාව සිදුකළත් එයින් නියමිත අස්වැන්නක් නොලැබෙන බව. මෙයට හේතු වී ඇත්තේ නුවරඑළියේ ගොවියන්ට උසස් ප්‍රමිතියේ ස්ට්‍රෝබෙරි පැළයක් නොලැබීම. පිටරටින් ස්ට්‍රෝබෙරි පැළ ආනයනය කරන පුද්ගලයන් ඒවා තම නිෂ්පාදන සඳහා යොදාගෙන අපේ රටේ ගොවියන්ට ලබා දෙන්නේ සාර්ථක පැළයක් නොවෙයි. මේ හේතුවෙන් වැඩසටහන සඳහා තෝරා ගත්තේ නුවරඑළියේ දේශගුණයට ඉතා ම සමීප හොඳ ම ගුණාත්මක තත්ත්වයෙන් යුත් ෆෙස්ටිවල් (Festival) යන පැළයයි. මේ ස්ට්‍රෝබෙරි පැළ ආනයනය කරන්නේ ඊජිප්තුවෙන්. අප්‍රේල් 27 දින පැළ 18000ක් ඊජිප්තුවෙන් මෙරටට ආනයනය කළා. අප්‍රේල් 28 දින මේ සියලු පැළ හරිතාගාර වැට (Polytunnel) සඳහා මුදා හැරියා."

දැනට ස්ට්‍රෝබෙරි කිලෝවක් අලෙවි වන්නේ රුපියල් 2500-4000 අතර මිලකට ය. ඇය ප්‍රකාශ කරන ආකාරයට ඒ අනුව මේ වැඩසටහනෙන් නිෂ්පාදනය කරන ස්ට්‍රෝබෙරි කිලෝවක් රුපියල් 6000ක උපරිම මිලකට ලබාදීමට උත්සාහ කරන අතර ස්ට්‍රෝබෙරි හරිතාගාර වැට 40න් මාස 10ක් ඇතුළත මසකට කිලෝ 1800 බැගින් කිලෝ 18000ක් ලබා ගැනීමට හැකි වේ යැයි විශ්වාස කෙරේ. ඒ අනුව ගොවියන් 40 දෙනාට ම මාස 10ට රුපියල් 72,000ක ආදායමක් ලබාගත හැකි වනු ඇත.

නුවරඑළියේ ගොවිජන සේවා මධ්‍යස්ථාන සකස් කර අලෙවිසැල්වලින් අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක් දේශීය පරිභෝගිකයා සඳහා අලෙවි කිරීම මෙහිදී මූලික වශයෙන් අපේක්ෂා කෙරේ. විදේශීය වෙළෙඳපොළ අවස්ථා සොයා ගනිමින් ඩුබායි වැනි රටවල වෙළෙඳපොළට යොමු කිරීම ද

ඉදිරි බලාපොරොත්තුවකි. ගොවියන් 40 දෙනාගේ සහභාගිත්වයෙන් යුතු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට නිසි බලයක් ඇති ස්ට්‍රෝබෙරි ගොවි සංවිධානයක් පිහිටුවා තිබේ. මෙහිදී ඔවුන් රැස්වී ව්‍යාපෘතිය පිළිබඳ අදහස් හුවමාරු කරගන්නා අතර අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය මෙන් ම පෞද්ගලික අංශවල හවුල්කාරීත්වය ලබා ගැනීම සඳහා අවකාශය තිබේ. සහකාර කොමසාරිස් පවසන්නේ අවසාන නිමාව සාර්ථක ලෙස ළඟා කරගත හැකිවන්නේ ප්‍රමිතිගත හරිතාගාරයක ප්‍රතිරෝධ දැල, පොලිතින්, බිංදු ජල සම්පාදන ක්‍රමය, පොහොර භාවිතය යන මේ සියල්ල සමබර ව සහ උසස් මට්ටමින් සිදු කෙරේ නම් පමණක් බවත් මේ හේතුවෙන් ඊශ්‍රායලය, ඉතාලිය, ඊජිප්තුව වැනි රටවල පවතින තාක්ෂණය සහ වගා ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක යෙදෙමින් අවශ්‍ය අදහස් ලබාගනිමින් පියවරෙන් පියවර මේ ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යා හැකි බවත් ය.

මේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වූ වර්ග අඩි 1000ක හරිතාගාරයේ වහලය නිර්මාණය කිරීමට අවශ්‍ය වන UV ප්‍රතිරෝධ දැල්, කෘමි විකර්ශක දැල්, බිංදු ජල සම්පාදන පද්ධතියක්, වතුර ලීටර් 500ක ටැංකියක්, වතුර මෝටරයක්, අවුරුද්දක් සඳහා අවශ්‍ය වන පොහොර සහ කෘමිනාශක, දිලීර නාශක, ආනයනය කරන ලද පැළ සිටුවීම සඳහා කවර (Growing bag) රාජ්‍ය ප්‍රතිපාදන මත ගොවියාට ලබා දී තිබේ. මෙහිදී හරිතාගාර වැටක් (Polytunnel) සඳහා වැය වන සමස්ත වියදම රුපියල් මිලියන 1.35කි. මෙයින් ලක්ෂ 5ක් දරා තිබෙන්නේ ගොවියන් ය. රුපියල් 85,0000ක මුදලක් රජය දරා තිබෙන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවසානයේ පැළ මිලදී ගැනීම දක්වා සිදුකරන ක්‍රියාවලියේ වියදම දරා ඇත. පෞද්ගලික අංශයේ දායකත්වයෙන් ප්‍රමිතියෙන් උසස් හරිතාගාරයක් නිර්මාණය කර තිබෙන අතර පෞද්ගලික අංශය ලෙස මේ සඳහා යොදාගෙන තිබෙන්නේ ටෙන්ඩර් අනුව තෝරාගත් හොඳම සමාගමකි. ඔවුන්ගේ දායකත්වය ද මේ ව්‍යාපෘතියේ සාර්ථකත්වයට මනා රුකුලකි.

ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් පවසන්නේ කෘමි විකර්ශක දැල ඊශ්‍රායලයෙන් ආනයනය කරන විට විදේශීය රටවලින් ආනයනය කරන කෘෂිකර්මික නිෂ්පාදනය සඳහා බදු පනවා තිබීම හේතුවෙන් එය අභියෝගයක් වූ බව ය. මෙරට තිබූ දැල් එවක සොයා ගැනීමට නොතිබුණු නිසා නිසි ප්‍රමිතියෙන් යුතු දැල් ලබා ගනිමින් එම අභියෝගය ජය ගැනීමට පෞද්ගලික අංශයේ සහය ඊට ලැබී තිබේ.

අදහස් දක්වන ඇය; "මාස 10කින් අස්වනු නෙළූ පසු නැවත සිටුවීම



සඳහා නව පැළයක් අවශ්‍ය වෙනවා. මෙහිදී මව් ශාක අංකුරවලින් කිසිම ගැටලුවකුත් තොර ව වගා වාර 3කට, එනම් අවුරුදු 03ක් යනතුරු රෝපණය කර උසස් පැළ නිෂ්පාදනයකට යා හැකියි. වසර 03කින් පසුව නැවත පැළ ආනයනය කිරීමට අවශ්‍ය වන නිසා ඒ සඳහා වැඩපිළිවෙළක් සිදු කරන ආකාරය පිළිබඳවත් දැනටමත් සැලසුමක් ක්‍රියාත්මක කර අවසන්. ස්ට්‍රෝබෙරිවලින් මෙරට ජාතික අවශ්‍යතාව සම්පූර්ණ කරන්න පුළුවන්. ඊට වැඩි ම විභවතාවක් ඇත්තේ නුවරඑළියේ දිස්ත්‍රික්කයේ නිසා මේ ව්‍යාපෘතියේ ආරම්භය ම සාර්ථක වේ යැයි අපේක්ෂා කළ හැකියි. ගොවියන් 40 දෙනාගෙන් යුත් කණ්ඩායම වර්ධනය කිරීමත් ස්ට්‍රෝබෙරි වගාවට කැමැත්තක් දක්වන පිරිසක් ගොවි සංවිධානයෙන් සම්බන්ධ කරගෙන ස්ට්‍රෝබෙරි නිෂ්පාදනය 100%කට වැඩි ප්‍රතිශතයක් සැපයිය හැකි කණ්ඩායම නුවරඑළිය ගොවි කණ්ඩායම බවට පත් කිරීමත් ඉදිරි බලාපොරොත්තුවක්."

කිලෝ 18000ක පළමු අස්වැන්නෙන් දේශීය සහ විදේශීය වෙළෙඳපොළට යැවූ පසු යැවිය නොහැකි ව ඉතිරි වන ස්ට්‍රෝබෙරි සඳහා අගය එකතු කිරීමක් ද සිදු වේ. ඒ යටතේ ස්ට්‍රෝබෙරි ජෑම් (Strawberry Jam) අතුරු නිෂ්පාදනය ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නේ විදාතා ආයතනය සමග එක් ව ය. ඒ, ස්ටෝබරි වැඩසටහනේ අතුරු නිෂ්පාදන සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම සඳහා ය. කාර්මික තාක්ෂණ ආයතනයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහය ද ඒ සඳහා ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.







# දකුණු ආසියාවේ දෙවැනි තිරසර සංචාරක ගමනාන්තය

චන්දන මාරසිංහ

සංචාරක කර්මාන්තය යනු විදේශ විනිමය උපයන ප්‍රධාන මූලාශ්‍රයකි. 2022 වසරේදී ඇමරිකානු ඩොලර් බිලියන 1.1ක් පමණ වූ ආදායම 2023 වසරේදී ඇමරිකානු ඩොලර් බිලියන 2.1 දක්වා වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශාධිපති මහාචාර්ය එස්. කේ නාරද්ද ගමගේ පවසන්නේ 2024 වසරේදී ඇමරිකානු ඩොලර් බිලියන 04ක් පමණ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව ඉපයීමට අපේක්ෂා කරන බවයි. අදහස් දක්වන මහාචාර්යවරයා; "සමස්ත සේවා නියුක්තියෙන් 10%ක් පමණ අයත් වන්නේ සංචාරක කර්මාන්තයට. සෘජු රැකියා ලක්ෂ 05ක් පමණ එහි පවතිනවා. 2028 වසර වන විට රැකියා ලක්ෂ 10ක් පමණ දක්වා වර්ධනය කිරීම සැලැස්ම වී තිබෙනවා. නිෂ්පාදනවලට වෙළෙඳපොළක් සැපයීමට හැකි නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අවස්ථා පුළුල් කිරීමටත් සංචාරක අංශය ඉවහල් කර ගත හැකියි. ආර්ථිකයක් ඉදිරියට යන විට විවිධ ජාතීන් හා සංස්කෘතික කණ්ඩායම් අතර සුහදත්වය ඇති කිරීමටත් පාරිසරික සංරක්ෂණය හා යටිතල පහසුකම් වර්ධනය කිරීමටත් මේ ක්ෂේත්‍රය වැදගත්.

පසුගිය කාලයේ වැඩි ම සංචාරක පිරිස පැමිණ තිබෙන්නේ ඉන්දියාවෙනි. එම සංඛ්‍යාව 150,837කි. රුසියාවෙන් සංචාරකයන් 110,000කට වැඩි පිරිසක් පැමිණ තිබේ. බ්‍රිතාන්‍යයෙන් පැමිණි පිරිස 80,086කි. බෙල්ජියම, චීනය, ඇමරිකාව සහ ඕස්ට්‍රේලියාව වැනි රටවල් පදනම් කර ගනිමින් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ආරම්භ කර ඇති බව DAILY F T වාර්තා පෙන්වා දෙයි. සංචාරක සංවර්ධන අධිකාරිය සඳහන් කරන පරිදි මැයි මාසයේදී වැඩි ම සංචාරකයන් පිරිසක් පැමිණ තිබෙන්නේ ආසියා පැසිපික් කලාපයෙනි. ඒ, 57.8%කි. යුරෝපයෙන් පැමිණි සංචාරක පිරිස 10.3.කි. මෙරටට පැමිණි දස ලක්ෂය වැනි සංචාරකයා වන්නේ අයර්ලන්ත ජාතික යුවළකි.

සංචාරක ක්ෂේත්‍රය මෙලෙස යළි ගොඩනැගෙමින් පවතින පසුබිමක 'පරිසර සංචාරක ව්‍යාපාරය සඳහා තෙත්බිම් සහ තෙත්බිම් මධ්‍යස්ථාන' යන තේමාව මූලික කරගෙන කොළඹ පැවති (ජූනි 17-21) අන්තර්ජාතික තෙත්බිම් උද්‍යාන එකමුතුවේ ඕස්ට්‍රේලියානු, නවසීලන්ත හා ආසියානු පළමුවැනි සමුළුවට සමගාමී ව අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ජූනි 21 දින 'සීතාවක, අවිස්සාවේල්ල සංචාරක කලාපය' දෙවැනි තිරසර සංචාරක කලාපය ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. සිතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය පරිසර හිතකාමී සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට ද පියවර ගෙන තිබේ. පළමු සංචාරක කලාපය ලෙස සැලකෙන්නේ සීගිරිය ආශ්‍රිත කලාපයයි.

බස්නාහිර පළාතේ සංචාරකයන්ට ආකර්ෂණය වන ස්ථාන ගණනාවක් පවතී. විවිධාංගීකරණයට ලක් වූ සංචාරක ගමනාන්ත ලෝකයට හඳුන්වා දිය යුතු බව බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ සභාපති සුගත් හේවා පතිරණ පවසයි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ඔහු; 'පාරාදීසයෙන් පාරාදිසේ' යන්න අපේ තේමා පාඨයයි. ශ්‍රී ලංකාව



පාරාදීසයක් නම් එහි පිහිටි තවත් පාරාදීස හඳුන්වා දීම මෙහි අරමුණයි. සංචාරක කර්මාන්තය විවිධාංගීකරණය කිරීමෙන් අලුත් වෙළෙඳපොළ කරා ගමන් කිරීමේ හැකියාව පවතිනවා. 2018 වසරේදී රැම්සා සම්මේලනය කොළඹ නගරය ලොව පළමු තෙත්බිම් අග නගරය (**Wetland City**) ලෙස නම් කළා. තෙත්බිම් පාරිසරික සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය කරන පරිසරයක්. සංචාරක කලාප ගණනාවක් හඳුනාගෙන තිබෙනවා. කොළඹ නගරය ආශ්‍රිත නාගරික සංචාරක කලාපය, බොල්ගොඩ විශේෂ සංචාරක කලාපය ඊට නිදසුන්. කොල්ලුපිටිය හන්දියේ සිට දෙහිවල දක්වා රාත්‍රී ක්‍රියාකාරකම් සහිත ප්‍රදේශයක් ලෙස දියුණු කිරීමේ හැකියාව පවතිනවා. කැලණිය පන්සල ආශ්‍රිත ප්‍රදේශයත් ජාත්‍යන්තර අවධානයට ලක් කළ හැකියි."

වත්මන් ලෝක ප්‍රවණතාවක් වන්නේ 'තිරසර සංචාරක සංකල්පය'යි. මූලික වශයෙන් දිගුකාලීන ව පරිසරයට ධනාත්මක බලපෑමක් ඇතිවන ලෙස ක්‍රියා කිරීම මෙහි අරමුණ බව මහාචාර්ය එස් කේ. නාරද්ද ගමගේ පවසන්නේ බොහෝ රටවල මේ සංකල්පය ක්‍රියාත්මක වන බව අවධාරණය කරමිනි. සීතාවක, අවිස්සාවේල්ල සංචාරක කලාපය හඳුන්වා දෙන්නේ තිරසර සංචාරක ගමනාන්තයක් ලෙසයි. තිරසර සංචාරක ගමනාන්ත සොයා යාම නව ප්‍රවණතාවකි. තිරසර සංචාරක කර්මාන්තය සඳහා වන ජාත්‍යන්තර නිර්ණායක සපුරා යුතු බව සභාපති සුගත් හේවාපතිරණ පෙන්වා දෙන කරුණකි. කලාපයේ භූගෝලීය පිහිටීම, පරිසරයට හානි නොවන සංවර්ධන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම, විධිමත් ව කසළ බැහැර කිරීම, පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි අවධානය යොමු කිරීම, හෝටල් සහ සේවා සපයන ආයතන ප්‍රමිතිගත කිරීම ඒ අතර වැදගත් වේ. තිරසර සංචාරක කලාපයට ගැළපෙන ලෙස ප්‍රජාව පරිවර්තනය වීමත් වැදගත් ය. මේ නිසා සීතාවක අවිස්සාවේල්ල සංචාරක පුරවරයක් වූ පමණින් ගැමි සංස්කෘතියට හානියක් නොවිය යුතු බව සභාපතිවරයා පවසයි.

සංචාරක කර්මාන්තයේදී භෞතික වශයෙන් පරිසරයට එල්ල වන ඍණාත්මක හා ධනාත්මක බලපෑම් මෙන් ම සාමාජීය හා ආර්ථික වශයෙන් ද බලපෑම් ඇති වේ. තිරසර සංකල්පයක් ක්‍රියාත්මක කරන විට ස්වාභාවික සම්පත් සංරක්ෂණය වීම හා හානි අවම කිරීම, බලශක්ති පරිභෝජනයේදී කාර්යක්ෂමතාව උපරිම කිරීම හා පාරිසරික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. මෙහිදී ආර්ථික තිරසර බව කෙරෙහි ද අවධානය



**සුගත් හේවාපතිරණ**
සභාපති
බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය



මහාචාර්ය
**එස්. කේ. නාරද්ද ගමගේ**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශාධිපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

යොමු වීම එනම් අදාළ ප්‍රදේශයේ ජනතාවට ලැබිය යුතු ප්‍රතිලාභ පුළුල් කිරීම සහ සුභ සාධනය උපරිම වීම වැදගත් බව මහාචාර්යවරයා එස් කේ නාරද්ද ගමගේ සඳහන් කරන කරුණකි.

ස්වාභාවික සෞන්දර්ය සහිත පුරවරයක් ලෙස හඳුන්වා දිය හැකි සීතාවක ප්‍රදේශයේ යළි ගොඩනැගෙමින් පවතින සීතාවක රජමාලිගය, රාමා සිතා පුරාවෘත්තයේ සීතා දේවිය සැඟවූ ගල්ලෙන, කඳු නැගීමේ පහසුකම් පැවතීම දකුණු ආසියාවේ දෙවැනි තිරසර සංචාරක ගමනාන්තය ලෙස ලොව ප්‍රචලිත වීමට සුවිශේෂ ව බලපාන බව සභාපති සුගත් හේවාපතිරණ පෙන්වා දෙයි. එහි සුවිශේෂත්වය පෙන්වා දෙන මහාචාර්යවරයා; "ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කේන්ද්‍රස්ථානයක් වන්නේ කොළඹ නගරය. සංචාරකයන් රටට පැමිණි විට දින කිහිපයක් කොළඹ රැඳී සිටිනවා. ඔවුන්ට තිරසර සංචාරක අත්දැකීම් ලබාදීමට මෙය ඉවහල් කර ගත හැකියි. කොළඹ අගනගරය ජෛව විවිධත්වයෙන් මෙන් ම සංස්කෘතික කණ්ඩායම්වලින් පොහොසත්. මේ ඔස්සේ සංචාරක ආකර්ෂණය දිනා ගැනීමේ හැකියාව තිබෙනවා. ආර්ථික වශයෙන් බස්නාහිර පළාත සංවර්ධනය කිරීමට ද සංචාරක කර්මාන්තය දායක කර ගත හැකියි. ස්වාභාවික තෙත් බිම්, දුම්රිය සේවාව ඔස්සේ තිරසර සංචාරක කර්මාන්තයට අදාළ කාරණා ඉටු කර ගැනීමට සීතාවක, අවිස්සාවේල්ල සංචාරක කලාපය ඉවහල් වෙනවා."

තිරසර සංචාරක කලාප නම් කිරීමේදී අභියෝග ගණනාවක් පවතින බව ද මහාචාර්යවරයා සඳහන් කරයි. ආර්ථික සංවර්ධනය නිසා ඇති කරන තෙරපුම, පාරිසරික දූෂණය හා අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත ගැටලු මතු විය හැකි වීම, නිවර්තන කලාපයේ පිහිටීම නිසා දේශගුණ විපර්යාස බලපෑම් ඇතිවීමේ හැකියාව, සංචාරක හැසිරීම් රටාව එම අභියෝග කිහිපයකි. මේ තත්ත්ව සඳහා මුහුණ දීමට තිරසර සංචාරක ගමනාන්ත සංකල්පය උපරිම ලෙස යොදාගත හැකි බව මහාචාර්ය එස්. කේ නාරද්ද ගමගේ අවධාරණය කරන්නේ ප්‍රංශය, එංගලන්තය, සිංගප්පූරුව වැනි රටවල තිරසර සංචාරක ගමනාන්ත ඔස්සේ ඒ සඳහා විසඳුම් සොයාගෙන ඇති බව සඳහන් කරමිනි.

පාරිසරික බලපෑම් අවම වන ආකාරයෙන් කර්මාන්ත පවත්වාගෙන යාමත් වැදගත් වන්නේ උසස් මට්ටමේ සංචාරක කලාපයක් ලෙස ප්‍රචලිත වීමට එය ඉවහල් වන නිසයි. මේ සම්බන්ධයෙන් ජනතාවගේ අවබෝධය වැඩි කිරීමත් කළ යුත්තකි. තිරසර සංචාරක කලාපයක් ලෙස ශ්‍රී ලංකාව දියුණු කිරීමේදී වැඩි ආකර්ෂණයක් යුරෝපීය සංචාරකයන්ගෙන් ලබාගත යුතු අතර සංචාරකයන් රටට පැමිණීමේදී වියදම් කරන මුදල වැඩිකර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් හඳුන්වාදීමත් ප්‍රමුඛ අවශ්‍යතාවකි.

# පල දරන ජනතා අපේක්ෂා

කාංචනා සිරිවර්ධන



උරුමයට උරුමය ලබමින්

## උරුමය

අයවැය යෝජනා 2024 යටතේ ඉදිරිපත් කෙරුණු යෝජනාවක් අනුව පවුල් ලක්ෂ 20කට ඉඩම් හා ගොවි බිම්වල පූර්ණ පෞද්ගලික අයිතිය ලබාදීමේ ජාතික වැඩසටහන 'උරුමය' නම් වේ. 1947 රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාර ව දැනටමත් මහජනතාව භුක්ති විඳින ඉඩම් කොටස් සඳහා 1982 වසරේ සිට ලබාදුන් දීමනා පත්‍ර ලක්ෂ 20 සහ බලපත්‍ර ලක්ෂ 06 වසර කිහිපයක් ඇතුළත නිදහස් දීමනා පත්‍ර වශයෙන් පූර්ණ ලෙස බැහැර කිරීමත් ජනතාවට තමන් සතු ඉඩම් සම්බන්ධයෙන් අභිමත පරිදි කටයුතු කිරීමට හැකියාව ලබාදීමත් උරුමය වැඩසටහනේ මූලික අපේක්ෂාව වේ.

ඒ අනුව දැනට ලබාදී ඇති අවසර පත්‍ර හා දීමනා පත්‍ර සම්බන්ධයෙන් පැන නැගී ඇති ආරවුල් විසඳමින් ඒවා නිසි අයුරින් මිනුම් කටයුතු කර, 'උරුමය' නමින් ඔප්පු ලබාදීම මේ යටතේ සිදු කෙරේ. මේ වන විට මාස 04ක කාලයක් ඇතුළත ප්‍රතිලාභීන් 16000කට ඔප්පු ලබා දී අවසන් ය. වසර කිහිපයක් ඇතුළත සියලු ම අවසර පත්‍ර හා දීමනාපත්‍ර ලාභීන්ට ඔප්පු ප්‍රදානය කිරීමට සැලසුම් කොට ඇති අතර මේ වැඩසටහන යටතේ ම මින් පෙර අවසර පත්‍ර හෝ දීමනා පත්‍ර යටතේ ඉඩම් ලබාදී ඇති රණවිරුවන් ලක්ෂයක පමණ පිරිසකට ද ඔප්පු ලබාදීම සිදු කෙරේ.

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, මිනින්දොරු දෙපාර්තමේන්තුව හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මේ කාර්යයේදී පෙරමුණ ගෙන කටයුතු කරයි.

## නාගරික නිවාස ලබාදීම

නාමික අගයක් තීරණය කොට වසර 30ක් දක්වා ගෙවීමේ ක්‍රමවේදයකට අනුව රජයෙන් මහජනතාව වෙත ලබාදී තිබෙන මහල් නිවාසවල අයිතිය එම නිවාසවල පදිංචි ජනතාව වෙත ම පවරා දීම එනම් ඔවුන්ට ඔප්පු ලබාදීම 2024 අයවැය යෝජනා අනුව ක්‍රියාවට නැංවෙන ජාතික වැඩසටහනකි. වසර 30ක ගෙවීමේ ක්‍රමවේදයක් යටතේ ලබාදුන් එම මහල් නිවාසවල පළමු පිරිස පදිංචිකොට ද තව ම ගතවී ඇත්තේ වසර 10ක් පමණ ය. එම පිරිස අතරින් මුදල් ගෙවූ නොගෙවූ සියලු දෙනා වෙත අවමය ලක්ෂ තුනහාමාරක මුදලක් අය කරගෙන, එම නිවාසවල අයිතිය පදිංචිකරුවන් වෙත පවරා දීමට කැබිනට් අනුමැතියක් ලැබී තිබේ. එනම් මේ නිවාසවල පදිංචිකරුවන්ට ඔප්පු ලබාගත හැක්කේ ලක්ෂ තුනහාමාරක අවම මුදල රජය වෙත ගෙවීමෙන්



අනතුරු ව ය. ඔප්පු ලබාදීම සඳහා අවශ්‍ය මුද්දර ගාස්තු, නොතාරිස් ගාස්තු ඇතුළු අනෙකුත් වියදම් රජය දැරීමට නියමිත ය.

කොළඹ නගරයෙහි ඉදිකර ඇති මේ නාගරික මහල් නිවාස සංකීර්ණවල දැනට පදිංචි වී සිටින පිරිස 12500ක් පමණ වේ. මේ අතරින් 8500ක් පමණ නිවාසවලට මේ වසර තුළ ඔප්පු ලබාදීමට සැලසුම්කොට ඇති අතර ඉතිරි නිවාස සඳහා ඔප්පු ලබාදීම සිදු කෙරෙන්නේ 2025 වසරේදී ය.

මේ නාගරික මහල් නිවාස සංකීර්ණවල පදිංචිකරුවන්ට නිවාසවල ඔප්පු ලබාදීමෙන් අනතුරු ව එම නිවාස සංකීර්ණවල පරිපාලනය වෙනුවෙන් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙන් කළමනාකරණ සංස්ථා පිහිටුවීමත් ඒවා විධිමත් ව පරිපාලනය කරගෙන යෑමේ ක්‍රමවේදයක් සකස් කිරීමත් සිදු කෙරේ. මෙහිදී විශාල නඩත්තු වෙනුවෙන් මුදල් ලබාගැනීම සඳහා නිධන් අරමුදල නමින් අරමුදලක් පිහිටුවීමටත් ඊට අමතර ව කළමනාකරණ අරමුදලක් පවත්වාගෙන යෑමටත් ඒ ඔස්සේ එම නිවාසවල පරිපාලනය පවත්වාගෙන යෑමටත් සැලසුම් කොට තිබේ. ඉදිරියේදී මේ නිවාස සංකීර්ණවල පරිපාලනය ප්‍රජාවට ම කරගෙන යෑමට ඉඩකඩ සකසා දීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මේ වැඩසටහනේ අපේක්ෂාවයි.




## අස්වැසුම

සමාජ ආරක්ෂණය අවශ්‍ය පුද්ගලයන්ට අනිවාර්යයෙන් සහන ලැබෙන බව සහතික කිරීම සඳහා සුභ සාධන ප්‍රතිලාභ බෙදාහැරීමේ පද්ධතිය සැලකිය යුතු ප්‍රතිසංස්කරණවලට ලක්කිරීමට රජය පියවර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාත්මක වන නව ඒකාබද්ධ සුභ සාධන වැඩපිළිවෙළ 'අස්වැසුම' නම් වේ.

ඒ අනුව දැනට 'අස්වැසුම' ගෙවීම් සිදු කරන ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,894,140කි. 2024.07.01 දින සිට 'අස්වැසුම' ප්‍රතිලාභ ගෙවීම සිදු කරන ආකාරය අනුව සංක්‍රාන්තික සහ අවදානමට ලක්වූ කාණ්ඩය සඳහා මාසික ව රු. 5000ක්, දුප්පත් කාණ්ඩය සඳහා මාසික ව රුපියල් 8500ක්, අන්ත දිළිඳු කාණ්ඩය සඳහා මාසික ව රුපියල් 15000ක් වශයෙන් ප්‍රතිලාභ ලබාදීම සිදු කෙරේ. එහිදී පවුලේ සාමාජිකයන් ගණන 02ක් හෝ ඊට අඩුනම් අදාළ මුදලෙන් අඩක් පමණක් හිමි වේ.

ආධාර ලබන වෙනස් හැකියා සහිත තැනැත්තන් ලබන මාසික දීමනාව රුපියල් 7500ක් ද හේතුව හඳුනා නොගත් වකුගඩු රෝගී ආධාර ලබන තැනැත්තන් ලබන මාසික දීමනාව රුපියල් 7500ක් ද වැඩිහිටි ආධාර ලබන තැනැත්තන්ගේ මාසික දීමනාව රුපියල් 3000ක් වේ.

**දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභී පවුල් සඳහා අප්‍රේල් මාසය සහ මැයි මාසය සඳහා සහල් කිලෝ 10 බැගින් නොමිලයේ බෙදාදීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරන ලදි. මෙහි ප්‍රධාන ම අරමුණ අඩු ආදායම්ලාභී පවුල්වල පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමයි.**

'අස්වැසුම' දෙවැනි අදියර සඳහා සුදුසුකම් ලබාගැනීම වෙනුවෙන් ඉදිරිපත් වී ඇත 450,924ක් වන අයදුම්පත් සංඛ්‍යාව අතරින් ද අලුතින් සුදුසුකම් ලබන්නන් තෝරාගැනීම මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර ඉදිරියේදී ප්‍රතිලාභී පවුල් මිලියන 2.4ක් දක්වා පුළුල් කර 'අස්වැසුම' ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂා කෙරේ.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව, ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වැනි අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු රැසක මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරන 'අස්වැසුම' සුභ සාධන වැඩසටහන මින් පෙර ක්‍රියාත්මක වූ සුභ සාධන වැඩසටහන්වලට සාපේක්ෂ ව අක්‍රමිකතා හා දේශපාලන අතපෙවීම්වලින් බැහැර ව ක්‍රියාත්මක කිරීම රජයේ අපේක්ෂාව වේ.



## සහල් බෙදාදීමේ ජාතික වැඩසටහන

දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභී පවුල් සඳහා අප්‍රේල් මාසය සහ මැයි මාසය සඳහා සහල් කිලෝ 10 බැගින් නොමිලයේ බෙදාදීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරන ලදි. මෙහි ප්‍රධාන ම අරමුණ අඩු ආදායම්ලාභී පවුල්වල පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමයි. මිලියන 3.4ක් මේ සහනාධාරය ලැබීම සඳහා සුදුසුකම් ලැබූ අතර මේ සඳහා රජය වෙන් කළ මුදල රුපියල් බිලියන 26.6කි.

මහ භාණ්ඩාගාරයත් සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයත් මේ සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදුන් අතර 2023 වසරට සාපේක්ෂ ව 2024 වසරේ වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබාදීමට රජයට හැකිවිය. මේ වැඩසටහන යටතේ බෙදාදුන් සියලු ම සහල්, දේශීය සහල් නිෂ්පාදන වීමත් එහිදී අඩු ආදායම්ලාභී පවුල් වෙත සහනාධාර ලැබීමට අමතර ව දේශීය වී ගොවියාට අතදීමක් ද සෘජු ව ම දක්නට ලැබීමත් විශේෂත්වයකි. බෙදා දීම වෙනුවෙන් රජය විශාල සහල් ප්‍රමාණයක් මිල දී ගෙන තිබුණේ පොළොන්නරුව, අම්පාර, ත්‍රිකුණාමලය, හම්බන්තොට වැනි සහල් නිෂ්පාදනය වැඩි වශයෙන් සිදු කෙරෙන දිස්ත්‍රික්කවලිනි.

| දිස්ත්‍රික්කය | තෝරා ගත් ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 183,421 |
| ගම්පහ | 241,623 |
| කළුතර | 131,364 |
| ගාල්ල | 150,999 |
| මාතර | 125,727 |
| හම්බන්තොට | 116,596 |
| මහනුවර | 201,277 |
| නුවරඑළිය | 176,699 |
| මාතලේ | 87,832 |
| අනුරාධපුරය | 153,000 |
| පොලොන්නරුව | 71,007 |
| බදුල්ල | 139,685 |
| මොනරාගල | 110060 |
| අම්පාර | 139,685 |
| ත්‍රිකුණාමලය | 92,078 |
| මඩකළපුව | 156,368 |
| රත්නපුර | 241,008 |
| කෑගල්ල | 132,000 |
| පුත්තලම | 127,460 |
| කුරුණෑගල | 283,013 |
| මන්නාරම | 31,490 |
| වව්නියාව | 39,497 |
| යාපනය | 13,1652 |
| කිළිනොච්චිය | 30,896 |
| මුලතිව් | 34,146 |




සහල් සහනාධාර ලබමින්



# சிறுபான்மையின மக்களின் உரிமைக்கான உறுமய

எஸ். ஏ. எம். பவாஸ்

உலகின் அனைத்து நாகரீகங்களும் நிலத்தினை அடிப்படையாகக் கொண்டே தோற்றம்பெற்றுள்ளன. நிலத்தின் உரிமையில்லாத மனித வர்க்கத்தின் இருப்பு நிலைபெறாது என்பது இதிலிருந்து புலனாகின்றது. எமது மூதாதையர்களிடமிருந்து அரசாங்கம் பெற்றுக் கொண்ட காணிகளை அவர்களின் தற்போதைய பரம்பரையினருக்கு முழுமையான உரித்துடன் வழங்குவதற்காக 2024ம் ஆண்டு வரவு செலவு திட்டத்தின் 08வது முன்மொழிவின் கீழ் தேவையான நிதி ஏற்பாடுகளை செய்தமையானது இந்நாட்டின்நிலப்பயன்பாட்டில் ஏற்பட்ட திருப்பு முனையாகும். இந்த நாட்டின் மொத்த பூமியின் அளவு 162,000,000 (65,000 இலட்சம் ஹெக்டெயார்கள்) என்பதுடன் அவற்றில் 82□ நிலம் அரசாங்கத்துக்கு சொந்தமாக காணப்படுகின்றது.

1935 ஆம் ஆண்டின் 19 ஆம் இலக்க நில மேம்பாட்டுக் கட்டளைச் சட்டத்தின் மூலம் விவசாயிகள் மற்றும் குறைந்த வருமானம் பெறுபவர்களுக்கு நிபந்தனைகளுடன் கூடிய அனுமதிப் பத்திரங்கள் / கொடுப்பனவுப் பத்திரங்கள் உள்ள அரசாங்கக் காணிகளை நிபந்தனைகளின்றி முழுமையான உரிமையை மக்களுக்கு வழங்குவதற்கு ஜனாதிபதி ரணில் விக்ரமசிங்கவினால் 2024 வரவு செலவுத் திட்டத்தில் முன்வைக்கப்பட்ட ஒரு தனித்துவமான முன்மொழிவாகும்.

இந்த “உறுமய” நிகழ்ச்சித் திட்டத்தின் ஊடாக முழுமையான உரிமையுடைய காணி உறுதிப்பத்திரங்களைப் பெறுவதன் மூலம், குறித்த காணிக்கு புதிய பெறுமதி கிடைப்பதுடன், அவர்களின் உரிமையைப் பாதுகாத்து அவர்களின் குடும்பத்தின் பொருளாதாரத்தை வலுப்படுத்தவும் வாய்ப்பு உருவாகின்றது.

நாடு முழுவதும் 2 மில்லியனுக்கும் அதிகமான மக்களுக்கு காணி உறுதிகளை வழங்குதல், பல தலைமுறைகளாக அரசாங்கத்தால் கையகப்படுத்தப்பட்ட காணிகளை மக்களுக்கு மீண்டும் வழங்குதல், காணி உரிமை இல்லாதவர்களுக்கு வாழ்விட வசதிகளை வழங்குதல், பொருளாதார சுதந்திரத்தை ஊக்குவித்தல் மற்றும் வாழ்க்கைத்தரத்தை மேம்படுத்துதல் என்பன இந்த திட்டத்தின் முக்கிய குறிக்கோள்களாகும்.

இந்த காணி உரிமைகளை வழங்குவது மட்டுமல்ல காணி உரிமைகளைப் பெறும் விவசாயிகளின் வருமான வழிகளும் அதிகரிப்பதற்கான நடவடிக்கைகளையும் அரசாங்கம் எடுத்து வருகின்றது.

காணி உரிமையின்றி சிறுபான்மை இன மக்களே அதிகம் அவதிப்பட்டனர். ஒரு காலத்தில் யுத்தத்தினால் தமது நிலங்களை இழந்தனர். இன்று வேகமாக இடம்பெயர்ந்த போதும் அந்த காணிகளுக்கு உரிமை அவர்களுக்கு இருக்கவில்லை. மறுபுறம் மலையகத்தில் லயன் அறைகளில் வாழ்ந்து கொண்டு தமது நிலங்கள் தொடர்பில் சிறுபான்மை மக்கள் கனவு கண்டனர்.

1935 ஆம் ஆண்டிலிருந்து இன்றுவரை பருத்தித்துறையிலிருந்து தேவேந்திர முனை வரையில் காணி அனுமதிபத்திரங்கள் மட்டுமே வழங்கப்பட்டன. அவற்றை எந்த நேரத்திலும் இரத்துச் செய்ய முடியும் என்பதால், காணி உறுதி குறித்து மக்களுக்கு பாதுகாப்பு இருக்கவில்லை. காணியை சுத்தம் செய்து அதற்குள் விளைச்சல் செய்து அபிவிருத்தி செய்த பின்பும் அதற்கான உரிமை மக்களுக்கு கிடைக்கவில்லை.

இந்த நிலையிலேயே காணி அனுமதி பத்திரம் கொண்டவர்களுக்கு காணி உறுதிகளை வழங்க அரசாங்கம் தீர்மானித்தது. இந்த வேலைத்திட்டத்திற்கு முன்பாக கொவிட் – பொருளாதார நெருக்கடி காரணமாக இழக்கப்பட்டட சொத்துப் பெறுமதி உறுமய திட்டத்தினால் மீண்டும் வலுவடையும் என எதிர்பார்க்கப்படுகின்றது.

ஆசியாவில் எந்தவொரு நாடும் காணி உறுதிகளை மக்களுக்கு வழங்கவில்லை.

## உறுமய காணி உறுதிப்பத்திரங்களை வழங்கும் தேசிய வேலைத்திட்டத்தின் இரண்டாம் கட்டம்

உறுமய காணி உறுதிப்பத்திரங்களை வழங்கும் தேசிய வேலைத்திட்டத்தின் இரண்டாம் கட்டம் தற்போது நாடு தழுவிய ரீதியில் முன்னெடுக்கப்பட்டு வருகின்றது. இதுவரை காலமும் இலங்கை வரலாற்றில் எந்தவொரு அரசியல் தலைவரும் செய்திராத பொதுமக்களுக்கு அவசியமான ஓர் மகத்தான பணியினை ஜனாதிபதி ரணில் விக்கிரமசிங்க அவர்கள் முன்னெடுத்து வருகின்றார். நாட்டின் 25 மாவட்டங்களுக்கும் சென்று அங்குள்ள மக்களுக்கு தனது இரு கரங்களாலேயே இந்த உறுதிப்பத்திரங்களை அவர் வழங்கி வருவது சிறப்பான அம்சமாகும்.

இரண்டாம் கட்டத்தின் கீழ் கடந்த



மார்ச் மாதம் 01ம் திகதி முதல் மே மாதம் 31ம் திகதி வரை ஜனாதிபதி செயலக அலுவலகத்துக்கு அனுப்பி வைக்கப்பட்ட ஆவணங்களின் எண்ணிக்கை 3660 ஆகும். அவற்றில் சிறுபான்மையின மக்கள் வாழும் வடக்கு கிழக்கு மாகாணங்களுக்கே அதிகமான பத்திரங்கள் ஒதுக்கப்பட்டுள்ளது. யாழ்பாண மாவட்டத்திற்கு 567 பத்திரங்கள், கிளிநொச்சி மாவட்டத்திற்கு 625 பத்திரங்கள், மன்னார் மாவட்டத்திற்கு 213 பத்திரங்கள், வவுனியா மாவட்டத்திற்கு 230 பத்திரங்கள், முல்லைத்தீவு மாவட்டத்திற்கு 402 பத்திரங்கள், அம்பாறை மாவட்டத்திற்கு 184 பத்திரங்கள், மட்டக்களப்பு மாவட்டத்திற்கு 195 பத்திரங்கள், திருகோணமலை மாவட்டத்திற்கு 40 பத்திரங்கள் என ஒதுக்கப்பட்டதாக ஜனாதிபதி செயலகத்தின் கீழ் இயங்கி வருகின்ற உறுமய அலுவலகத்தின் புள்ளிவிபரங்கள் தெரிவிக்கின்றன.

அதே நேரம் ஜுன் மாதத்தில் மாத்திரம் 1772 உறுதிப்பத்திரங்கள் வழங்கப்பட்டுள்ளது. அண்மையில் வடக்குக்கு சென்ற ஜனாதிபதி அவர்கள் அங்குள்ள 05 மாவட்டங்களிலும் இடம்பெற்ற உறுமய காணி உறுதிப்பத்திரங்களை வழங்கி வைக்கும் நிகழ்வில் கலந்து கொண்டு அவற்றை மக்களுக்கு வழங்கி வைத்தமை குறிப்பிடத்தக்கது. அதன்படி ஜுன் மாதத்தில் மாத்திரம் யாழ்ப்பாண மாவட்டத்தில் 590 பத்திரங்களும், கிளிநொச்சி மாவட்டத்தில் 845 பத்திரங்களும், மன்னார் மாவட்டத்தில் 312 பத்திரங்களும், வவுனியா மாவட்டத்தில் 461 பத்திரங்களும், முல்லைத்தீவு மாவட்டத்தில் 560 பத்திரங்களும் வழங்கி வைக்கப்பட உள்ளன. ஜுன் மாத நிறைவில்





இரண்டாவது கட்டத்தின் கீழ் மொத்தமாக 5432 உறுதிப்பத்திரங்கள் வழங்கப்பட்டுள்ளன.

ஜனாதிபதி செயலகத்தின் கீழ் இயங்கி வருகின்ற உறுமய அலுவலகத்தின் பதிவுகளின் அடிப்படையில்,மட்டக்களப்பு மாவட்டத்தில் காணி உரிமையற்ற 27,595 குடும்பங்களுக்கு உறுமய வேலைத்திட்டத்தின் கீழ் காணி உறுதிப் பத்திரங்கள் வழங்கப்படவுள்ளது. அதில் இதுவரை 2610 பேருக்கு காணி உறுதிப் பத்திரங்கள் வழங்கப்பட்டுள்ளன.

மேலும் இவ்வேலைத்திட்டத்தின் கீழ் அம்பாறை மாவட்டத்தின் 17 பிரதேச செயலகப் பிரிவுகளில் தகுதியான 20,000 பேரில் 1768 பேருக்கு காணி உறுதிகளை வழங்கும் நிகழ்வு அண்மையில் ஜனாதிபதியின் தலைமையில் அம்பாறை வீரசிங்க விளையாட்டரங்கில் நடைபெற்றது.

இத்திட்டத்தின் கீழ் வவுனியா, மன்னார் மாவட்டங்களுக்கு 5400 முழு உரிமையுள்ள காணி உறுதிப் பத்திரங்கள் வழங்கப்படவுள்ளதன் முதற்கட்டமாக வவுனியா மாவட்டத்தின் 4 பிரதேச செயலாளர் பிரிவுகளையும் மன்னார் மாவட்டத்தின் 5 பிரதேச செயலாளர் பிரிவுகளையும் உள்ளடக்கிய 700 முழு உரித்துடைய காணி உறுதிகள் வழங்கப்பட்டன.

வடமாகாணத்தின் முல்லைத்தீவு, கிளிநொச்சி, வவுனியா, மன்னார் மாவட்டங்களை உள்ளடக்கி "உறுமய" வேலைத்திட்டத்தின் கீழ் மொத்தமாக 13,858 இலவச காணி உறுதிப் பத்திரங்கள் வழங்கப்பட உள்ளமை குறிப்பிடத்தக்கது. இதில் மன்னார் மாவட்டத்திற்கு 5000 காணி உறுதிகள் வழங்கப்படவுள்ள நிலையில், அவற்றில் 442 காணி உறுதிகள் அண்மையில் ஜனாதிபதியின் கரங்களால் வழங்கப்பட்டன.

மேலும்,முல்லைத்தீவு மாவட்டத்தின் 5 பிரதேச செயலாளர் பிரிவுகளை உள்ளடக்கிய 600 முழுமையான காணி உறுதிப் பத்திரங்கள் அண்மையில் வழங்கப்பட்டதோடு, முல்லைத்தீவு மாவட்டத்திற்கு "உறுமய" வேலைத்திட்டத்தின் கீழ் மொத்தமாக 1,376 இலவசப் உறுதிப்பத்திரங்கள் வழங்கப்பட உள்ளமை குறிப்பிடத்தக்கது.

அண்மையில் யாழ்ப்பாணத்துக்கு விஜயமொன்றை மேற்கொண்டிருந்த ஜனாதிபதி அவர்கள் கிளிநொச்சி மாவட்டத்தின் 4 பிரதேச செயலகப் பிரிவுகளை உள்ளடக்கிய 1700 முழு உரித்துடைய காணி உறுதிப்பத்திரங்களை வழங்கியதோடு யாழ்ப்பாண மாவட்டத்தின் 15 பிரதேச செயலகப் பிரிவுகளையும் உள்ளடக்கிய 1286 இலவசப் உறுதிப்பபத்திரங்களை மக்களிடம் கையளித்தார்.

எனவே, உறுமய காணி உறுதிப்பத்திரங்களை வழங்கும் தேசிய வேலைத்திட்டத்தின் கீழ் சிறுபான்மை மக்களின் நீண்டகால கனவாகிய வாழும் காணிக்கு உரித்து கிடைப்பதானது தற்போதைய ஜனாதிபதி முன்னெடுத்து வரும் காத்திரமான மக்கள் பணியில் ஒன்றாக அமையப்பெறுகின்றது.

# MOVING FORWARD FROM THE ECONOMIC CRISIS AFTER DEBT RESTRUCTURING

The government declared on April 12, 2022 that it was not in a position to repay the outstanding foreign debt taken before that date. It can be said that it is a declaration of kind of bankruptcy of a country because many of the financial transactions with Sri Lanka would have stopped due to this declaration. Giving loans to Sri Lanka by other countries have become standstill due to the government's declaration of non-payment of loans. Disbursement of remaining instalments of some other pledged loans to Sri Lanka was also suspended. Some countries also stopped accepting letters of credit from Sri Lankan banks. In short, the country was facing a situation where many financial activities in Sri Lanka were blocked, and there were various blockages in international transactions and the international financial market.

On the other hand, when the country was facing such economic and monetary setbacks, it had to face many issues in terms of managing macroeconomic management and maintaining the country's economic growth and development. It was mostly displayed in relation to exchange rates and balance of payments conditions. The Sri Lankan rupee continued to depreciate while it depreciated to Rs. 370 per dollar. There were also other issues like loss of income from the country's tourism and severe decrease in foreign remittances.

Sri Lanka had to confront various economic issues, since the Easter Sunday attack in April 2019. Foreign exchange earnings had marked a serious downturn mainly due to a significant decrease in the number of tourist arrivals to the country, a setback in investments and other activities, and a considerable decrease in investments and foreign grants. This situation resulted in the balance of payments issues and depletion of foreign reserves.



**Sunanda Madduma Bandara**
Former Senior Professor of the Department Economics
University of Kelaniya

**On the 26th, the amount of US $10.6 billion received from various countries under bilateral agreements was restructured. Accordingly, agreements were signed for the restructuring of bilateral debt of US $ 10.6 billion including US $ 4.66 billion received from China, US $ 2.35 billion received from Japan and US $ 1.36 billion received from India. The repayment of this loan, which was not paid upto now, will start in2028 and the time has been given till 2042 to complete the payment.**

In the last half of 2022, the above-mentioned factors mostly affected the significant drop in foreign reserves and the foreign exchange crisis worsened as a result of many reasons such as a large drop in tourist arrivals due to the Covid-19 epidemic, a decrease in foreign remittances, and a large amount of foreign exchange was spent on Covid vaccines and medicines. It seems that the tax reforms brought about after the political changes in 2019 also had a significant impact on the budget. Tax revenues decreased and the budget deficit increased significantly. The result of all this was that the country faced a serious crisis and was unable to pay its foreign debts.

Although macroeconomic management collapsed due to the suspension of repayment of foreign loans, it seems that the government has taken steps to manage these issues gradually. Inflation rose sharply, but the government made changes in macroeconomic policies to control it. As a result, it seems that policies such as controlling inflation, preventing exchange rate

depreciation, and raising funds for essential foreign exchange needs have been able to build a significant level of economic stability in the country. An application was made to obtain extended credit facilities from the International Monetary Fund (IMF) in order to solve the issues with the government and establish financial stability. In March 2023, the IMF decided to grant extended credit facilities to Sri Lanka and for that the government agreed to implement economic reforms in the country. One of its basic conditions was that the government should immediately resort to formal procedures for the restructuring of the country's debt. For that purpose, it is stated that according to the agreements reached between Sri Lanka and the IMF that they should enter into a debt restricting program with countries, institutions and investors who have given loans to Sri Lanka.

The government had taken foreign loans in three ways - multilateral financial institutional loans, bilateral loans and international financial market loans. International multilateral financial institutions had granted loans to Sri Lanka with the aim of financial cooperation for the country's development. Loans under this category were taken from institutions like the World Bank, IMF and the Asian Development Bank (ADB). Even after the government suspended the payment of foreign loans, the repayment of the loans taken from these institutions did not stop. The reason for this is that after Sri Lanka declared its debt default, the Sri Lankan government was advised to continue the debt payments with those institutions. Accordingly, the government did not stop the loan payments of those institutions and the repayments

**In the last half of 2022, the above-mentioned factors mostly affected the significant drop in foreign reserves and the foreign exchange crisis worsened as a result of many reasons such as a large drop in tourist arrivals due to the Covid-19 epidemic, a decrease in foreign remittances, and a large amount of foreign exchange was spent on Covid vaccines and medicines.**

were maintained in the same manner. So there was no problem related to that.

The total amount of foreign debt taken by the government was US $ 37 billion. Of that, $22.3 billion was development aid, which was provided by multilateral financial institutions and various countries. US $ 11.7 billion were obtained from multilateral financial institutions and US $ 10.6 billion dollars in bilateral loans from various countries. As mentioned above, even when Sri Lanka stopped paying the loan amount of 11.7 billion dollars from international financial institutions, it continued to pay. Therefore, the debt will not be restructured. This is because the loans are taken at very low interest rates and are given for a long time period to repay.

On the 26th, the amount of US $10.6 billion received from various countries under bilateral agreements was restructured. Accordingly, agreements were signed for the restructuring of bilateral debt of US $ 10.6 billion including US $ 4.66 billion received from China, US $ 2.35 billion received from Japan and US $ 1.36 billion received from India. The repayment of this loan, which was not paid upto now, will start in2028  and the time has been given till 2042 to complete the payment.

Due to this restructuring, there has been a grace period to repay the debt and the respective countries have also cut interest rates. Therefore, on the one hand, the loan instalments previously payable to Sri Lanka will be reduced significantly and due to the extension of the payment period, the debt pressure imposed on the country will be reduced significantly. As a result, the country will get economic stability and provide an opportunity to bring economic growth and development to a higher level.

Negotiations are still ongoing for the restructuring of the debt of US $ 14.7 billion taken by Sri Lanka from the international financial market. It is expected that the final conclusions will be reached soon.

By being able to restructure the debt in this way, Sri Lanka will soon be able to restart all the large-scale development projects that were stopped due to debt default. Also, since the economic stability of the country has been established, the flow of investments into the country will also commence while restoring commercial transactions between Sri Lanka and other countries at the personal and corporate level. Its results will be allowed to be enjoyed by all sections of the society through increased economic growth.



# මෝදි සහ ශ්‍රී ලංකාව



මහාචාර්ය
**නිහාල් හෙන්නායක**
ව්‍යාපාර ආර්ථික විද්‍යා අංශය
කළමනාකරණ හා මූල්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

භූගෝලීය වශයෙන් මෙන් ම නාවික ගමනාගමනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව පිහිටා තිබෙන්නේ ඉන්දියන් සාගරයේ ඉතා වැදගත් ස්ථානයක. ලෝකයේ තෙල් නැව්වලින් 2/3ක් පමණ මෙන් ම භාණ්ඩ ප්‍රවාහන නෞකාවලින් හරි අඩක් පමණ හම්බන්තොට වරාය පසු කරමින් ගමන් කරනවා. මේ සාධකය ශ්‍රී ලංකාවටත් ඉන්දියාවටත් දේශපාලනික, ආර්ථික, සාමාජීය වශයෙන් ඉතා වැදගත්.

ගැඹුරු සහ විශාල වරායක් වන කොළඹ වරාය අපේ ශ්‍රම හමුදාව සහ කාර්යක්ෂමතාව අතින් එක්තරා කාලයක ලෝකයේ දියුණු ම වරාය අතරට පැමිණෙනවා. ඉන්දියාවේත් බොහෝ නාවික ප්‍රවාහන කටයුතුවලට කොළඹ වරාය අතිශයින් වැදගත්. මේ නිසා වරාය සහ මෙරට පිහිටීම හේතුවෙන් ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර සම්බන්ධතාව අමතක කළ නොහැකියි.

දැන් අප සිටින්නේ ආර්ථික අර්බුදයක. ණය ගෙවීම් සම්බන්ධයෙන් බොහෝ අපහසුතා තිබෙනවා. චීනයයි තනි රටක් හැටියට වැඩියෙන් ම අපට ණය ලබා දී තිබෙන්නේ. එය මුළු ණය ප්‍රමාණයෙන් 20%ක් පමණ වනවා. චීනයත් ඉන්දියාව මෙන් ශ්‍රී ලංකාව සමග ළඟින් ම ගනුදෙනු කරන රටක්. නමුත් අප චීන ණය උගුලක සිර වී සිටිනවා යැයි කෙනෙකුට කියන්න පුළුවන්. චීන ණයවලින් බේරෙන්න අප චීනය පැත්තට දේශපාලනික වශයෙන් තරමක් නැඹුරු වුණා ම ඒක ඉන්දියාවයි චීනයයි අතර තිබෙන දේශපාලනික වියවුලට තරමක් බලපානවා. ඉන්දියාවේ ආරක්ෂාව සහ ඉන්දියාවේ ආර්ථිකය යන සියල්ලට ම ශ්‍රී ලංකාවේ පිහිටීම සහ වරාය යනාදිය විශාල ලෙස බලපාන නිසා ඉන්දියාව සෑම විට ම කැමතියි චීන ණය උගුලේ ශ්‍රී ලංකාව සිර නොකර තබා ගැනීමට. ඒ නිසා අර්බුදයට ලක් වූ 2021, 2022 කාලයේ පමණක් නොවෙයි ඊට පෙර පවා යම් කිසි ආකාරයකින් ලබාගත් විදේශ ණය ගෙවාගත නොහැකි වූ විට ඉන්දියාවයි අපට බොහෝදුරට උදව් කළේ. මේ අර්බුද අවස්ථාවේ පවා ඉන්දියාවෙන් අපට ඩොලර් බිලියන 3ක පමණ ආධාර දුන්නා. තෙල් සහ අත්‍යාවශ්‍ය ඖෂධ ගෙන්වීමට අපට ඩොලර් තිබුණේ නැහැ. ආර්ථික අර්බුදය අවස්ථාවේ මෙන් ම ශ්‍රී ලංකාවේ දේශපාලන ස්ථාවරත්වය වෙනුවෙන් ද ඔවුන් පෙනී සිටිනවා. ඇතැම් දේශපාලන පක්ෂ යම්කිසි කාලයකදී පැවසුවා අප ඉන්දියානු ව්‍යාප්තවාදයට හසු වී සිටින බව. ඉන්දියාවේ ගොදුරක් වී තිබෙන බව. මෙවැනි යල්පැන ගිය දේශපාලන සංකල්ප අදට ගැළපෙන්නේ නැහැ.

ත්‍රිකුණාමලේ තෙල් ටැංකි බ්‍රිතාන්‍ය සමාගම් විසින් නඩත්තු කර ව්‍යාපාර කටයුතු ඇරඹීමට ගිය අවස්ථාවේ අපේ දේශපාලනඥයන් නොයෙක් වියවුල් ඇති කර එම අවස්ථාව මගහැර ගත්තා. ඊට ඉඩ නොදී සිටීම නිසයි සිංගප්පූරු වරාය දියුණු වෙන්නේ. මෑතකාලයේ සිංගප්පූරු අගමැතිවරයා පවසනවා ශ්‍රී ලංකාවේ වමේ ව්‍යාපාරයට සහ වෘත්තීය සමිති අරගලවලට පිංසිදු වෙන්න සිංගප්පූරු වරාය දියුණු කරගන්න ඔවුන්ට පුළුවන් වුණා කියලා. දැන් නැවත ඉන්දියාව නොයෙකුත් ආයෝජන ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ ආරම්භ කරන්න උත්සාහ දරනවා. උදාහරණයක් ලෙස මන්නාරමේ සුළං විදුලි බලාගාර, සූර්ය විදුලි බලාගාර පෙන්වා දෙන්න පුළුවන්. තක්සේරු කර තිබෙන ආකාරයට මේ විදුලි බලාගාරවලින් ඉතා විශාල විදුලි ඒකක ප්‍රමාණයක් නිෂ්පාදනය කරගන්න හැකියාව තිබෙනවා. මෙහිදී මෙරට අවශ්‍යතාවට වඩා වැඩි විදුලි ඒකක ප්‍රමාණයක් නිෂ්පාදනය කර, අතිරික්තය ඉන්දියාවට ලබා දෙන්න පුළුවන් බවටත් ඇස්තමේන්තු කර තිබෙනවා.

ඉන්දියාවේ ව්‍යාපාරික පැළැන්තිය මේ ආකාරයෙන් විශාල වශයෙන් දියුණු වන

විට එරට ව්‍යාපාරිකයන් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරනවානම් ඉන්දියාවේ දියුණුවත් සමග ශ්‍රී ලංකාවේ දියුණුවත් ඇති කර ගන්න පුළුවන්. ඉන්දියාව අමතක කර අප බලාපොරොත්තු වන අන්දමේ සංවර්ධනයක් ශ්‍රී ලංකාවේ ඇති කර ගන්න බැහැ. අප මේ ගමන යා යුත්තේ ඉන්දියාවත් සමග.

ශ්‍රී ලංකාවේ වත්මන් පාලනය පෙර නොවූ විරූ ආකාරයට ඉන්දියාවත් සමග සම්බන්ධතා වැඩිදියුණු කරගෙන තිබෙනවා. ඒ නිසයි මෙවර නරේන්ද්‍ර මෝදි ජයග්‍රහණය කර, ඉන්දීය අගමැති



> අප බලා සිටිය යුතුයි මෝදි ඉන්දියාවේ දේශපාලන ස්ථාවරත්වය ඔස්සේ ජීවන වියදමට, විරැකියාවට, දරිද්‍රතාවට විසඳුම් සොයමින් ඉන්දියාව සංවර්ධනය කරා රැගෙන යන ආකාරය. ඔහු ඒ සඳහා තෝරා ගන්නා මාර්ගය අපට ආදර්ශයට ගත හැකියි. අප ඉන්දියාව සහ මෝදි සමගින් කිට්ටු සබඳතාවක් පවත්වාගත යුත්තේ ඒ නිසයි.

ලෙස දිවුරුම් දෙන විට ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා ඉන්දියාවට ගොසින් ම සුබ පතන්නේ. ඉන්දියාව අපට ඒ තරමට වැදගත්. මෝදි පමණක් නොවෙයි, කවුරුන් අගමැති වෙලා හිටියත් ඊළඟට වැඩි ම ඡන්ද ප්‍රමාණයක් ගත් රාහුල් ගාන්ධි අගමැති වෙලා හිටියත් සිදු වන්නේ එයමයි. රාහුල් ගාන්ධිත් දන්නවා මෝදිත් දන්නවා ශ්‍රී ලංකාව, ඉන්දියාවට ඉතා වැදගත් බව. එසේ ම ශ්‍රී ලංකාවත් ඒ කාරණය තේරුම් ගත යුතුයි.

වසර එකහමාරක කාලයේ ඇති කරගත් අලුත් නීති රීති සහ යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකාව ඉතා වේගයෙන් සාර්ථක ප්‍රතිඵල අත්කර ගනිමින් සිටින බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මෙරට ප්‍රධාන නියෝජිතයා වන බෲවර් මහතා ප්‍රකාශ කර තිබෙනවා. ශ්‍රී ලංකාව ආර්ථිකයේ උච්චාවචන බොහෝදුරට පාලනය කරගෙන තිබෙන බවත් සඳහන් කරමිනුයි ඔවුන් තුන් වැනි ණය වාරිකය නිදහස් කරන්නේ. සැබවින් ම ඩොලර් මිලියන 339 ඉතා ම සුළු මුදලක්. අප එවැනි ප්‍රමාණයක් සංචාරක ව්‍යාපාරයෙන් උපයනවා. ඊට වඩා විශාල ප්‍රමාණයක් විදේශ ප්‍රේෂණවලින් උපයනවා. වැදගත්කම තිබෙන්නේ ලැබෙන මුදල් ප්‍රමාණය මත නෙවෙයි. ශ්‍රී ලංකාව විදේශවලින් ණය ගන්නා විට අවසාන ණය දෙන්නා හැටියටයි IMF වෙත යන්නේ. ඔවුන් අපේ ප්‍රගතිය සමාලෝචනය කර ණය වාරික අනුමත කළේ නැත්නම් දැනට ලෝක බැංකුවෙන් පොරොන්දු වූ ඩොලර් මිලියන 1700ක පමණ ණය මුදල, ආසියානු සංවර්ධන බැංකුවෙන් පොරොන්දු වූ ඩොලර් මිලියන 1000ක පමණ ණය මුදල නොලැබී යන්න පුළුවන්, ඒ, විශ්වාසය නොමැතිකම නිසා. එසේ වුණානම් නැවත අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් අපේ මුදල් අවශ්‍යතාව සපුරාගත නොහැකි මට්ටමට පත්වෙනවා. ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නට තිබෙන සියලු ම මාර්ග ඇහිරී යනවා. ආජන්ටිනාව, ග්‍රීසිය වැනි රටවල් ආර්ථික අර්බුදයට ගොදුරු වී වසර 10කට වඩා වැඩියි. තවමත් ඔවුන් එය විසඳාගෙන නැහැ. කෙසේ හෝ ශ්‍රී ලංකාව මේ ජයග්‍රහණය කෙටි කාලයකින් ලබා ගැනීමේ වටිනාකම කියා නිම කරන්නට බැහැ.

මා අදහස් කරන්නේ නැහැ මේ ජයග්‍රහණය අත්පත්කර ගැනීමෙන් ජනතාවගේ ජීවන වියදම, විරැකියාව, දරිද්‍රතාව අඩු වී තිබෙන බවක්. ඔවුන් සැහෙන දුෂ්කරතා මධ්‍යයේයි ජීවත් වන්නේ. එහෙත් ජනතාවගේ මේ අවම කැපකිරීම නැතු ව ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නට බැහැ. එය ඔවුන් තේරුම් ගැනීම ඉතා වැදගත්.

මෝදි තමයි මෑතකාලයේ කලාපයේ රටක අගමැතිවරයකු හැටියට ඉතා ම සාර්ථක වුණේ. ලෝකයේ වේගයෙන් සංවර්ධනය වෙමින් තිබෙන රටවල් අතර ඉන්දියාව ඉදිරියෙන් ම සිටිනවා. එරට ජනතාවගේත් ආයෝජකයන්ගේත් මනස සකස් කර මෝදි ඉන්දියාව ඒ තත්ත්වයට ගෙනාවා. හැබැයි ඒ නිසා මෝදි බලාපොරොත්තු වුණා යම් යම් දැඩි ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න. රටක් ආර්ථික අර්බුදයකින් ගොඩගන්න නම් දැඩි ආර්ථික වෙනස්කම් කළ යුතු වෙනවා. ඉන්දියාවටත් එවැනි වෙනසකම් කරන්න අවශ්‍ය වුණා.

ඉන්දියාව 2047 වසර වන විට සිය වැනි නිදහස් සංවත්සරය සමරනවා. ශ්‍රී ලංකාව නිදහස ලබා සිය වැනි සංවත්සරය සමරන්නේ 2048 වසරේදී. මෝදි තමයි මුලින් ම පැවසුවේ 2047 වසර වන විට ඉන්දියාව සංවර්ධිත රටක් විය යුතුයි කියලා. අපත් කිව්වා 2048 වසර වන විට ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් විය යුතුයි කියලා. එහෙමනම් ඉන්දියාව 2047 වසරේදී සංවර්ධිත රටක් කරා ගමන් කරන දිශාවට ම ගමන් කරන්න අපටත් පුළුවන්නම් එය අපේ රටේ සංවර්ධනය වෙනුවෙන් ඉතා ම වැදගත්.

ඉන්දියාවේ සංවර්ධන සැලැස්මේ මෝදි විශේෂයෙන් කතා කරනවා තරුණ පරම්පරාවේ දායකත්වය ආර්ථික සංවර්ධනයට ලබාගැනීම, දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීම, දේශීය ආයෝජකයන්ට අතදීම වැනි කාරණා ගැන. ඉන්දියාවේ අදානි, අම්බානි වැනි ආයතන දැනටමත් ප්‍රකාශ කර තිබෙනවා ඔවුන් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන බව. මේ ආයෝජන ඔස්සේ ශ්‍රී ලංකාවට ඉතා ඉක්මනින් දියුණු වෙන්න හැකියාව තිබෙනවා. අප බලා සිටිය යුතුයි මෝදි ඉන්දියාවේ දේශපාලන ස්ථාවරත්වය ඔස්සේ ජීවන වියදමට, විරැකියාවට, දරිද්‍රතාවට විසඳුම් සොයමින් ඉන්දියාව සංවර්ධනය කරා රැගෙන යන ආකාරය. ඔහු ඒ සඳහා තෝරා ගන්නා මාර්ගය අපට ආදර්ශයට ගත හැකියි. අප ඉන්දියාව සහ මෝදි සමගින් කිට්ටු සබඳතාවක් පවත්වාගත යුත්තේ ඒ නිසයි. අපට චීනය අමතක කරන්නත් බැහැ. චීනය මෙන් ම කලාපයේ අනෙක් රටවල් සමගත් සුහදතාව පවත්වාගෙන යාම වැදගත්.

**කාංචනා සිරිවර්ධන**

# සඳ මෙහෙයුම




**නිහාල් පීරිස්**

කලකට පෙර අභ්‍යවකාශ ගවේෂණ ක්ෂේත්‍රයේ ඉදිරියෙන් ම සිටියේ ඇමරිකාව සහ රුසියාව යන රටවල් වුවත් චීනය ද මේ ක්ෂේත්‍රයේ වේගවත් ඉදිරි ගමනක නිරත ව සිටින බව නොරහසකි. අභ්‍යවකාශ ගවේෂණ ක්ෂේත්‍රයේ මෙයට පෙර කිසිවකුත් නොකළ තවත් ඓතිහාසික වික්‍රමයක් කිරීමට පසුගිය දිනවල චීනය සමත් විය. ඔවුන් මේ දස්කම කළේ සඳ ගවේෂණ ක්ෂේත්‍රයට අදාළවයි.

සඳෙහි කිසි විටෙක පෘථිවියට නොපෙනෙන අර්ධයක් තිබේ. එම අර්ධය 'අඳුරු අර්ධය' යන නමින් ද හැඳින්වේ. මෙය නිතර ම පෘථිවියෙන් ඉවතට මුහුණ ලා පිහිටන්නේ සඳ තමා වටා භ්‍රමණය වන වේගය සහ එය පෘථිවිය වටා ගමන් කරන වේගය සමාන වීම නිසා ය. 'අඳුරු අර්ධය' යන නමින් හැඳින්වුණත් මෙය අන්ධකාරයෙන් වැසුණු කලාපයක් නම් නොවේ. එයට ද සාමාන්‍ය ආකාරයෙන් හිරු එළිය පතිත වේ. එහෙත් 'අඳුරු අර්ධය' යන නම භාවිත වන්නේ එම අර්ධය කිසිදු පෘථිවියට නොපෙනීම නිසා ය.

මෙයට පෙර සඳ තරණයෙහි නිරත වූ ඇමරිකාව, රුසියාව වැනි රටවල් විවිධ අවස්ථාවල සඳෙහි පස් සහ ගල් සාම්පල පෘථිවියට රැගෙනවිත් තිබුණත් ඒ කිසිදු රටක් මේ අඳුරු අර්ධයෙන් එම සාම්පල රැගෙනවිත් තිබුණේ නැත. සඳ ගවේෂණ ඉතිහාසයේ පළමු වතාවට එම දස්කම කිරීමට සමත් වූයේ චීනයයි. මේ කලාපයෙන් මෙවැනි සාම්පල ගෙන ඒම තබා එම කලාපය මත යානයක් ගොඩ බැස්සවීම පවා ඉතා දුෂ්කර සහ අභියෝගාත්මක කාර්යයක් ලෙස සැලකේ. මේ අර්ධය මත යානයක් ගොඩ බැස්සවීමේදී යානය සඳට මුවා වීම හේතුවෙන් එය සහ පෘථිවිය අතර සන්නිවේදන සබඳතා අඩාල වීම ඊට හේතුවයි. එහෙත් චීනය මේ අභියෝගය ජය ගන්නට සමත් විය. එහිදී ඔවුන් යානය සමග සබඳතා පවත්වා ගත්තේ සඳට ඉහළින් ස්ථානගත කර තිබූ විශේෂ සන්නිවේදන චන්ද්‍රිකාවක් ඔස්සේයි.

ඉතිහාසයේ පළමු වරට සඳෙහි අඳුරු අර්ධයෙන් පස් සාම්පල පෘථිවියට රැගෙන ආ චීන මෙහෙයුම හැඳින්වුණේ චැංග්’ඊ- 6 යන නමිනි. චැංග්’ඊ යනු චීනයේ පුරාණ කතාවල එන සඳට අධිපති දෙවඟනකගේ නමකි. මේ මෙහෙයුම ක්‍රියාත්මක කළේ චීනයේ ජාතික අභ්‍යවකාශ ආයතනයයි. චැංග්’ඊ 6 සිය ඓතිහාසික කාර්යය සඳහා චීනයේ හයිනාන් දූපතේ පිහිටි අභ්‍යවකාශ මධ්‍යස්ථානයකින් පිටත් වූයේ  මැයි 3 දින ය.

මේ මෙහෙයුම මොඩියුල (Modules) කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක වූවකි. සඳ වටා ගමන් කරන Orbiter මොඩියුලයක්, සඳ මත ගොඩ බසින Lander මොඩියුලයක්, සාම්පල සඳ මත සිට Orbiter මොඩියුලය වෙත රැගෙන එන Ascender මොඩියුලයක් සහ අවසානයේ එම සාම්පල පෘථිවිය වෙත රැගෙන එන Returner මොඩියුලයක් ඊට අයත් විය.

Lander මොඩියුලය පස් සාම්පල එකතු කිරීම සඳහා සඳ මත ගොඩබට ස්ථානය ද විශේෂ ස්ථානයකි. එයිට්කන් ද්‍රෝණිය නමින් හැඳින්වෙන එය සැලකෙන්නේ සූර්යග්‍රහ මණ්ඩලයේ පිහිටි විශාලතම ආවාටයක් ලෙසිනි. එය කෙතරම් විශාල අවාටයක් ද යත් එහි විෂ්කම්භය

කි.මී. 2,500ක් පමණ බව සඳහන් වේ. ගැඹුර කි.මී. 8කට ආසන්න ය.

මේ ආවාටය තුළට ගොඩ බැසීමෙන් පසු පස් සාම්පල එකතු කිරීමේ කාර්යය ආරම්භ වූ අතර එය සිදු වූයේ රොබෝ හැන්දක් සහ විදුම් උපකරණයක් ඇසුරෙනි. සාම්පල ගන්නා ලද්දේ සඳෙහි පෘෂ්ඨය මීටර 2ක් පමණ ගැඹුරට විදීමෙනි. මේ සාම්පල රැගත් Returner මොඩියුලය ජුනි 25 දින පෘථිවියට සේන්දු විය. චැංග්'ඊ- 6 හි සම්පූර්ණ ගමන සඳහා ගත වූ කාලය දින 53කට ආසන්න වූයේ ය.

සඳෙහි පස් සාම්පල පිළිබඳ අධ්‍යයනය කිරීමට විද්‍යාඥයන් මේ තරම් උනන්දුවක් දක්වන්නේ පෘථිවිය ඇතුළු සූර්යග්‍රහ මණ්ඩලයේ ආරම්භය සහ විකාශනය පිළිබඳ අවබෝධ කරගැනීමට ඒ ඔස්සේ හැකියාව ලැබෙන නිසා ය. චැංග්'ඊ 6 ගොඩබට යෝධ ආවාටය මෙයට වසර බිලියන 4කට පමණ පෙර ඇති වූවක් බව සඳහන් වේ.

සඳ මත ඇති ස්වාභාවික සම්පත් සම්බන්ධයෙන් ද යම් අවබෝධයක් ලබා ගැනීමට මේ සාම්පල අධ්‍යයනය කිරීමෙන් විද්‍යාඥයන්ට හැකියාව ලැබේ.

අනාගතයේ සඳ මත විද්‍යාගාර වැනි ඉදි කිරීම් කිරීමට ද විද්‍යාඥයෝ බලාපොරොත්තු වෙති. මෙවැනි කාර්ය සඳහා භාවිත කිරීමට අදහස් කරන්නේ ද සඳේ පස්වලින් සාදා ගන්නා ගඩොල් ය. පස් සාම්පල පරීක්ෂා කිරීමෙන් මෙබඳු කාර්ය සඳහා උදව් වන තොරතුරු ද උකහා ගැනීමට හැකියාව තිබේ.

සඳෙහි පෘථිවියට පෙනෙන අර්ධයට වඩා මේ අර්ධයේ ඇති එක් විශේෂත්වයක් ලෙස සැලකෙන්නේ එහි ආවාට ආදිය අතීතයේ ගලා ගිය ලාවා වැනි දේවලින් එතරම් ආවරණය වී නොතිබීමයි. මේ නිසා වඩාත් නිවැරදි තොරතුරු ලබා දිය හැකි සාම්පල, වඩාත් පහසුවෙන් රැස් කර ගැනීමට හැකියාව ඇති බව විශ්වාස කෙරේ.

**ඉතිහාසයේ පළමු වරට සඳෙහි අඳුරු අර්ධයෙන් පස් සාම්පල පෘථිවියට රැගෙන ආ චීන මෙහෙයුම හැඳින්වුණේ චැංග්'ඊ- 6 යන නමිනි. චැංග්'ඊ යනු චීනයේ පුරාණ කතාවල එන සඳට අධිපති දෙවඟනකගේ නමකි. මේ මෙහෙයුම ක්‍රියාත්මක කළේ චීනයේ ජාතික අභ්‍යවකාශ ආයතනයයි. චැංග්'ඊ 6 සිය ඓතිහාසික කාර්යය සඳහා චීනයේ හයිනාන් දූපතේ පිහිටි අභ්‍යවකාශ මධ්‍යස්ථානයකින් පිටත් වූයේ මැයි 3 දින ය.**

චීනය සඳෙහි අඳුරු අර්ධය මත යානයක් ගොඩ බැස්සවූයේ දෙවැනි වතාවටයි. පළමු වරට ඔවුන් මේ දස්කම කළේ 2019 වසරේ ය. එම මෙහෙයුම හැඳින්වුණේ චැංග්' ඊ- 4 යන නමිනි. එය ද ඓතිහාසික මෙහෙයුමක් වූයේ ඊට පෙර කිසිදු රටක් මේ අඳුරු අර්ධය මත යානා ගොඩබස්සවා නොතිබූ බැවිනි. එහෙත් එම අවස්ථාවේ පස් සාම්පල ගෙන ඒමක් සිදු වූයේ නැත.

ඉදිරියේදී සඳ ඉලක්ක කර තවත් මෙහෙයුම් රැසක් ක්‍රියාත්මක කිරීමට චීනය බලාපොරොත්තු වෙයි. 2026 වසරේ දියත් කරන චැංග්'ඊ-7 මෙහෙයුමෙන් සඳෙහි දක්ෂිණ ධ්‍රැව කලාපයට යානයක් ගොඩ බැස්සවීමට ඔවුන් සැලසුම් කර තිබේ. මේ කලාපය ද දැනට විද්‍යාඥයන්ගේ දැඩි අවධානයක් දිනාගෙන ඇත. මෙහි ඇති කිසිදු හිරු එළිය නොවැටෙන ගැඹුරු, සීතල ආවාට තුළ මිදුණු ජලය ඇතැයි විශ්වාස කෙරේ. මේ ජලය යොදගෙන ඉන්ධන නිපදවීමට විද්‍යාඥයන්ගේ බලාපොරොත්තුවක් ඇත. එමෙන් ම අනාගතයේ සඳ මත ඉදිවන විද්‍යාගාර ආදිය සඳහා ද මේ ජලය යොද ගැනීමට හැකියාව තිබේ. මේ දක්ෂිණ ධ්‍රැව කලාපය මත පළමු වරට යානයක් ගොඩ බැස්සවූයේ ඉන්දියාවයි. ඒ 2023 වසරේ දියත් කෙරුණු චන්ද්‍රයාන්-3 මෙහෙයුමෙන් ය.

2030 වසරට පෙර චීන අජටාකාශගාමියකු සඳ මත ගොඩ බැස්සවීම ද චීනයේ තවත් ඉලක්කයකි. මෙතෙක් මේ දස්කම කර ඇත්තේ ඇමරිකාව පමණි. 1960-70 දශකවල ක්‍රියාත්මක වූ ඇපලෝ වැඩසටහන යටතේ ඔවුහු සඳ වෙත අජටාකාශගාමීන් යැවූහ.



3 පස් සාම්පල රැගෙන පෘථිවියට සේන්දු වූ Returner මොඩියුලය

# ක්ලෝඩියාගේ අභියෝගය

ඩබ්ලිව්. එම් ශාන්තප්‍රිය



මෙක්සිකෝවේ නව ජනාධිපතිවරයා ලෙස Claudia Sheinbaum (ක්ලෝඩියා ෂයින්බොම්) තේරී පත්වී සිටී. එරට ජනාධිපති ධුරයට පත්වූ පළමු කාන්තාව ලෙස ඇය මෙක්සිකෝ ඉතිහාසයට එක්වන්නේ 60%කට ආසන්න වාර්තාගත ඡන්ද ප්‍රතිශතයක් ලබාගනිමිනි. මෙය මෙක්සිකෝ ඉතිහාසයේ ජනාධිපති අපේක්ෂකයකු ලබාගත් ඉහළ ම ඡන්ද ප්‍රතිශතය ලෙස සැලකේ. මෙවර ජනාධිපතිවරණයේදී ඇයගේ ආසන්නම ප්‍රතිවාදියා වූ National Action පක්ෂයේ අපේක්ෂිකාව වන Xochitl Galvez ලබාගැනීමට හැකිවූයේ 27%ක ඡන්ද ප්‍රතිශතයක් පමණි.

එරට දුප්පත් ජනතාව අතර ඇය ලබා තිබෙන ඉහළ ජනප්‍රියත්වයත් කලක් මෙක්සිකෝසිටි ප්‍රදේශයේ නගරාධිපතිනිය ලෙස මහජන ප්‍රසාදයට පත් ව සිටීමත් මේ ජයග්‍රහණයට හේතු වී තිබේ. වසර 200ක ඉතිහාසයේ මෙක්සිකෝවේ කාන්තාවක් එරට නායකත්වයට පත් වීම කාන්තාවක් ලැබූ ඉහළ ජයග්‍රහණයක් බව ජයග්‍රහණයෙන් පසු ඇය මාධ්‍යයට ප්‍රකාශ කළා ය. මෙක්සිකෝ ව්‍යවස්ථාව අනුව එරට රාජ්‍ය නායකයා, ආණ්ඩුවේ ප්‍රධානියා මෙන් ම සන්නද්ධ සේවාවල ප්‍රධානියා වන්නේ ද ජනාධිපතිවරයායි. වත්මන් ජනාධිපති Andres Manuelගේ ධුරකාලය 2024 ඔක්තෝම්බර් 01 දිනෙන් අවසන් වන අතර එදින Claudia Sheinbaum මෙක්සිකෝවේ නව ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දීමට නියමිත ය.

**ආර්ථික වර්ධන වේගය ඉහළ නංවා ගැනීම, එරට වෙළාගෙන ඇති නීතිවිරෝධී ඝාතන, වද හිංසා පැමිණවීම, අතුරුදහන් කිරීම්, අපරාධ කණ්ඩායම්වල ඉහළ මට්ටමේ ප්‍රචණ්ඩත්වය යන බරපතළ මානව හිමිකම් ප්‍රශ්නවලට මුහුණ දීමට නව නායකත්වයට සිදු වේ.**

මෙක්සිකෝව ප්‍රාන්ත (States) 31කින් සමන්විත ෆෙඩරල් රාජ්‍යයකි. මෙක්සිකෝ ව්‍යවස්ථාදායකය ඉහළ මන්ත්‍රී මණ්ඩලය හා පහළ මන්ත්‍රී මණ්ඩලය යන කොටස් දෙකකින් යුක්ත ය. ව්‍යවස්ථාදායකය සඳහා පැවැත්වූ මෙවර මැතිවරණයෙන් Claudia නියෝජනය කරන Morena (මොරෙනා) පක්ෂයට තුනෙන් දෙකක බලයක් හිමි විය. මෙක්සිකෝවේ විශාලතම දේශපාලන පක්ෂය ලෙස සැලකෙන වාමාංශික ජනතාවාදී පක්ෂය 2014 වර්ෂයේදී ආරම්භ කරන්නේ වත්මන් ජනාධිපති Andres Manuel ය.

මෙක්සිකෝවේ වත්මන් පාලක පක්ෂය ලෙස කටයුතු කරන මොරෙනා පක්ෂය 2018 වසරේ සිට මෙක්සිකෝවේ පාලන බලය හොබවයි. ලතින් ඇමරිකාව හරහා ගිය දෙවැනි රෝස රැල්ල නම් අරගලයට මෙක්සිකෝවට ද මුහුණදීමට සිදු විය. වත්මන් ජනාධිපති Andres Manuel ජනාධිපතිවරයා ලෙස තේරී පත්වන්නේ මේ තත්ත්වය යටතේ ය.

මොරෙනා පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තියේ විශේෂත්වය වන්නේ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියට විරුද්ධ ආර්ථික ප්‍රතිපත්තියක පිහිටා ක්‍රියා කිරීමයි. වත්මන් ජනාධිපති Andres Manuelගේ පත්වීමත් සමග එරට මහා පරිමාණ ව්‍යාපාරිකයන් කිසියම් ආකාරයකට කනගාටුවට පත්වුණු බව වාර්තා වේ. ඇමරිකා එක්සත් ජනපදයේ එළිපත්තේ පිහිටි මෙක්සිකෝවට තම ආර්ථික ප්‍රතිපත්තිය ඉදිරියට පවත්වාගෙන යමින් කිසියම් ස්වාධීනත්වයක් සහිත ව ඉදිරියට ක්‍රියා කිරීම අභියෝගයකි.

ආර්ථික වර්ධන වේගය ඉහළ නංවා ගැනීම, එරට වෙළාගෙන ඇති නීතිවිරෝධී ඝාතන, වද හිංසා පැමිණවීම, අතුරුදහන්

කිරීම්, අපරාධ කණ්ඩායම්වල ඉහළ මට්ටමේ ප්‍රචණ්ඩත්වය යන බරපතළ මානව හිමිකම් ප්‍රශ්නවලට මුහුණදීමට නව නායකත්වයට සිදු වේ.

වර්ග කිලෝමීටර් 1,972,550ක විශාලත්වයකින් යුත් මෙක්සිකෝව විශාලත්වය අනුව ලොව 13 වැනි ස්ථානයේ පසු වෙයි. මිලියන 130කට ආසන්න ජනතාවක් වාසය කරන එරට ජනගහනය අනුව පසු වන්නේ ලොව 10 වැනි ස්ථානයේ ය. එහි ජනතාවගෙන් 90%ක් ස්පාඤ්ඤ භාෂාව කථා කරන අතර 80%කට ආසන්න පිරිසකගේ ආගම රෝමානු කතෝලික වේ.

ඉතාමත් දියුණු සංස්කෘතියක් ඇති පුරාණ නටබුන්වලින් ගහන විස්මිත වෙරළ තීරයක් ඇති උතුරු ඇමරිකානු රටක් ලෙස ප්‍රසිද්ධියක් උසුළන මෙක්සිකෝව ලෝකයේ තෙල් සම්පත්වලින් 17 වැනි ස්ථානයේ පසුවන්නේ ඔපෙක් සංවිධානයේ සාමාජිකයකු වශයෙනි. ශක්තිමත් ආර්ථික




විවිධාංගීකරණයක් ඇති එහි ඛනිජ තෙල්, කෘෂිකර්මාන්තය, සංචාරක, පතල් කැණීම් හා කාර්මික ක්‍රියාකාරකම් ආර්ථිකයේ ප්‍රධාන ක්ෂේත්‍ර ය.

ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් වන මෙක්සිකෝව 2050 වසර වන විට විශාලතම පස්වැනි හෝ හත්වැනි ආර්ථිකය බවට පත්වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය හා ආර්ථික සංවිධාන පුරෝකථනය කරයි. දළ දේශීය නිෂ්පාදිතයෙන් ලොව 15 වැනි ස්ථානයේ පසුවන එරට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 1.15ක දළ දේශීය නිෂ්පාදිතයක් පවතී. එහෙත් අද වන විට මෙක්සිකෝවේ ආර්ථික වර්ධන වේගය 2.1%කට මදක් වැඩි වන අතර එය සංවර්ධිත රටවල ආර්ථික වර්ධන වේගයට වඩා බෙහෙවින් අඩු මට්ටමකි.

ඇමරිකා එක්සත් ජනපදයට ආසන්නයේ පවතින රටක් ලෙස අතීතයේ සිට ම ඔවුන් සමග මෙක්සිකෝවේ යම් ප්‍රශ්න පැන නැගී ඇත. 19 වැනි සියවසේ දෙරට අතර යුද ගැටුමක් ද සිදු වී තිබේ. 1845 වසරේදී ඇමරිකාවේ ටෙක්සාස් ප්‍රදේශය ඈඳා ගැනීමත් මෙක්සිකෝව ඊට එරෙහිවීමත් එම යුද ගැටුමට හේතු වී ඇති අතර එය අවසන් වන්නේ ඇමරිකා එක්සත් ජනපදය ජයග්‍රහණය හිමිකර ගනිමිනි. වර්තමානයේ ද මත්ද්‍රව්‍ය ජාවාරම්, සංක්‍රමණ ගැටලු ආදිය අරභයා ද එක්සත් ජනපදය හා මෙක්සිකෝව අතර විවිධ ගැටලු මතුවී තිබේ.

**මොරෙනා පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තියේ විශේෂත්වය වන්නේ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියට විරුද්ධ ආර්ථික ප්‍රතිපත්තියක පිහිටා ක්‍රියා කිරීමයි. වත්මන් ජනාධිපති Andres Manuelගේ පත්වීමත් සමග එරට මහා පරිමාණ ව්‍යාපාරිකයන් කිසියම් ආකාරයකට කනගාටුවට පත්වුණු බව වාර්තා වේ. ඇමරිකා එක්සත් ජනපදයේ එළිපත්තේ පිහිටි මෙක්සිකෝවට තම ආර්ථික ප්‍රතිපත්තිය ඉදිරියට පවත්වාගෙන යමින් කිසියම් ස්වාධීනත්වයක් සහිත ව ඉදිරියට ක්‍රියා කිරීම අභියෝගයකි.**

මේ කුමන තත්ත්වයක් යටතේ වුවත් මෙක්සිකෝවේ විශාලතම වෙළෙඳ හවුල්කරුවා වන්නේ ඇමරිකා එක්සත් ජනපදයයි. මෙක්සිකෝ ආර්ථිකය සඳහා ඔවුන්ගේ විශාල දායකත්වයක් පවතී. 2022 වසරේ මෙක්සිකෝවට කළ ඇමරිකා ජනපද භාණ්ඩ හා සේවා අපනයනය එක්සත් ජනපද ඩොලර් බිලියන 362.5කි. එය ඇමරිකාවේ මුළු අපනයනවලින් 13%ක් වන අතර එය මෙක්සිකෝවේ සමස්ත ආනයනවලින් 43%කි. මෙයින් පෙනී යන්නේ මෙක්සිකෝ ආර්ථිකයට ඇමරිකා එක්සත් ජනපදයේ ඇති වැදගත්කමයි.

මේ තත්ත්ව යටතේ වුවත් මෙක්සිකෝව ස්වාධීන රටක් ලෙස ක්‍රියා කිරීමට උත්සාහ දරන බවක් පෙනේ. එරට විදේශ ප්‍රතිපත්තිය අනුව ජාත්‍යන්තර නීතියට ගරු කිරීම, රාජ්‍යයන්ගේ නෛතික සමානත්වය හා වෙනත් රටවල ස්වෛරීභාවයට හා ස්වාධීනත්වයට ගරු කිරීම, වෙනත් රටවලට මැදිහත් නොවීම හා සාමකාමී ව ගැටුම් විසඳීම යන මූලධර්ම මත පදනම් ව ඔවුන් ක්‍රියා කිරීමෙන් මේ බව මොනවට පැහැදිලි වෙමින් තිබේ.





# ආර්ථිකයේ නව දිශානතිය

**දීප්ත කුමාර බටගොඩ**

**ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ( International Monetary Fund -IMF) සහයෝගය ලබා ගත්තේ ඇති වූ ආර්ථික අර්බුදයත් සමග ඊට විකල්ප විසඳුමක් නොමැති වූ අවස්ථාවකයි. ශ්‍රී ලංකාව ඔවුන් සමග ඇතිකර ගත් එකඟතාව අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් බිලියන 2.9ක විස්තීර්ණ ණය පහසුකමක් අනුමත විය. ඒ, අත්පත් කරගන්නා ප්‍රගතිය නිරීක්ෂණය කිරීමෙන් පසුව වාරික හතරකින් එම මුදල ලබා දීමේ පොරොන්දුව මතයි. එහි තුන් වැනි වාරිකය වන ඩොලර් මිලියන 336ක මුදලක් ලබා දීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නොබෝද ක්‍රියා කළේ ශ්‍රී ලංකාව එලෙස කිසියම් ප්‍රගතියක් අත්පත් කර ගනිමින් සිටින බව ප්‍රකාශ කරමිනුයි. මෙවර දෙසතිය කවරයේ කතාව සැකසෙන්නේ ඒ පිළිබඳ විමසුමට ලක් කරමිනි.**

ශ්‍රී ලංකාව පසුගිය කාලවකවානුවේ මුහුණදුන්නේ ඉතිහාසයේ අන් කවරදාකවත් නොවූ විරූ අර්බුදකාරී තත්ත්වයකටයි. 2022 වර්ෂයේදී එහි උච්චතම අවස්ථාවට ළඟා විය. ශ්‍රී ලංකා දේශපාලනයේත් ආර්ථිකයේත් සමාජයේත් විශාල බිඳ වැටීමක් එකවර සිදු වූ පළමු අවස්ථාව ද මෙය විය හැකියි. විශේෂයෙන් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් උත්තේජනය වූ ආර්ථික අර්බුදය නිසා නිෂ්පාදනය සහ ආනයනය ඇන හිටි අතර රටේ විශාල භාණ්ඩ හිගයක් නිර්මාණය විය. මේ නිසා භාණ්ඩ ලබා ගැනීම සඳහා විශාල පෝලිම් මෙන් ම එමගින් විවිධ සමාජ ගැටලු ද ඇති වෙමින් තිබුණි. කළුකඩ වෙළෙඳපොළ (Black Market) හේතුවෙන් අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමට සිදු වූයේ ඉහළ මිල ගණන්වලට ය. සියලු කාරණාවල ප්‍රතිඵලය වූයේ ජනතාව පැවති පාලන තන්ත්‍රයට විරෝධය දැක්වීමයි. මේ නිසා හටගත් දේශපාලන අර්බුදයෙන් එවක ජනාධිපතිවරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්වීමට පවා සිදු විය.

අර්බුදයට හේතු දක්වන බොහෝ විද්වතුන්ගේ අදහස් විමර්ශනය කරන විට, ඔවුන් බොහෝදුරට එක හා සමාන අදහස් දරන බව පෙනී යයි. ජනාධිපති ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග පවසන ආකාරයට දිගු කාලයක් තිස්සේ පැවති රාජ්‍ය අයවැය හිඟයත් ගෙවුම් ශේෂ හිඟයත් ආර්ථිකයේ පැවති ව්‍යුහාත්මක දුර්වලතාවනුත් මේ සඳහා හේතු වී තිබේ. ප්‍රවාහන හා මහාමාර්ග, ජනමාධ්‍ය අමාත්‍ය බන්දුල ගුණවර්ධන ප්‍රකාශ කරන්නේ රටේ රාජ්‍ය මූල්‍ය විනයක් නොතිබීමත් ඒ සඳහා උචිත නීති සම්පාදනය නොවීම හා සම්පාදනය වූ නීති ක්‍රියාත්මක වීමේදී තිබූ දුර්වලතා ආර්ථික අර්බුදය නිර්මාණය වීම සඳහා හේතුපාදක වූ බව ය. රටේ රාජ්‍ය මූල්‍ය විනයක් නොපැවතීම අර්බුදයට එක් හේතුවක් බව කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ පෙන්වා දෙයි. දේශීය හා ජාත්‍යන්තර විද්වතුන් හා ආයතන වාර්තා අනුව ද පෙනී යන්නේ දිගු කාලයක් තිස්සේ ශ්‍රී ලංකා ආර්ථිකයේ පැවති අභ්‍යන්තර හා බාහිර අසමතුලිතතාත් ඒ සඳහා රුකුල් දෙන ව්‍යුහාත්මක සාධකත් අර්බුදයට හේතු වී තිබෙන බවයි.

## අර්බුදයට හේතුව ගැටලු ත්‍රිත්වයක්

විශ්ලේෂණාත්මක ව බලන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ගැටලු තුනක් පවතින බව පෙනී යයි. පළමු වැන්න දිගුකාලීන ව පවතින රාජ්‍ය අයවැය හිඟයයි. දෙවැන්න දිගුකාලීන ව පවතින ගෙවුම් ශේෂ හිඟය වන අතර තුන් වැන්න මේ තත්ත්වය හේතුවෙන් රජය අඛණ්ඩ ව ණය ගැනීම නිසා ඇති ව තිබෙන ණය සේවාකරණ ගැටලුවයි. ශ්‍රී ලංකා ආර්ථික අර්බුදය නමැති ගොඩනැගිල්ල ඉදි වී තිබෙන්නේ මේ තුන් ආකාර ගැටලු නමැති කුලුනු ත්‍රිත්වය මතයි. ඒ අනුව අර්බුදයෙන් ගොඩ ඒමටනම්, එසේත් නැතහොත් අර්බුදය නමැති ගොඩනැගිල්ල විනාශ කර දැමීමටනම් ගැටලු නැමති මේ කුලුනු කඩා බිඳ දැමිය යුතුයි. ඒ සඳහා තොරතුරු මත පදනම් වූ ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු අතර එම ප්‍රතිපත්තිමය තීරණ උපාය මාර්ගික සැලසුමක් අනුව ක්‍රියාත්මක කළ යුතු වේ. එසේ ම නිරන්තර ඇගයීමට ලක් කිරීමෙන් සැඟ වී තිබෙන ගැටලු කල්තියා හඳුනාගෙන කම්පනවලට ඔරොත්තු දෙන




තරමේ ආර්ථික පරිසරයක් ඇති කළ හැකි වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකා රජය අතර වන ගිවිසුම ක්‍රියාත්මක විය යුත්තේ ඒ සඳහායි.

## දිගුකාලීන අයවැය හිඟය

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බොහෝ විට දක්නට ලැබුණේ සුභ සාධන ආර්ථික පිළිවෙතකි. මේ නිසා රාජ්‍ය අදායම අභිභවා රාජ්‍ය වියදම් ඉහළ යාමෙන් දිගින් දිගට ම දක්නට ලැබුණේ විශාල අයවැය පරතරයකි. සාමාන්‍යයෙන් එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 10ක් පමණ විය. මෙහි ප්‍රතිඵලය වූයේ අයවැය හිගය පියවා ගැනීම සඳහා ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය

විශ්ලේෂණාත්මක ව බලන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ගැටලු තුනක් පවතින බව පෙනී යයි. පළමු වැන්න දිගුකාලීන ව පවතින රාජ්‍ය අයවැය හිඟයයි. දෙවැන්න දිගුකාලීන ව පවතින ගෙවුම් ශේෂ හිඟය වන අතර තුන් වැන්න මේ තත්ත්වය හේතුවෙන් රජය අඛණ්ඩ ව ණය ගැනීම නිසා ඇති ව තිබෙන ණය සේවාකරණ ගැටලුවයි. ශ්‍රී ලංකා ආර්ථික අර්බුදය නමැති ගොඩනැගිල්ල ඉදි වී තිබෙන්නේ මේ තුන් ආකාර ගැටලු නමැති කුලුනු ත්‍රිත්වය මතයි.




අනුගමනය කිරීමයි. ණය මත පෙළඹීම හා මහ බැංකුව මුදල් මුද්‍රණය කිරීම මෙහිදී සිදු කෙරිණි. ආර්ථිකයේ නව මුදල් තොගයක් සංසරණය වීම සහ දේශීය හා විදේශීය භාණ්ඩ සඳහා ඉල්ලුම ඉහළ යාමත් සමග එයට අනුගාමී ව නිෂ්පාදනය ඉහළ නොයාමේ අනිවාර්ය ප්‍රතිඵලය උද්ධමනයයි. උද්ධමනයට අමතර ව, දේශීය ඉල්ලුම ආනයනික භාණ්ඩ මත පෙළඹීමෙන් ගෙවුම් ශේෂයට ද අමතර බරක් පැටවීමට හැකියාව තිබේ. 2022 වසර වන විට ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් ආයතන විසින් ශ්‍රී ලංකාව පහළ ස්ථරයකට පත් කිරීම නිසා රජයට ණය ගැනීමේ හැකියාව ද අවම වූ අතර එහි ප්‍රතිඵලය වූයේ අයවැය පියවා ගැනීමේ එකම මාර්ගය මුදල් මුද්‍රණය කිරීමයි. 2019න් පසුව සිදු කළ බදු ප්‍රතිසංස්කරණ නිසා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසින් ශ්‍රී ලංකාව ලෝකයේ පහළම බදු ආදායම සහිත රට බවට පත් වූ අතර, එමගින් සමස්ත රාජ්‍ය අදායම ද පහළ ගියේ ය.

## දිගුකාලීන වෙළෙඳ ශේෂයේ හිඟය


1977න් පසු අනුමගනය කරන්නට යෙදුණු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමගින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළෙඳාමට එක් වූ අතර ප්‍රධාන වශයෙන් ආනයන අපනයන ආර්ථිකයක් මත යැපෙන රටක් බවට ද පත් විය. මේ නිසා රටේ අවශ්‍යතා සඳහා ඇති ඉල්ලුම දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර මට්ටම දක්වා පුළුල්

වී තිබේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික ආනයන වියදම ඇමරිකානු ඩොලර් බිලියන 20ක් පමණ වේ. මෙය පියවා ගත යුත්තේ ශ්‍රී ලංකාවේ අපනයන ආදායමෙනි. එයින් අදහස් වන්නේ අවම වශයෙන් ඩොලර් බිලියන 20කවත් අපනයන ආදායමක් ශ්‍රී ලංකාවට තිබිය යුතු බවයි. එහෙත් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික අපනයන ආදායම වන්නේ ඩොලර් බිලියන 12ක් තරම් අඩු අගයකි. මේ නිසා වෙළෙඳ ශේෂයේ දැකිය හැකි වූයේ හිඟයකි. මේ හිඟය පියවා ගැනීම සඳහා ණය මත පෙළඹීම හැර අන් දෙයක් නැත. මේ තත්ත්වය අඛණ්ඩ ව සිදු වීමේ අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ රටට අනවශ්‍ය ණය බරක් ඇති වීමයි. ආනයනය කරන්නේ ආයෝජන භාණ්ඩ පමණක්නම් ඉදිරි කාලයකදී රටේ නිෂ්පාදනය ඉහළ ගොස් ජාතික ආදායමේ ඉහළ යාමෙන් එම තත්ත්වය සමනය වේයැයි උපකල්පනය කළ හැකි වුවත් අන්තර් භාණ්ඩ මෙන් ම විශාල වශයෙන් පරිභෝජන භාණ්ඩ ආනයනය කිරීමෙන් ඉපයීමකින් තොර ව පරිභෝජනය කිරීමේ තත්ත්වයට ශ්‍රී ලංකාව පත් ව තිබේ. 2024 අයවැය කතාව ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පෙන්වා දුන්නේ සමජීවිකතා පිළිවෙත (ආදායමට සරිලන වියදමක්) පවත්වාගෙන නොයාම නිසා ශ්‍රී ලංකාව මෙවැනි අර්බුදයකට මුහුණ දී ඇති බවයි. ඒ නිසා අදායමට සරිලන වියදමක් ඇති කර ගැනීම හා වියදම් කළමනාකරණයෙන් ශක්තිමත් ආර්ථිකයක් ඇති කර ගැනීම අනිවාර්ය සාධකයක් බව ඔහු පෙන්වා දී තිබේ.

## රාජ්‍ය ණය බර ඉහළ යාම

දිගුකාලීන අයවැය හිඟය සහ වෙළෙඳ හිඟය පියවා ගැනීමටත් අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහාත් ශ්‍රී ලංකාව දිගින් දිගට ම ණය මත පෙළඹීම දක්නට ලැබේ. අඩු ආදායම්ලාභී රටක් වශයෙන් පවතින කාලවකවානුවේ ජාත්‍යන්තර ප්‍රජාවගෙන් සහනදායි ණය ලබා ගැනීමේ යම් හැකියාවක් තිබුණත් මැදි ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වීමත් සමඟ එම වාසිය අත්විඳීමට ශ්‍රී ලංකාවට නොහැකි විය. මේ නිසා වෙළෙඳපොළ ණය මත පෙළඹීමට සිදු වූ අතර මෙහිදී ඉහළ පොළී අනුපාතිකයක් යටතේ ණය ගැනීම සිදු විය. විදේශීය ණය ගෙවීම සඳහා අපනයන ආදායම ණය ගැනීමට අනුගාමී ව ඉහළ යායුතු වුවත් ශ්‍රී ලංකාවේ අපනයන ආදායමේ එවැනි වර්ධනයක් සිදු වූයේ නැත. කොවිඩ් 19 වසංගතයත් සමග දළ නිල සංචිතය ද ක්‍රමක්‍රමයෙන් ක්ෂය වී ගියේ ය. එහි ප්‍රතිඵලය වූයේ විදේශ ණය ගෙවීම අත්හිටුවීමට සිදු වීමයි. එපමණක් නොව අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට පවා නොහැකි තත්ත්වයක් උදා වී තිබුණි. ජාත්‍යන්තර ප්‍රජාව තුළ ශ්‍රී ලංකාවේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳ විශ්වාසය බිඳ වැටී ගොස් තිබූ නිසා ණයවර ලිපි නිකුත් කිරීම පවා කළ නොහැකි විය.




## IMF සහයෝගය

ශ්‍රී ලංකා ආර්ථිකයේ දෘශ්‍යමාන වූ ගැටලුවලින් බොහෝ දෙනාගේ කතාබහට ලක්වූයේ රජයේ ණය සේවාකරණ ගැටලුවයි. අපනයන ආදායම පහළ යාමත් විදේශ සංචිත විශාල වශයෙන් හිඟ වීමත් නිසා විදේශ ණය ගෙවීමට නොහැකි තත්ත්වයකට 2022 වසර වන විට ශ්‍රී ලංකාව පත් වී තිබුණි. මේ නිසා 2022 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවට ණය ගෙවීමේ හැකියාවක් නොමැති බව නිල වශයෙන් ප්‍රකාශ කිරීමට සිදු විය. ඒ සමග ම පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීම දෙසට ශ්‍රී ලංකාව තල්ලු විය. ජාත්‍යන්තර මූල්‍ය

අරමුදල සමග සාකච්ඡා කිරීමේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින මූලික ගැටලු සඳහා විසඳුම් සහ ආර්ථිකය ස්ථාවර මට්ටමකට ගෙන ඒමටත් එය යථාවත් කර ගැනීම සඳහාත් ශ්‍රී ලංකාව විසින් ප්‍රධාන එකඟතා කිහිපයකට යොමුවන ලදි. ඒ අනුව රාජ්‍ය ආදායම ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා රජයේ බදු ආදායම ඉහළ දැමීම, අත්‍යාවශ්‍ය හා නාස්තිකාර රාජ්‍ය වියදම් කපා හැරීම, රජයේ දූෂණ හා වංචා අවම කිරීමට පියවර ගැනීම, අවදානම් පිරිස්වල සුරක්ෂිතතාව තහවුරු කිරීම වැනි කාරණා එම කාලයේ සමාජයේ දැඩි කතාබහට ද ලක් විය. විශේෂයෙන් රජයේ නව බදු ප්‍රතිපත්තිය විශාල වශයෙන් කතාබහට ලක් වූ අතර ඒ සඳහා විරෝධතා ද එල්ල වුණි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ ණය හිමියන් සමග ණය ප්‍රතිව්‍යුගතකරණය සඳහා එකඟතාවක් ඇති කර ගැනීම ශ්‍රී ලංකාවට තිබූ ප්‍රධානම අභියෝගය වශයෙන් දැක්විය හැකි ය. කෙසේ වෙතත් ඇතැම් පාර්ශ්ව සමග ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ යම් යම් ගැටලු පැන නැගී තිබුණත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකා ආර්ථිකය යථාවත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද කොන්දේසි සමග එකඟවෙමින් ඇමරිකානු ඩොලර් බිලියන 2.9ක විස්තීර්ණ ණය පහසුකමක් අනුමත කරගෙන තිබුණි. එම ණය මුදල ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකාව සමග ඇතිකරගත් එකඟතාවල ප්‍රගතිය අනුව වාරික කිහිපයක් ලබා ගැනීමේ හැකියාව තිබුණි. ඒ අනුව මේ වන විට වාරික දෙකක් ශ්‍රී ලංකාව ලබාගෙන ඇති අතර එහි තුන් වැනි වාරිකය පසුගියදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාවට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ දූත මණ්ඩල ප්‍රධානී Peter Breuer; "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින්, මාස 48ක විස්තීරණ අරමුදල් පහසුකම යටතේ ශ්‍රී ලංකාව පිළිබඳ සිව්වැනි උපදේශනය සහ දෙවැනි සමාලෝචනය සම්පූර්ණ කළා. ඒ අනුව ඩොලර් මිලියන 336ක ක්ෂණික ප්‍රවේශයක් සඳහා ශ්‍රී ලංකාව විවෘත වී තිබෙනවා. ශ්‍රී

**මධ්‍යම රජයේ ණය දර්ශක**

රුපියල් මිලියන

| දර්ශකය | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| මධ්‍යම රජයේ ණය /ද.දේ.නි. | 81.9 | 96.6 | 100.0 | 114.2 | 103.9 |
| දේශීය ණය /ද.දේ.නි. | 42.9 | 57.9 | 63.0 | 62.5 | 61.7 |
| විදේශීය ණය /ද.දේ.නි. | 39.0 | 38.7 | 37.0 | 51.8 | 42.1 |
| දේශීය ණය /මධ්‍යම රජයේ ණය | 52.4 | 60.0 | 63.0 | 54.7 | 59.4 |
| විදේශීය ණය /මධ්‍යම රජයේ ණය | 47.6 | 40.0 | 37.0 | 45.3 | 40.6 |
| විදේශීය ණය /අපනයන (ඈ) | 178.6 | 250.2 | 218.7 | 240.1 | 205.3 |
| ණය සේවාකරණය /ද.දේ.නි. | 12.7 | 12.4 | 13.5 | 12.5 | 15.4 |
| ණය සේවාකරණය /රජයේ ආදායම | 107.0 | 141.9 | 163.4 | 151.5 | 139.8 |
| එයින් දේශීය ණය සේවාකරණය /රජයේ ආදායම | 63.4 | 85.2 | 109.4 | 126.8 | 124.4 |
| ණය සේවාකරණය /රජයේ වියදම (ඈ) | 45.4 | 48.5 | 49.0 | 50.8 | 59.5 |
| එයින් දේශීය ණය සේවාකරණය /රජයේ වියදම (ඈ) | 26.9 | 29.1 | 32.8 | 42.5 | 52.9 |
| විදේශීය ණය සේවාකරණය /අපනයන (ඈ) | 23.7 | 32.1 | 26.4 | 9.4 | 8.3 |
| ණය පොලී ගෙවීම් /ද.දේ.නි | 5.7 | 6.3 | 6.0 | 6.5 | 8.9 |
| ණය පොලී ගෙවීම් /රජයේ වියදම (ඈ) | 20.2 | 24.5 | 21.6 | 26.5 | 34.3 |
| දේශීය ණය පොලී ගෙවීම් /ද.දේ.නි | 4.2 | 4.6 | 4.5 | 6.0 | 8.4 |
| විදේශීය ණය පොලී ගෙවීම් /ද.දේ.නි | 1.5 | 1.7 | 1.4 | 0.5 | 0.4 |
| ණය පොලී ගෙවීම් / රජයේ පුනරාවර්තන වියදම් | 37.2 | 38.5 | 38.2 | 44.5 | 52.3 |
| විදේශීය ණය පොලී ගෙවීම් /අපනයන (ඈ) | 6.7 | 11.0 | 8.5 | 2.5 | 2.2 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව


ලංකාව ප්‍රමාණාත්මක ඉලක්කවලින් එක් ඉලක්කයක් හැර අනෙකුත් සියලු ම ඉලක්ක සම්පූර්ණ කර තිබෙනවා. බොහොමයක් වෙනස්කම් අවම වශයෙන් ප්‍රමාදයකින් පසුව හෝ ඉටු කරගෙන තිබෙනවා. එය ශක්තිමත් කාර්යසාධනයක්. එසේ වුවත් ආර්ථිකය තවදුරටත් අවදානම් සහගත තත්ත්වයකයි පසු වන්නේ. ණය තිරසරබව ඇති කරගැනීම සඳහා යන මාවත-තියුණු පිහිතලයක් මත ගමන් කිරීමක් වැනියි. ඒ අනුව සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසරභාවය යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය අඛණ්ඩ ව ලබා දෙනවා."

## IMF සහ ආර්ථික ප්‍රතිසංස්කරණ

2022 අප්‍රේල් 12 දින ණය ගෙවීමේ නොහැකියාව පිළිබඳ ශ්‍රී ලංකාව නිල වශයෙන් ලෝකයට ප්‍රකාශ කිරීමත් සමග පවතින අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ඉල්ලා සිටියේ ය. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ආගමනයත් සමග ඒ සඳහා වූ ක්‍රියාපිළිවෙත වඩාත් ඉක්මන් වූ අතර මාස 07ක් වැනි කාලයකදී ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තර


ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ ණය හිමියන් සමග ණය ප්‍රතිව්‍යුගතකරණය සඳහා එකඟතාවක් ඇති කර ගැනීම ශ්‍රී ලංකාවට තිබූ ප්‍රධානම අභියෝගය වශයෙන් දැක්විය හැකි ය. කෙසේ වෙතත් ඇතැම් පාර්ශ්ව සමග ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ යම් යම් ගැටලු පැන නැගී තිබුණත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකා ආර්ථිකය යථාවත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද කොන්දේසි සමග එකඟවෙමින් ඇමරිකානු ඩොලර් බිලියන 2.9ක විස්තීර්ණ ණය පහසුකමක් අනුමත කරගෙන තිබුණි.

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය




මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ උද්ධමනය




මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මූල්‍ය අරමුදල අතර එකඟතාවකට පැමිණීමට ශ්‍රී ලංකාවට හැකි විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ඉදිරි ආර්ථික ක්‍රියාපිළිවෙත පිළිබඳ කොන්දේසි කිහිපයකට එකඟවීමට ශ්‍රී ලංකාවට සිදු විය. ඒ අතර ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම, රාජ්‍ය ආදායම පුළුල් කිරීම හා බදු ප්‍රතිසංස්කරණ ඇති කිරීම, වංචා හා දූෂණ විරෝධී නීති සම්පාදනය, අවදානම් පිරිස් සුරක්ෂිත කිරීම, පාඩු ලබන රාජ්‍ය ආයතනවල මිල ගණන්, පිරිවැය පිළිබිඹු වන පරිදි තීරණය වීමට ඉඩ හැරීම සහ වෙනත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇති කිරීමට ශ්‍රී ලංකාව එකඟ වී තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ඇතිකරගත් ගිවිසුම සමග ඩොලර් බිලියන 2.9ක විස්තීරණ ණය මුදලක් සඳහා එකඟතාව ඇති කරගෙන තිබූ අතර මෙහි වාසිය ඇත්තේ ලැබෙන මුදල් ප්‍රමාණය මත නොව එමගින් ලැබෙන ජාත්‍යන්තර ප්‍රජාවගේ විශ්වාසය ඇති වීම මතයි. ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට පැහැදිලි හා ස්ථාවර ගමන් මාර්ගයක යන බවට ජාත්‍යන්තර ප්‍රජාව තුළ ඇති වන විශ්වාසය හේතුවෙන් ජාත්‍යන්තරය සමග වූ ගනුදෙනු පෙර මෙන් ම විශ්වාසයකින් යුතු ව පවත්වාගෙන යා හැකි වනු ඇත. එය අන්‍යෝන්‍ය වශයෙන් ඇති වන සබඳතාවකි. IMF වැඩපිළිවෙළ නිසා ජාත්‍යන්තර ප්‍රජාවගේ විශ්වාස ඇති වීමෙන් ගනුදෙනු පහසු වන අතර ම එම විශ්වාසය නිසා ම IMF වැඩපිළිවෙළ ද සාර්ථක වීමට රුකුලක් වනු ඇත. ඇතිකරගත් එකඟතා ඒ ආකාරයෙන් ම ක්‍රියාවට නැංවීම ශ්‍රී ලංකා ආර්ථිකයේ ස්ථාවරත්වයක් ඇති කර ගැනීමට ඇති එක ම මාර්ගය වී තිබේ.

ඒ අනුව IMF වැඩසටහනට අවශ්‍ය නීති සම්පාදනය, බදු ප්‍රතිසංස්කරණ ඇති කිරීම, දූෂණ විරෝධී නීති සම්පාදනය, පිරිවැය දෘශ්‍ය මිල ක්‍රමයට ඉඩ දීම, අවදානම් පිරිස් (අඩු ආදායම්ලාභීන්) සඳහා සමාජ ආරක්ෂණ ක්‍රම හඳුන්වා දීම, මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ස්වාධීන ව සිදු කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය, රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පසුබිම සකස් කිරීම හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අඛණ්ඩ ව පවත්වාගෙන යාමට ක්‍රියා කිරීම යනාදි පියවර ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කරමින් සිටී.

## වත්මන් ප්‍රතිඵල

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇතිකරගත් එකඟතා අනුව සැකසූ ආර්ථික වැඩපිළිවෙළෙහි බොහෝ විට ඇත්තේ කෙටිකාලීන ව ඉතාමත් වේදනාකාරී අත්දැකීම් ලබාදෙන ප්‍රතිසංස්කරණ බව අපි අත්දැකීමෙන් ම දනිමු. ඒවා අතර මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතිකය

ඉහළ දැමීම සහ අනුගමනය කරන ලද දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය, බදු ප්‍රතිසංස්කරණ නිසා වෙනදා බදු නොගෙවූ පිරිස්වලට පවා බදු ගෙවීමට සිදු වීම, පිරිවැය දෘශ්‍ය මිල ක්‍රමය නිසා අත්‍යාවශ්‍ය භාණ්ඩ වන විදුලිය, ජලය, ඉන්ධන මිල ඉහළ යාමෙන් ජීවන වියදම දැරිය නොහැකි මට්ටමින් ඉහළ යාම ආදී තත්ත්ව රටේ සියලු ජනතාව අත්විඳි කටුක අත්දැකීම් අතර ස්මරණය කළ හැකි අත්දැකීම් වේ. එහෙත් අද වන විට එම කටුක වේදනා පූර්ණ වශයෙන් ඉවත් වීමක් සිදු නොවුණ ද යම් ආකාරයක සහනයක් ඇති ව තිබෙන බවක් පෙනී යයි. භාණ්ඩ හා සේවා මිල ගණන්වල ඉහළ යාම (උද්ධමනය) තනි ඉලක්කමක් දක්වා පහළ ගොස් තිබේ. භාණ්ඩ හා සේවා පෝලිමකින් තොර ව ලබා ගැනීමේ හැකියාව තිබේ. අඩු ආදායම්ලාභී පිරිස් සඳහා යම්තාක්දුරකට හෝ සහනයක් වීමට වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් තිබේ. සමස්තයක් වශයෙන් ගතහොත් ආර්ථිකය මිනිසුන්ගේ අවශ්‍යතා ඉටු කර ගත හැකි පරිදි සාමාන්‍ය තත්ත්වයට පත් ව ඇති බව පෙනෙන්නට තිබේ.

කෙසේ වෙතත් ආර්ථිකය ස්ථාවර තත්ත්වයට පත්වීම තවම සිදු නොවූවත් ඒ සඳහා වන ගමන් මාර්ගයට පිවිස ඇති බව සංඛ්‍යා දත්ත විශ්ලේෂණය කරන විට පෙනී යයි. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ (දළ දේශීය නිෂ්පාදනය) සියයට 7.8ක සංකෝචනයක් ඇති වුණේ පාස්කු ප්‍රහාරය, කොවිඩ් වසංගතය වැනි බාහිර කම්පනවලට ශ්‍රී ලංකා ආර්ථිකය ඔරොත්තු නොදෙන තත්ත්වයක පැවති නිසා බව විද්වතුන්ගේ මතය වී තිබේ. ඒ සඳහා හේතු වශයෙන් ඔවුන් ඉදිරිපත් කරන්නේ දිගු කාලයක් පැවති දුර්වල ආර්ථික කළමනාකරණයයි. 1970 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ ඍණ වර්ධනයක් (-0.4) වාර්තා වීමෙන් පසුව මුල්වරට ඍණ වර්ධනයක් පෙන්නුම් කළේ 2001 වර්ෂයේදීයි. එය සියයට ඍණ 1.5කි. ඉන්පසුව නැවතත් 2019 වර්ෂයේදී සහ 2022 වර්ෂයේදී ඍණ වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. එසේ වුවත් 2023 වර්සයේ අවසන් කාර්තුවේදී සහ 2024 වර්ෂයේ පළමු කාර්තුවේදී නැවත



ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට පැහැදිලි හා ස්ථාවර ගමන් මාර්ගයක යන බවට ජාත්‍යන්තර ප්‍රජාව තුළ ඇති වන විශ්වාසය හේතුවෙන් ජාත්‍යන්තරය සමග වූ ගනුදෙනු පෙර මෙන් ම විශ්වාසයකින් යුතු ව පවත්වාගෙන යා හැකි වනු ඇත. එය අන්‍යෝන්‍ය වශයෙන් ඇති වන සබඳතාවකි. **IMF** වැඩපිළිවෙළ නිසා ජාත්‍යන්තර ප්‍රජාවගේ විශ්වාස ඇති වීමෙන් ගනුදෙනු පහසු වන අතර ම එම විශ්වාසය නිසා ම **IMF** වැඩපිළිවෙළ ද සාර්ථක වීමට රුකුලක් වනු ඇත. ඇතිකරගත් එකඟතා ඒ ආකාරයෙන් ම ක්‍රියාවට නැංවීම ශ්‍රී ලංකා ආර්ථිකයේ ස්ථාවරත්වයක් ඇති කර ගැනීමට ඇති එක ම මාර්ගය වී තිබේ.

ආර්ථිකයේ ධන වර්ධනයක් පෙන්නුම් කරන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි. මේ සඳහා හේතු වූ ප්‍රධානතම කරුණ ලෙසින් ඔවුන් දක්වා ඇත්තේ 2023 වර්ෂයේ මුල් කාර්තුවට සාපෙක්ෂ ව 2024 මුල් කාර්තුවේ වඩාත් හිතකර ආර්ථික පරිසරයක් ඇති වීමයි. 2023 වර්ෂයේ පැවති ඉහළ උද්ධමනය පහළ යාම නිසා නිෂ්පාදන පිරිවැය අවම වීම, පොලී අනුපාතිකය පහළ යාම, විදේශ මුදල් වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාව ඉහළ යාම, ආනයනික භාණ්ඩ කෙරෙහි පනවා තිබූ නීති ලිහිල් වීම වැනි කරුණු වඩාත් හිතකර ආර්ථික පරිසරයක් නිර්මාණය කර තිබේ. සංචාරක කර්මාන්තයේ සිදු වූ කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් එහි ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර තිබේ. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී සලකා බලන ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනේ ම ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර තිබීම ද රජය විසින් මෙතක් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති හා කළමනාකරණ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙසින් සැලකීම වරදක් නොවේ.

මේ ආකාරයට ම 2022 වර්ෂයේ අගභාගයේ සියයට 70කට ආසන්න වූ උද්ධමනය ක්‍රම ක්‍රමයෙන් අඩු වී ගොස් 2023 මැද භාගය වන විට තනි ඉලක්කමක් දක්වා අඩු විය. මේ නිසා ශ්‍රී ලංකා මහ බැංකුවට තම මුදල් ප්‍රතිපත්ති යම්දුරකට ලිහිල් කිරීමට හැකියාව ලැබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාතිකය ද සැලකිය යුතු ලෙසින් පහළ ගොස් තිබේ.

2022 වසරේදී රුපියල සියයට 45කින් පමණ අවප්‍රමාණය විය. එම නිසා විනිමය අනුපාතිකයේ හැසිරීම ආර්ථිකයේ තවත් ගැටලු රාශියක් නිර්මාණය කරමින් තිබුණි. විදේශ සංචිත හිඟවීමෙන් සහ බැංකු පද්ධතියෙහි විදේශ විනිමය හිඟ වීම නිසාත් ආර්ථික ගැටලු පමණක් නොව සමාජ සංස්ථාවේ ද ගැටලු රාශියක් නිර්මාණය කර තිබුණි. අද වන විට දළ නිල විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 5 දක්වා ඉහළ දමා ගැනීමට සමත් ව තිබෙන අතර විදේශ ප්‍රේෂණ ද සැලකිය යුතු ලෙසින් ඉහළ යාමක් පෙන්නුම් කරයි. පාස්කු ප්‍රහාරයත් සමග අර්බුදයට

ලක්වෙමින් තිබූ සංචාරක කර්මාන්තය ද නැවත යථා තත්ත්වයට පත්වෙමින් තිබේ. ශ්‍රී ලංකාව අනුගමනය කළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග නිසා අද වනවිට ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික විචල්‍යන්ගේ හැසිරීම කිසියම් ආකාරයක හිතකර මට්ටමක් කරා ළඟා වෙමින් පවතී.

අර්බුදයට හේතු වූ ප්‍රධාන ගැටලු ත්‍රිත්වය ආමන්ත්‍රණය කිරීම පිළිබඳ සලකා බැලුවහොත් රාජ්‍ය අයවැය හිඟය අවම කර ගැනීම සහ වෙළෙඳ ශේෂයේ හිඟය අවම කර ගැනීම දෙසට ආමන්ත්‍රණය කර තිබුණත් ආමන්ත්‍රණය කළ යුතු නිවැරදි ම ස්ථාන සඳහා රජයේ අවධානය යොමු වීම තවමත් සිදු වී නොමැති බව පෙනී යයි. රාජ්‍ය බදු ආදායම ඉහළ දැමීම සිදු කළ ද බදු අය කළ යුතු සහ අය කළ හැකි සෑම පුද්ගලයකුගෙන් ම බදු අය කිරීමට තරම් බදු ක්‍රමය සූක්ෂ්ම ව ක්‍රියාත්මක වනවා ද යන්න ගැටලුවක් ව පවතී. වයස අවුරුදු 18ට වැඩි සෑම පුද්ගලයකු සඳහා බදු ලිපි ගොනුවක් විවෘත කිරීම පිළිබඳ කතාබහ කළත් තවමත් එය සිදු ව නැත. වෙළෙඳ ශේෂ හිඟය අවම කර ගැනීම සඳහා ආනයන පාලනයට වඩා අපනයන පුළුල් කිරීම ඔස්සේ අපනයන ආදායම ඉහළ දැමීමට රජයේ අවධානය මෙයට වඩා යොමු විය යුතු වේ. අනාගතයේ දිනක ණය සේවාකරණය නැවතත් ආරම්භ කිරීමට සිදු වනු ඇත. ඒ සඳහා සූදානම් වීමටනම් අපනයන ආදායම පවතින තත්ත්වයට වඩා ඉහළ දමා ගැනීමට ක්‍රියා කිරීම අනිවාර්ය වේ. මේ පිළිබඳ අදහස් දක්වන මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ; " මෑතකාලීන ව අපනයන ආදායම විශාල ලෙසින් ඉහළ නොගියත් රජය ඒ සඳහා අවධානය යොමු කර නොමැත යන්න ඉන් පැවසෙන්නේ නැහැ. නව ආර්ථික පරිවර්තන පනතේ ඒ සඳහා වන යෝජනා රාශියක් තිබෙනවා. අවශ්‍ය වන්නේ එම යෝජනා ක්‍රියාත්මක කිරීමයි."

ශ්‍රී ලංකා ආර්ථිකයේ දෘශ්‍යමාන තත්ත්වයේ යම් සන්සුන් බවක් හා සහනශීලී බවක් මේ වන විට පෙනී යන බව වසන් කළ නොහැකි සත්‍යයකි. එසේ වුවත් අවදානම තවමත් පහ ව ගොස් නැති බව ද අප අවබෝධ කර ගත යුතු ය. එය, පහර දීමට සුදුසු අවස්ථාවක් බලමින් සිටින සතුරකු සේ සැඟ ව සිටින බව යටිපෙළ විශ්ලේෂණයකදී පෙනී යනු ඇත. සතුරාට පහර දීමට දුර්වල අවස්ථාවක් ලබා නොදීම සැමගේ වගකීමයි.

# නොවෙනස් ඉලක්ක පවත්වා ගත යුතුයි



මහාචාර්ය
**ප්‍රියංග දුනුසිංහ**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකාව අතර ඇති කරගත් එකඟතාව අනුව විස්තීර්ණ ණය ක්‍රමය යටතේ ඩොලර් බිලියන 2.9ක මුදලක් සෑම මාස 06කට වරක් ම ඇගයීමකින් පසුව ලබාදීමට නියමිත ව තිබුණා. ඒ අනුවයි නොබෝද ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන 336ක මුදලක් ලබා ගැනීමට හැකියාව ලැබුණේ. එම මුදල ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව සපුරාලිය යුතු ඉලක්ක පැවතුණා. ඒවා සම්පූර්ණ කළ නිසයි තුන් වැනි වාරිකය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබුණේ. එම ඉලක්ක අතර රජයේ ආදායම වර්ධනය කර ගැනීම, ණය තිරසරභාවය ඇති කර ගැනීම, පාඩු ලබන රාජ්‍ය ආයතනවල පිරිවැය ගැළපුම් යාන්ත්‍රණයක් හඳුන්වා දීම, අල්ලස හා දූෂණය අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම හා ශක්තිමත් සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ඇති කිරීම ඉතා වැදගත්. මේ ඉලක්ක කෙතරම්දුරට සාර්ථක ව ළඟා කරගෙන ඇති ද යන්න ඇගයීමකින් පසුවයි තෙවැනි ණය වාරිකය ලබා ගැනුණේ. ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා රජය ක්‍රියා කළේ විශාල අභියෝග රාශියක් මධ්‍යයේ. ඒ නිසා යම් යම් කොන්දේසි ඉටු කිරීමට ප්‍රමාදයක් පැවතුණත් ශ්‍රී ලංකාව ඒ සඳහා යොමු වීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇගයීමට ලක් වුණා.

මෙවැනි පසුබිමක ආර්ථිකයේ යම් යම් හිතකර තත්ත්ව ඇති වී තිබෙනවා. මේ ක්‍රියාවලියේදී ආර්ථිකයේ ස්ථායිකරණ ක්‍රියාවලිය සඳහා දැඩි ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව අනුග මනය කළා. විශේෂයෙන් ශ්‍රී ලංකා මහබැංකුවෙන් රජයට ලබාදෙන මූල්‍ය පහසුකම් නවතා දැමුවා. එය සිදු කළේ උද්ධමනය පාලනය කිරීමට. මේ නිසා අද වන විට උද්ධමනය තනි ඉලක්කමක් දක්වා පහළ ගොස් තිබෙනවා. විදේශ නිල සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 5.4 දක්වා ඉහළ දමා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි ව තිබෙනවා. රුපියල විශාල වශයෙන් අවප්‍රමාණය වී තිබුණත් එය පැමිණ තිබෙන්නේ කිසියම් ස්ථාවර මට්ටමකට. ඒ අනුව මුදලේ අභ්‍යන්තර හා බාහිර අගය කිසියම්දුරකට ස්ථාවර ව පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි ව තිබෙනවා. 2022 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8ක් වූ රාජ්‍ය ආදායම වර්තමානයේ සියයට 13 දක්වා ඉහළ ගොස් තිබෙන අතර ම ශක්තිමත් සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් බිහි ව තිබෙනවා. මේ ආකාරයට ආර්ථිකයේ අඛණ්ඩ ව සිදුවෙමින් පැවති සංකෝචනය (ඍණ වර්ධනය) 2023 වසර අවසන් කාර්තුවල සිට වාර්තා වෙමින් තිබෙන්නේ ධන අගයක්. ඒ සමග ම ආනයන සඳහා පනවා තිබූ සීමා ක්‍රමක්‍රමයෙන් ලිහිල් කරමින් පවතිනවා. මේ සියලු කාරණාවලින් පෙනී යන්නේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ගමන් මාර්ගය පිළිබඳ විශ්වාසයක් ඇති කර ගැනීමට හැකි වී තිබෙන බවක්.

මේ ඇති ව තිබෙන්නේ ආර්ථිකයේ කෙටිකාලීන ස්ථායිතාවක් පමණක්

බව අවධාරණය කළ යුත්තක්. එය මැදිකාලීන හෝ දිගුකාලීන ස්ථායිතාවක් නොවෙයි. මේ කෙටිකාලීන ස්ථායිකරණයෙන් ඔබ්බට ගොස් දිගුකාලීන ස්ථායිතාව ඇති කර ගැනීමට අඛණ්ඩ ව ක්‍රියා කළ යුතු වනවා. ඒ සඳහා අඛණ්ඩ ව ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගත යුතුයි. මෙහිදී සැලකිය යුතු කාරණයක් වන්නේ ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුගතකරණ ක්‍රියාවලිය තවමත් අවසන් කර නොතිබීම. එය දිගුකාලීන ස්ථායිතාව ඇති කර ගැනීමට බාධාවක් ලෙසින් ක්‍රියාත්මක විය හැකියි. කිසියම් ආකාරයකින් ගෝලීය වශයෙන් සිදුවන කම්පනයකින් ශ්‍රී ලංකා ආර්ථිකට බලපෑම් කළහොත් ඒ සඳහා මුහුණදීමට ශ්‍රී ලංකාවට හැකියාවක් නැහැ. ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වී තිබුණානම්, එමගින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ ඇති වන විශ්වාස ඔස්සේ ඔවුන්ගේ සහය ලබා ගැනීමට හැකියාවක් තිබෙනවා. මේ නිසා ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් කිරීම කඩිනමින් කළ යුත්තක්. මේ නිසයි "ශ්‍රී ලංකාව තවමත් ගමන් කරන්නේ මුවහත් පිහිතලයක් මතයි" යන පිරුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල භාවිත කර තිබුණේ. ඒ අනුව ණය තිරසරභාවය ඇති කර ගැනීම ශ්‍රී ලංකාව විසින් ඉක්මනින් කළ යුතු ව තිබෙනවා.

ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වුවත් ණය තිරසරභාවය ඇති කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව විදේශ විනිමය ඉහළ මට්ටමක පවත්වා ගත යුතුයි. රජය ආර්ථික පරිවර්තන පනතෙන් ඉදිරි කාලයේදී භාණ්ඩ හා සේවා අපනයන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 21-60 දක්වා වර්ධනය කිරීමටත් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ආයතිනක ව්‍යුහයේ ප්‍රතිසංස්කරණ ඇති කිරීමටත් අපේක්ෂා කරනවා. මේ ක්‍රියාවලිය සඳහා තරමක  කාලයක් ගත වීම ස්වාභාවිකයි. එහෙත් කෙටිකාලීන ව අපනයන ආදායම ප්‍රවර්ධනය සඳහා ද යම් යම් උපක්‍රම භාවිත කළ හැකියි. උදාහරණ වශයෙන් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමෙන් සිදුවන ආදායමේ ඉහළ යාම ක්ෂණික ව සිදු වන්නක්. එහෙත් තේ වැනි කෘෂිකාර්මික බෝගයක අපනයන පරිමාව කෙටි කාලයකින් ඉහළ දමා ගැනීමට හැකියාවක් නැහැ. මේ නිසා කෙටිකාලයේදී ආදායම් ඉහළ දමා ගැනීමට හැකියාව ලැබෙන ක්ෂේත්‍ර පිළිබඳවත් ශ්‍රී ලංකාවේ අවධානය යොමු විය යුතුයි. එසේ වුවත් විවිධ රටවල පවතින අර්බුදකාරී තත්ත්ව හේතුවෙන් මේ වන විට ගෝලීය ආර්ථිකයත් යම් අවදානමකයි පවතින්නේ. මේ නිසා

**ඉලක්ක කෙතරම්දුරට සාර්ථක ව ළඟා කරගෙන ඇති ද යන්න ඇගයීමකින් පසුවයි තෙවැනි ණය වාරිකය ලබා ගැනුණේ. ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා රජය ක්‍රියා කළේ විශාල අභියෝග රාශියක් මධ්‍යයේ. ඒ නිසා යම් යම් කොන්දේසි ඉටු කිරීමට ප්‍රමාදයක් පැවතුණත් ශ්‍රී ලංකාව ඒ සඳහා යොමු වීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇගයීමට ලක් වුණා.**

කෙටිකාලීන ව අපනයන ආදායම් ඉහළ දමා ගැනීම පහසු නැහැ. එහෙත් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ක්‍රියා කිරීම වඩා පහසු විය හැකියි. ඒ සඳහා ආර්ථික පරිවර්තන පනතේ දක්වා ඇති කරුණු ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම වැදගත්. එයට හේතුව අපනයන ආදායම ඉහළ නංවා ගැනීමෙන් ණය තිරසරභාවයට පදනම සපයනවා පමණක් නොව, දේශීය ආර්ථික ඒකක සඳහා ඉහළ ආදායමක් ළඟා කර ගැනීමට අවශ්‍ය පසුබිම ද සපයා දෙනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකාව අතර පවතින එකඟතා හේතුවෙන් අද වන විට පැහැදිලි ගමන් මාර්ගයකට ශ්‍රී ලංකාව ප්‍රවිෂ්ට වී තිබෙනවා. එය අතරමගදී නවතා දැමීමෙන් අවාසි සහගත තත්ත්වයක් උද්ගත වන්නේ ශ්‍රී ලංකාවටයි. පාලන බලය කවුරුන් හෙබවුවත් ශ්‍රී ලංකාව යා යුතු වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇතිකරගත් මේ එකඟතාව අනුවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා විවිධ මාර්ග තිබිය හැකියි. එහෙත් ඉලක්ක නොවෙනස් ව පවත්වා ගැනීමයි වැදගත්.



# එතෙරින් ආ ආදිවාසී නෑකම



**නිශාන්ත පීරිස්**

ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනාවාසකරණය වසර 48000ටත් වඩා ඈතට දිව යන බව පුරාවිද්‍යාවෙන් තහවුරු කර ඇත. විශේෂයෙන් පාහියංගල බලංගොඩ අවට ස්ථාන ආදිය ඒ සඳහා කදිම සාක්ෂ්‍ය සපයයි. ආදී මානව පරපුරට අයත් මෙරට ආදිවාසී ජනතාව ද ස්වකීය ඓතිහාසික ජන උරුමය ලොවට කියාපාන නූතන සජීවී නිදර්ශන වේ. ඔවුන් පිළිබඳ ව මෑතකදී වඩාත් අවධානයට ලක් වූ කරුණක් වූයේ 19 වැනි සියවස මැද භාගයේදී පර්යේෂණ කාර්යයක් සඳහා මෙරටින් ස්විට්සර්ලන්තයට ගෙන ගොස් තිබූ ආදිවාසී මානව හිස්කබල් අස්ථි හා එම උරුමය කියාපාන තවත් සංස්කෘතික කෞතුක භාණ්ඩ සමූහයක් යළි මෙරටට රැගෙන ඒමේ සිද්ධියයි.

වත්මන් ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිල ඇත්තන් සේ ම ඔහුගේ පියා වූ තිසාහාමි ඇතුළු වැදිජන සංස්කෘතිය පුමුඛ කර ගත් මෙරට ආදිවාසී ජනතාව වසර දහස් ගණනක අතීතයක සිට පැවත එන පිරිසක් බව විද්‍යාත්මක ව ද සනාථ කොට ඇත. ඔවුන් තමන්ට ම අනන්‍යවූ සුවිශේෂ මානව විද්‍යා හා සංස්කෘතික ලක්ෂණ පෙන්නුම් කරන ජන සමූහයකි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේදී මෙරට ජන සංස්කෘතිය, අදිවාසී ජනතාව ආදිය පිළිබඳ තොරතුරු සොයා බැලීමට යුරෝපයේ සිට විවිධ පර්යේෂකයන් මානව විද්‍යාඥයන් මෙහි පැමිණි බව පැහැදිලි ය. 19 වැනි සියවසේ මැද භාගයේදී මෙහි පැමිණි පී. සැරසින් හා එෆ්. සැරසින් යන සහෝදරයන් දෙපළ ද ආදිවාසී ජන උරුමය සොයා මෙරට විවිධ ස්ථානවල පර්යේෂණාත්මක තොරතුරු රැස් කර තිබේ. විශේෂයෙන් ගල්ඔය නිම්නය, දඹාන, නිල්ගල, හෙන්නානිගල වැනි ප්‍රදේශවලින් ආදිවාසී ජන සංස්කෘතියට අදාළ බොහෝ තොරතුරු හා සාධක ඔවුන්ට රැස්කර ගැනීමට හැකි වී ඇත. මානව හිස් කබල්, අස්ථි කොටස්, භාවිත කළ මෙවලම්, සංස්කෘතිකමය සාධක ආදීය ඒ අතර ප්‍රධාන ය.

සැරසින් සහෝදරයන් ඒවා මෙරටින් රැගෙන ගියේ ස්විට්සර්ලන්තයට ය. එරට ප්‍රකට රයින් නදිය අසළ පිහිටි බැසල්ස් ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරයේ සහ බැසල්ස් සංස්කෘතික කෞතුකාගාරයේ ඒවා වෙන් වශයෙන් තැන්පත් කෙරිණි. මෑතකාලීන ව මේ සිදුවීම් මාලාව පිළිබඳ තොරතුරු අනාවරණය වීමෙන් පසුව ශ්‍රී ලංකාවෙන් එලෙස ගෙන යන ලද මානව අස්ථි කොටස් සහ













සංස්කෘතිකමය කෞතුක මෙවලම් යළි මෙරටට ගෙන්වා ගැනීම සඳහා වූ ක්‍රියාවලිය පණ ගැන්විණි.

එහිදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්ය ඔෂාන් වෙදගේ, ජර්මනියේ මැක්ස් ප්ලෑන්ක් මානව විද්‍යා ආයතනයේ ආචාර්ය පැට්‍රික් රොබට්ස්, ස්විට්සර්ලන්තයේ බැසල්ස් ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරයේ ආචාර්ය ගේහාඩ් සහ බැසල්ස් සංස්කෘතික කෞතුකාගාරයේ පර්යේෂක බැසිල් විසින් සිදු කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයකින් පළමු ව එම කෞතුකාගාරවල තැන්පත් කර තිබූ මානව අස්ථි සහ සංස්කෘතික කෞතුකාගාර භාණ්ඩ මෙරට ආදිවාසි ජන කොටස්වල උරුම බව තහවුරු කර ගැනිණි.

මෙහිදී සිදු කළ පර්යේෂණ, ප්‍රදර්ශන සහ ඩිජිටල් මාධ්‍ය අනුසාරයෙන් කරන ලද තහවුරු කිරීම්වලින් පසු වර්තමානයේ දකුණු ආසියා කලාපයේ සිටින ඉතා වැදගත් ආදිවාසී ජන කණ්ඩායම ලංකාවේ වැදි පරපුර බව සහ ඔවුන් මේ වන විටත් ජීවමාන ආදිවාසී පරපුරක් ලෙස ඔවුන්ගේ අභිචාර විධි, මළවුන් වෙනුවෙන් සිදු කරන වත්පිළිවෙත් සහ ඔවුන්ගේ සංස්කෘතික උරුම ඉදිරියට පවත්වාගෙන යාමේදී මේ මානව අස්ථි සහ සංස්කෘතික කෞතුක භාණ්ඩ වෙනත් රටක කෞතුකාගාරවල තැන්පත් කර තිබීම ගැටලුවක් බව අවධාරණය කෙරිණි. එයින් සිදුවන සංස්කෘතික බලපෑම ස්විට්සර්ලන්ත රජය විසින් පිළිගනු ලැබීමෙන් පසුව සියලු මානව අස්ථි සහ සංස්කෘතික කෞතුක භාණ්ඩ එම ආදිවාසීන් වෙත දෙරට අතර සංහිඳියාවේ ව්‍යාපෘතියක් ලෙස භාර දීමට එම රජය තීරණය කළේ ය.

අදහස් දක්වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්ය ඔෂාන් වෙදගේ; "විශේෂයෙන් මෙරට ආදිවාසී ජනතාවගේ සාම්ප්‍රදායික චාරිත්‍රයක් වන මළවුන් පිදීමේ සිරිත ඔවුන් මේ දක්වා ම ගෞරවාන්විත ව සිදු කරන්නක් නිසා එම අභිචාරය පැවැත්වීමට මේ හිස් කබල් සහ අස්ථි කොටස් එම වැදි ජනතාවට ම ලබා දීමේ වැදගත්කම ස්විට්සර්ලන්ත රජයට අවධාරණය කෙරුණා. ඒ සියල්ල අධ්‍යයනය කිරීමෙන් පසුව



ආචාර්ය
**ඔෂාන් වෙදගේ**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

බැසල්ස් කෞතුකාගාර අධිකාරිය හා එරට ප්‍රාදේශීය රජය එම ඉල්ලීම පිළිගෙන ඒවා ආදිවාසී ජනතාවට ම ලබා දීම යුක්ති සහගත යැයි තිරණය කිරීම අතිශය වැදගත්. ආදිවාසී නායක උරුවරිගේ වන්නිල ඇත්තන් හා ඔහුගේ පුත්‍රයකු වූ කළුබන්ඩියා ද ස්විට්සර්ලන්තයට ගොස් එම කෞතුක වස්තු සියල්ල පරීක්ෂා කිරීමෙන් අනතුරු ව 2024 මැයි 28 දින ස්විට්සර්ලන්ත රජය විසින් ඒවා නිල වශයෙන් ශ්‍රී ලංකාව වෙත භාර දුන්නා." ආදිවාසී මානව හිස් කබල් 30ක් හා මානව ඇසැකිලි 12ක් ද ඔවුන් විසින් භාවිත කරන ලදැයි සැලකෙන දුනු, ඊතල, කෙටේරි ආදී ආම්පන්න සහ වෙනත් දෑ ද මේ කෞතුක වස්තු අතර විය.


මේ මානව අස්ථි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ජාන විද්‍යාත්මක පර්යේෂණවලට ලක් කිරීමට නියමිත ය. ඒ අනුව හිස් කබල් සහ අස්ථි කොටස් සියල්ල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සුරංගි යසවර්ධන භාරයට පර්යේෂණ සඳහා යොමු කොට ඇත. සංස්කෘතිකමය කෞතුක භාණ්ඩ එම විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අංශාධිපති පූජ්‍ය දඹර අමිල හිමියන්ගේ අධීක්ෂණයට ද පත් කොට තිබේ. එමගින් ලංකාවේ ආදිවාසීන් පිළිබඳ විද්‍යාත්මක තොරතුරු රැසක් අනාවරණය කර ගැනීමට සැලසුම් කර ඇත. මානව අස්ථි සහ සංස්කෘතික කෞතුක භාණ්ඩ කෞතුකාගාර ප්‍රමිතිවලට අනුකූල ව කෙරෙන ප්‍රතිසංස්කරණයකින් අනතුරු ව, ඉදිරියේදී ඒවා දඹාන වරිග මහගෙදර ජන උරුම කෞතුකාගාරයේ මහජනතාවට ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබේ. එහෙත් ඒ සියල්ල සිදු වන්නේ ආදිවාසී ශරීර හිස් කබල් සහ අස්ථි කොටස්වලින් යම් කොටසක් වැදි ජනතාවගේ චාරිත්‍රානුකූල භූමිදානය කිරීමේ අභිචාරයෙන් පසුව බව ද අවධාරණය කෙරේ.

ඉදිරියටත් මේ පර්යේෂණ කාර්යයට බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ස්විට්සර්ලන්තයේ බැසල්ස් ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරය හා සංස්කෘතික කෞතුකාගාරය, ජර්මනියේ මානව විද්‍යා පර්යේෂණ ආයතනය සහ දඹාන ආදිවාසී වරිග මහගෙදර යන පාර්ශව ඒකාබද්ධ ව සම්බන්ධ වේ. ආදිවාසී ජනතාවගේ ජන උරුමය සේ ම සම්ප්‍රදාය ආරක්ෂා කර ගනිමින් ඔවුන්ගේ යහ පැවැත්ම උදෙසා ජාතියක් වශයෙන් අප ක්‍රියා කළ යුතු ව ඇත. ලොව දහස් සංඛ්‍යාත රටවල් අතුරින් මෙවැනි ආදිවාසී ජන සංස්කෘතියක් තමවත් සුජීවත් වන රටවල් සංඛ්‍යාව අතළොස්සකි. එය ප්‍රත්‍යක්ෂයෙන් දැකීම ඉතා කාලෝචිත වේ.









# තෙත්බිම් උරුමය

බිනූ දිලාරා ගමගේ




1991 වසරේදී Wildfowl and Wetland Trust (WWT) විසින් පිහිටුවන ලද ජාත්‍යන්තර තෙත්බිම් එකමුතුව (Wetland Link International - WLI) ලෝක ප්‍රජාවට තෙත්බිම් පරිසර පද්ධති පිළිබඳ දැනුම බෙදා හැරීම හා හුවමාරු කාර්යය සඳහා සුවිශේෂ භූමිකාවක් ඉටු කරයි. 1971 වසරේදී පිහිටුවන ලද රැම්සාර් ආයතනයේ එක් අනුශාඛාවක් වන මේ තෙත්බිම් එකමුතුවේ එක් කලාපීය සංවිධානයක් වන ආසියානු තෙත්බිම් එකමුතුවේ 09 වැනි සමුළුව ශ්‍රී ලංකාවේ සත්කාරකත්වයෙන් නොබෝද (ජූනි 17-21) බත්තරමුල්ල දියසරු උද්‍යානය ආශ්‍රිත ව පැවැත්වුණි. එය නම් කර තිබුණේ 'අන්තර්ජාතික තෙත්බිම් උද්‍යාන එකමුතුවේ ඕස්ට්‍රේලියානු, නවසීලන්ත හා ආසියානු පළමුවැනි සමුළුව' ලෙස ය. ඒ, 2023 වසරේ සංවිධානයේ නව සාමාජිකත්වය නවසීලන්තය හා ඕස්ට්‍රේලියාව ලබා ගැනීමත් සමග එම රටවල් සහභාගි වන පළමු වැනි WLI Asia Oceania තෙත්බිම් සමුළුව මෙය වන බැවිනි. 'පරිසර සංචාරක ව්‍යාපාරය සඳහා තෙත්බිම් සහ තෙත්බිම් මධ්‍යස්ථාන' යන තේමාව මූලික කරගෙන පැවති මෙවර සමුළුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, බස්නාහිර පළාත් සංචාරක අධිකාරිය, ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව යන ආයතනවල සාමූහිකත්වයෙන් සංවිධානය විය. වසර දෙකකට වරක් පවත්වන මේ සමුළුවට මෙවර රටවල් 15ක තෙත්බිම් සංවිධාන 60කට ආසන්න සංඛ්‍යාවක නියෝජිතයෝ 100කට ආසන්න ව සහභාගි වූහ.

අදහස් දක්වන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්. එස් සත්‍යානන්ද; "ශ්‍රී ලංකා රජය තෙත්බිම් සංරක්ෂණයෙන් පාරිසරික සමතුලිතතාව හා ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින් ගෝලීය වශයෙන් ඇතිවන අභියෝගවලට සාර්ථක ව රටක් වශයෙන් මුහුණ දිය හැකි ආකාරයේ දැනුමක් ඒකරාශි කිරීම මේ සමුළුවෙන් අපේක්ෂා කරනවා. ශ්‍රී ලංකාව මේ වන විට මුහුණදෙමින් සිටින ආර්ථික අර්බුදයට ආර්ථිකමය ශක්තියක් ලබා ගැනීමටත් මේ සමුළුව වැදගත්. විශේෂයෙන් විදේශ සංචාරකයන්ගේ ආකර්ෂණය ක්‍රමයෙන් මෙරට පාරිසරික සෞන්දර්යය කෙරෙහි වර්ධනය වෙමින් පවතින අවස්ථාවක තෙත්බිම් සංරක්ෂණය හා පාරිසරික දැනුවත් කිරීම් සම්බන්ධයෙන් ලෝකයට දැනුම ලබා දීමටත් ශ්‍රී ලංකාව ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග හා අත්දැකීම් සම්බන්ධයෙන් ලෝකය දැනුවත් කිරීමටත් මෙය මහඟු අවස්ථාවක්."

වසර දෙදහසකට වඩා ඉපැරණි ශ්‍රී ලංකාවට උරුම තෙත්බිම් කලාප මේ අතර වඩාත් සුවිශේෂ වන්නේ සංචාරක පක්ෂීන්ට පවා වාසස්ථාන නිර්මාණය කිරීම නිසා බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තෙත්බිම් කළමනාකරණ ඉංජිනේරු ආචාර්ය එන්. එස්. විජේරත්න පවසයි. අදහස් දක්වන ඔහු; "සංචාරක පක්ෂීන්ට ඔවුන්ගේ ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට තෙත්බිම් ඉතා වැදගත්. චීනය, රුසියාව වැනි රටවල සිට පැමිණෙන සංචාරක පක්ෂීන්ගේ අවසාන ගමනාන්තය වන්නේ ශ්‍රී ලංකාවේ තෙත්බිම් උද්‍යාන. සංචාරකයන්ට පවා මේ සුන්දරත්වය විඳින්න අවස්ථාව ලබා දීමට හැකියාව පවතිනවා."

2018 වසරේදී පළමු ජාත්‍යන්තර තෙත්බිම් නගරය (Wetland City) වශයෙන් රැම්සාර් සහතිකය කොළඹ අගනගරයට හිමි විය. ශ්‍රී ලංකාව කෙරෙහි සංචාරක ආකර්ෂණය වර්ධනය කිරීමට තෙත්බිම් ආශ්‍රිත පාරිසරික කලාප උපයෝගී කරගත හැකි බව පවසන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ සභාපති සුගත් හේවාපතිරණ; "2018 වසරේදී කොළඹ අගනගරය ලොව පළමු තෙත්බිම් නගරය බවට පත් කරමින් ශ්‍රී ලංකාව ලබා ගන්නා ලද සන්නාමය උපයෝගී කර ගනිමින් මෙරට සංචාරක කර්මාන්තයේ

දියුණු කරනවා. ස්වභාවධර්මයේ දායාද කෙරෙහි ජාත්‍යන්තර ප්‍රජාව ආකර්ෂණය කරගෙන ඉන් ආදායමක් ගෙන ඒමටත් සංචාරක කර්මාන්තයට පවතින්නේ ඉහළ විභවතාවක්." පරිසර හිතකාමී සංචාරක කර්මාන්තයක් (Eco-Tourism) සඳහා තෙත්බිම් යොදාගත හැකි ආකාරය පිළිබඳවත් මේ සමුළුවේදී අවධානය යොමු වීම වැදගත්.

සීමිත භූමි ප්‍රමාණයක පමණක් තෙත්බිම් පරිසර පද්ධති දක්නට ලැබුණත් තෙත්බිම්වල බලපෑම ඒවා නිජබිම කරගත් භූමියට පමණක් නොව ලෝකයට ම ප්‍රයෝජනවත් වන බව රැම්සාර් (RAMSAR) සම්මුතිය පෙන්වා දෙයි. රැම්සාර් සම්මුතියට අනුව "ස්වාභාවික හෝ කෘත්‍රිම, ස්ථිර හෝ තාවකාලික, ස්ථිතික හෝ ගලා යන ජලයෙන් යුතු, නැවුම් හෝ කිවුල් හෝ ලුණු සාන්ද්‍රණයක් සහිත, අඩු වඩදියකදී ගැඹුර මීටර් හයක් නොඉක්මවන ලද වගුරු බිමක් හෝ එවැනි ජලයෙන් පිරුණු භූමියක්" තෙත්බිමක් වශයෙන් හඳුනා ගැනෙයි.

සාමාන්‍යයෙන් තෙත්බිම් ස්වභාව පහක් මිහිපිට හඳුනා ගැනීමට හැකිවන අතර ඒවා වෙරළබඩ තෙත්බිම් (marine), ඩෙල්ටා හා කඩොලාන ආශ්‍රිත කළපු තෙත්බිම් (estuarine), විල් ආශ්‍රිත තෙත් බිම් (lacustrine), ගංගා හා ඇළදොළ ආශ්‍රිත තෙත්බිම් (riverine) සහ වගුරු බිම් ආශ්‍රිත තෙත්බිම් (palustrine) වශයෙන් හඳුනා ගනියි. රැම්සාර් වර්ගීකරණයට අදාළ ව සමුද්‍ර සහ වෙරළබඩ තෙත්බිම්, අභ්‍යන්තර තෙත්බිම් සහ මිනිසුන් විසින් සාදන ලද තෙත්බිම් වශයෙන් ප්‍රධාන කාණ්ඩ තුනකට අයත් තෙත්බිම් වර්ග 42ක් ද හඳුනා ගත හැකියි.

විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසාත් ඇතැම් පාරිසරික තත්ත්ව හමුවේත් තෙත්බිම් විශාල වශයෙන් තර්ජනයට ලක් වූ පරිසර කලාපයක් බවට පත් ව තිබෙන බව ශ්‍රී ලංකාවේ තෙත්බිම් පිළිබඳ අවධානය යොමු කරමින් 2004 වසරේදී IUCN (International Union for Conservation of Nature and Natural Resources) සංවිධානය වෙනුවෙන් J.C.J.Van Zon පෙන්වා දී ඇත. ආසියානු තෙත්බිම් නාමාවලියට (1989) අනුව තොණ්ඩමන්නාර් කළපුව, චුන්ඩික්කුලම් කළපුව, චලෙයි කළපුව, පෙරියකාරච්චි සහ චින්නකරච්චි කළපුව, මහවැලි ගඟ දෙපස, ලූනම කළපුව සහ බෙල්ලන්විල-අත්තිඩිය ආශ්‍රිත තෙත්බිම් ඒ වනවිට උග්‍ර සහ මධ්‍යස්ථ මට්ටමේ වඳ වීමේ තර්ජනවලට හසු ව පැවතුණු බව සඳහන් ය.

**ශ්‍රී ලංකා රජය තෙත්බිම් සංරක්ෂණයෙන් පාරිසරික සමතුලිතතාව හා ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින් ගෝලීය වශයෙන් ඇතිවන අභියෝගවලට සාර්ථක ව රටක් වශයෙන් මුහුණ දිය හැකි ආකාරයේ දැනුමක් ඒකරාශි කිරීම මේ සමුළුවෙන් අපේක්ෂා කරනවා. ශ්‍රී ලංකාව මේ වන විට මුහුණදෙමින් සිටින ආර්ථික අර්බුදයට ආර්ථිකමය ශක්තියක් ලබා ගැනීමටත් මේ සමුළුව වැදගත්.**

එහෙත් පසුගිය වසර කිහිපයේ තෙත්බිම්වල වටිනාකම පිළිබඳ ගෝලීය ජනතාවගේ අවධානය හා අවබෝධය ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස තෙත්බිම් නැවතත් පුනර්ජනනය කරමින් ඒවායේ ක්‍රියාකාරීත්වය සුරක්ෂිත කිරීමට බොහෝ රටවල් පියවර ගෙන තිබේ. ජෛව විවිධත්වය හා ජල පෝෂකත්වය රැක ගැනීම සඳහා සුවිශේෂ දායකත්වයක් සපයන තෙත්බිම් කුරුල්ලන්, ක්ෂීරපායින්, උරගයන්, උභයජීවීන්, මාළු සහ අපෘෂ්ඨවංශී සත්ත්ව හා විවිධ ශාක විශේෂ ගණනාවකට වාසස්ථාන සලසා දෙන පරිසර පද්ධතියකි. දේශගුණික බලපෑම් හා ලෝක ජනගහනයේ අධික වර්ධනය නිසා දිනෙන් දින උග්‍රවන ජල අර්බුදයට විසඳුමක් ද තෙත්බිම් පරිසර පද්ධති සපයයි. වෙනස් වන පරිසර තත්ත්ව සඳහා මනාව අනුවර්තනය වීමට ඇති හැකියාව නිසාත් තෙත්බිම් පරිසර පද්ධති දේශගුණික විපර්යාසවලදී වඩාත් තීරණාත්මක වෙයි. ධීවර කර්මාන්තයට, කෘෂිකර්මාන්තයට, නිරන්තර ගංවතුර තත්ත්ව ඇතිවන ප්‍රදේශවල පසෙහි පෝෂක රඳවා තබා ගැනීමට, දැව නිෂ්පාදනයේදී ප්‍රවාහන කාර්යයට වඩා ප්‍රයෝජනවත් වන අතර තෙත්බිම් අහිතකර ස්වභාවික වායු අවශෝෂණය කර ගන්නා පරිසර පද්ධතියක් වශයෙන් ද හඳුනා ගැනෙයි. ඒවා ඇතැම් ජන වර්ගවල ආගමික හා ආධ්‍යාත්මික විශ්වාස සමග බැඳුණු සෞන්දර්යාත්මක වටිනාකමකින් යුත් සංස්කෘතික උරුමයක් ද වෙයි.






තුසිත ජයසුන්දර

සිරිලක සීමාවෙන් ඔබ්බට සිරිලක සිනමාව රැගෙන යමින් එය ජගත් සිනමාවේ සැලකිල්ලට හා ගෞරවයටත් සම්මානයටත් ලක් කරලීම පිණිස වරෙක අවිඥානික ව ද තවත් වරෙක සවිඥානික ව ද පෙරට ආ නවක, ප්‍රතිභාසම්පන්න හා තරුණ සිනමාකරුවන් පිරිසකගේ ආගමනයක් අදින් තිස් දෙවසරකට පෙරාතුව සනිටුහන් වන්නේ ප්‍රසන්න විතානගේ නාමය පෙරටු කොට ගනිමිනි. සිනමාපට නිපැයුම හා ප්‍රදර්ශනය අතර පවත්නා ඒකාකාර නොවන සබඳතාව යටතේ වුව ද ප්‍රසන්න විතානගේ මෙහි පළමුවැන්නා හෝ පළමුවැන්නකු වීම අත්‍යන්තයෙන් ම සහේතුක ය. ඉනික්බිති ව ගෙවී ගිය කාල වකවානුව පුරා ම සිරිලක සිනමාවට පෙර කියූ වටිනාකම වැඩිපුර ම හිමි කර දුන් සිනමාකරුවා හෝ සිනමාකරුවකු වන්නේ ද ඔහුයි. වඩාත් ම වැදගත් කරුණක් වනුයේ අනතුරු ව උදා වූ සමයේ අභිනව සිනමා පිවිසුමකට ඇවැසි සිනමාකරුවන් ප්‍රමුඛ පාර්ශ්ව සූදානම් කරලීම පිණිස ඔහු දැක්වූ මනාපය හා උනන්දුවයි.

ගෙවුණු තිස් දෙවසරක කාලයේ ප්‍රසන්න විතානගේ විසින් නිර්මාණය කරන ලදු ව ප්‍රදර්ශිත වෘත්තාන්ත සිනමාපට සංඛ්‍යාව නවයකි. වාර්තා සිනමාපට එකකි. ඉතාලි සිනමාකරු උබර්තෝ පැසොලිනි නිර්මාණය කළ එක් සිනමාපටයක නිපැයුම්කරු ඔහු ය. එහි ප්‍රසන්න විතානගේ ලකුණු නොමඳ ව පැවැති වග මෙහිලා සනිටුහන් කරන්නේ සිනමාකරු උබර්තෝ පැසොලිනි නොතකා හැරීමේ අදහසකින් නොවන බව සිහි කටයුතු ය.

මේ ගෙවී යන්නේ ප්‍රසන්නගේ නවතම වෘත්තාන්ත සිනමාපටය වන 'පැරඩයිස්' ලොව තිරගත කෙරෙන සමයයි. පැරඩයිස්' ඉදිරිපත් කෙරෙන්නේ ඉන්දියානු නිපැයුමක් සේ ය. රූපණ පාර්ශ්වයේ බොහෝ දෙනෙකු සිරිලක ය. රූගත කොට ඇත්තේ ද සිරිලක ය. මෙබඳු සිනමාපට ගණනාවකින් ම සිරිලක සිනමාව සමන්විත වන වග මෙතැනදී සිහිපත් වේ. සිනමාව හුදු රසාලිප්ත අත්දැකීමක් සේ භාවිත නොකරමින් ජීවිතය, සමාජය හා මිනිස් සබඳතා පිළිබඳ නව කියැවීමකට රසිකයා ගෙන යන සිනමාපට ද සිරිලක සිනමාව පොහොසත් කළ අවස්ථා සුලබ නොවේ. 'පැරඩයිස්' පළමුකොට ම හඳුනා ගත හැක්කේ එබඳු දුලබ නිපැයුමක් ලෙසිනි.

**මහජන ප්‍රදර්ශනයට පෙරාතුව දෙස් විදෙස් සිනමා උළෙල කරා සිනමාපට යොමුකරලීම වත්මන් සිනමා සම්ප්‍රදායක් වී තිබේ. මෙහිලා හිමිවන යම් සම්මානයක් හෝ පිළිගැනීමක් සිනමාපටයේ ප්‍රදර්ශන කාර්යයේදී ප්‍රචාරක අංගයක් සේ භාවිත කෙරේ.**

ඉංගිරිසි, මලයාලම්, දමිළ, හින්දි හා සිංහල භාෂා ඔස්සේ රසිකයා අමතන්නට 'පැරඩයිස්' සූදානම් ය. ඉන්දීය නිපැයුම්කරු වන්නේ හින්දි හා මලයාලම් සිනමාපට නිපැයුමට මෑතදී එක්වූ නිව්ටන් සිනමා නිපැයුම් සමාගමයි. 'පැරඩයිස්' ලොව පුරා රැගෙන යන්නේ සුප්‍රකට සිනමාකරු මනිරත්නම් හා ඔහුගේ සොහොයුරු ජී. සිරිනිවාසන් විසින් පිහිටුවනු ලැබූ මැඩ්රාස් ටෝකිස් සමාගමයි. මනිරත්නම් හා වෙනත් සිනමාකරුවන් කිහිපදෙනකුගේ ජනාකර්ෂණීය සිනමාපට ගණනාවක් ම ඉන්දියානු දේශයේ හා ඉන් පරිබාහිර







ව බෙදා හැර ඇති මැඩ්රාස් ටෝකීස් පසුගිය සමයේ වෙළෙඳපොළ සාර්ථකවීම් ද නොමඳ ව පෙන්නුම් කර තිබිණි. සිරිලක නියෝජනය කරමින් ප්‍රසන්න මෙතැනට පැමිණීම සිරිලක සිනමාවට අදාළ සුවිශේෂ තත්ත්වයකි.

මහජන ප්‍රදර්ශනයට පෙරාතුව දෙස් විදෙස් සිනමා උළෙල කරා සිනමාපට යොමුකරලීම වත්මන් සිනමා සම්ප්‍රදායක් වී තිබේ. මෙහිලා හිමිවන යම් සම්මානයක් හෝ පිළිගැනීමක් සිනමාපටයේ ප්‍රදර්ශන කාර්යයේදී ප්‍රචාරක අංගයක් සේ භාවිත කෙරේ. සිනමාව නිරනුමාන ව ම වෙළෙඳ ව්‍යාපාරයක් ද වන නිසා ජීවිතය, සමාජය හා මිනිස් සබඳතා ගැඹුරින් හසු කර ගන්නා සිනමාපටවලට ද සිදුවන්නේ ඉන් බැහැර නොවන්නටයි. මෙය සිනමාවේ සමත්කම් අවතක්සේරු කරන පිවිසුමක් සේ නිර්වචනය නොකිරීමට පියවර ගත යුතු ය.

'පැරඩයිස්' මහජන ප්‍රදර්ශනයට එක් වන්නේත් ලොව සිනමා උළෙල කිහිපයකදී ම සැලකිල්ලට, ගෞරවයට හා සම්මානයට පාත්‍ර වූ පසුබිමක ය. ප්‍රංශයේ තිස් වැනි වෙෂූල් අන්තර්ජාතික සිනමා උළෙල, දකුණු කොරියාවේ බූසාන් අන්තර්ජාතික සිනමා උළෙල හා ස්පාඤ්ඤයේ ලස්පල්මාස් ඩි ග්‍රෑන් කැනරියා අන්තර්ජාතික සිනමා උළෙල නියෝජනය කරමින් 'පැරඩයිස්' මුල් පෙළේ සම්මාන කිහිපයක් ම හිමි කර ගත්තේ ඉන්දීය සිනමාවට සේ ම සිරිලක සිනමාවට ද වටිනාකමක් ගෙන දෙමිනි. කේරළ, පූනේ ඇතුළු අන්තර්ජාතික සිනමා උළෙල කිහිපයක් නියෝජනය කිරීමේ අවස්ථාව ද 'පැරඩයිස්'ට හිමි විය.

ප්‍රසන්නගේ මුල්කාලීන සිනමාපට ජීවිතය, සමාජය හා මිනිස් සබඳතා ඇසුරෙන් දාර්ශනික කතිකා සිනමානුරූපී ව ගෙන හැර පෑ මතක හිටිනසුළු අවස්ථා වේ. සත්‍යය, මිථ්‍යාව හා සත්‍යය සේ පෙනී යන මිථ්‍යාව ද මිථ්‍යාව සේ පෙනී යන සත්‍යය ද පිළිබඳ කතිකාවක් පොහොසත් කළ සිනමාපටයක් සේ 'සිසිල ගිනි ගනී' හඳුනා ගැනේ. 'අනන්ත රාත්‍රිය' පුද්ගල පසුතැවීමක අසීමාන්තික බව සියුම් ව දැනවූ සිනමාපටයකි. ගෙවුණු යුද සමය පාදක වුව ද පුද්ගල ආත්ම විශ්වාසයේ සීමා හා එහි පරිවර්තන නිරූපිත සිනමාපටයක් සේ 'පුරහඳ කළුවර' කැපී පෙනේ. 'පවුරු වළලු' යථාර්ථය හා ප්‍රාර්ථනා අතර නොඑකඟතාව විවරණයට බට සිනමාපටයකි.

පසුකාලීන ව ප්‍රසන්න නිර්මාණය කළ 'ඔබ නැතුව ඔබ එක්ක' ද කිසියම් දාර්ශනික කතිකාවක් පොහොසත් කරලීමට උත්සුක වූ සිනමාපටයක් සේ හඳුනා ගත හැකි ය. 'ඉර මැදියම', 'ආකාස කුසුම්' හා 'තුන් දෙනෙක්' යන සිනමාපටත්‍රයත් 'උසාවිය නිහඬයි' යන වාර්තා සිනමාපටයත් සමග ප්‍රසන්න සුපැහැදිලි ව ම පවසන්නේ තත්කාලීන සුලබ අත්දැකීම් ඔස්සේ යම් දේශපාලනික කතිකාවකට සපැමිණීමට තමා තුළ ඇති කැමැත්ත ය. 'ගාඩි' සිනමාපටය මෙතැනට නොකැඳවන්නේ එහි ආ තේමාව ඉක්මවා රමණීය පෙම් පුවතක් උද්ධරණය වූ හෙයිනි.

'පැරඩයිස්' හඳුනා ගත හැක්කේ ද තත්කාලීන සුලබ අත්දැකීම් ඔස්සේ දේශපාලනික කතිකාවක් පොහොසත් කරලීමට උත්සුක වන ප්‍රසන්නගේ තවත් සිනමාපටයක් වශයෙනි. එහෙත් මෙය උක්ත සිනමාපට සතරේ දිගුවක් සේ නොසැලකිය යුතු ය. මේ අතරැති වෙනස්කම් නිශ්චය කර ගැනීම විද්වත් රසිකයා මත පැටවෙන වගකීමකි.

'පැරඩයිස්'හිදී ප්‍රසන්න ගොඩ නඟන්නේ වෙසෙසින් ම සිරිලකවාසීනට සමීප පසුබිමකි. තරුණ ඉන්දියානු යුවළක් සිය පස්වැනි විවාහ සංවත්සරය සමරනුවස් සිරිලකට පැමිණෙති. සිරිලක ම ව්‍යාකූල ය. ජන දිවිය පෙර නොවූ විරූ අර්බුද රැසකින් ම ගහන ය. මේ අදින් දෙවසරකට ඉහත සිරිලකයි. සියලු අර්බුද ආර්ථික තලයේ සිට දේශපාලන තලය දක්වා ගමක් කරන සෙයකි. තරුණ යුවළ මේ තතු මැද මුහුණදෙන අනපේක්ෂිත අත්දැකීම සමුච්චයක් සමගින් සිනමාපටය ඉදිරියට ඇදෙයි. මෙයට සමගාමී ව ප්‍රසන්න සූදානම් වන්නේ 'පැරඩයිස්' නොඑසේනම් 'පාරාදීසය' යන්නට නව අරුතක් සපයන්නට ය. මෙය කර්කශ වූවකි. වටහා ගැනුමට බහුවිධ අරුත් ඇවැසි ම නොවේ.

රොෂාන් මැතිව් හා දර්ශනා රාජේන්ද්‍රන් යන ඉන්දීය නළු නිළි යුවළ සමග මහේන්ද්‍ර පෙරේරා හා ශ්‍යාම් ප්‍රනාන්දු ප්‍රමුඛ චරිත නිරූපණය කරන්නේ සිනමාපටයේ අරුත කුළුගන්වමිනි. මෙයට සානුබල සපයන තිරනාටකය ප්‍රසන්න සමග රචනා කරමින් අනුෂ්කා සේනානායක දක්වන සමත්කම ද ලඝු නොකළ යුතු ය. සිනමාපටයේ තිරයෙන් පිටුපස බොහෝ කාර්ය පැවරී ඇත්තේ ඉන්දීය ශිල්පීන්ට ය. ඔවුහු ප්‍රසන්නගේ සිනමාවතරණය පිළිබඳ ප්‍රමාණවත් වැටහීමකින් සිටි වග පෙනේ. ප්‍රසන්නගේ සිනමාපට සතු රූපමය ප්‍රමිතිය මෙහිදී කිසිවිටෙකත් උල්ලංඝනය නොවේ. එහි එන විශ්වසනීයත්වය ද සිනමානුරූපී බවකින් සමන්විත ය. කවර රිද්මයකට පිවිසුන ද ප්‍රසන්න ඊට අදාළ ව සිය අනන්‍යතාව තහවුරු කර ගන්නෙකි. විචාරක පැසසුම් නොඅඩුව ලද 'ඉර මැදියම' හා විචාරක පැසසුම් එපමණ නොලද 'ගාඩි' පිළිබඳ පසු විමසුමකදී මෙකරුණ තවදුරටත් පැහැදිලි කර ගත හැකි ය. 'පැරඩයිස්' මෙය පිළිබිඹු වන තවත් අවස්ථාවකි.

---




# කොග්ගල පොත්ගුල නිදහස් මාවතට

කෞතුකාගාරය විවෘත කිරීම - අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා ඇතුළු පිරිස

නුවන් කුමාර කටුගම්පල

එහි පොත් පන්දහස් තුන්සිය එකොළහකි. ඊට ඔහු ලියූ අත්පිටපත් සහ මුද්‍රිතපොත් සියල්ල ද කියවූ අනෙකුත් පොත්පත් සියල්ල ද අයත් වේ. ඒ, හෙළයේ මහා ගත්කරු, කොග්ගල ප්‍රාඥයා යන විරුදාවලී ලද මාර්ටින් වික්‍රමසිංහ නම් අග්‍රගණ්‍ය ලේඛකයාගේ පෞද්ගලික පුස්තකාලයේ තිබූ පොත් ය. පොත්වලට අමතර ව ඔහු ලේඛන කාර්යය සඳහා භාවිත කළ උපකරණ ද ඡායාරූප සහ සිතුවම් ආදිය ද සම්මාන සහ සමරු තිළිණ ආදිය ද එහි වේ. එය නම්, ඔහුගේ 134 වැනි ජන්ම සංවත්සරය වෙනුවෙන් 2024 මැයි මස 29 දින කොළඹ 07 නිදහස් මාවතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩල ගොඩනැගිල්ලේ දෙවැනි මහලේ ප්‍රතිෂ්ඨාපනය කර විවෘත කරන ලද 'මාර්ටින් වික්‍රමසිංහ ජනලේඛන එකතුව සහ කෞතුකාගාරය'ය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ සභාපති මහාචාර්ය නන්ද ධර්මරත්න අදහස් දක්වමින් "මාර්ටින් වික්‍රමසිංහ මැතිතුමාගේ දරුවන් අපට මේ ලබා දුන් ත්‍යාගය විශාල දිරියක්. තවදුරටත් තාක්ෂණික සහ අනෙකුත් පහසුකම් වර්ධනය කරමින් මේ ස්ථානය වැඩිදියුණු කිරීම අපේ කාර්යභාරය. නවීකරණය කරන ලද ජාතික පුස්තකාලයේ සුවිශේෂී ඉඩක මාගේ ධුර කාලයේදී මෙය අරඹන්නට ලැබීම ඉමහත් සතුටක්" යනුවෙන් ප්‍රකාශ කළේය.

1990ට පෙර ජාතික පුස්තකාලයේ මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ පොත්පත් වෙනුවෙන් ම වෙන්වූ සුවිශේෂී ඉඩකඩක් නොතිබිණි. 1990 වසරේදී ඔහුගේ සිය වැනි ජන්ම සංවත්සරය වෙනුවෙන් කෘති එකතුව සංරක්ෂණය කිරීම සඳහා පෙළඹී තිබෙන අතර එහි තිබුණාට වඩා වැඩි වපසරියක් සහ පහසුකම් රැසක් මේ නව ස්ථානයේ පවතී.

මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලියු. සුනිල් මෙහිදී කියා සිටියේ මෙය ජාතික පුස්තකාලයට මෙන්ම සමස්ත ජාතියට ම වැදගත් අවස්ථාවක් බව ය. ලෝකයේ ජාතික පුස්තකාල සංකල්පය ස්ථාපිත කර ඇත්තේ කිසියම් රටකට ඉතා වැදගත්යැයි පිළිගන්නා ලේඛක ලේඛිකාවන්ගේ ලේඛන එකතු සංරක්ෂණය කිරීම ප්‍රමුඛ වගකීමක් ලෙස පවරමින් බව ද ඔහු පැවසුවේ ය.

මේ පොත් එකතුව මෙසේ පිළියෙල කිරීමේ වඩාත් වැදගත් ප්‍රතිඵලය වන්නේ වික්‍රමසිංහයන් කියවූ සෑම පොතක් ම කියවන අවස්ථාවේ ඔහු යොදා තිබෙන සජීවී කෙටි සටහන්වලින් ලැබෙන ආදර්ශයයි. එනම් පොතක් කියවීම, පොතක් පරිශීලනය සහ පොතක් ඵලදායී ව භාවිත කිරීම කෙසේ සිදු කළ යුතුදැයි යන ආකල්පය උකහා ගැනීමට අනාගත පරපුරට ලැබෙන සුවිශේෂී අවස්ථාවයි.


රාජ්‍ය අමාත්‍ය අශෝක ප්‍රියන්ත පැවසුවේ මාර්ටින් වික්‍රමසිංහයන් විරාගය, ගම්පෙරළිය, කලියුගය සහ යුගාන්තය වැනි නිර්මාණවලින් එළිදක්වන ලද සමාජ විපර්යාස වර්තමාන දරුවන්ගේ ඇසට ගෝචර නොවුණත් මා ඇතුළු වැඩිහිටි අයට එය හොඳින් ම අත්දකින්නට

ලැබුණු බව ය. එම යුගය පසුවී ඇති බැවින් ඒ පිළිබඳ යම් ඡායාවක් මවා ගැනීමට හැකි වන ලෙස මේ ලේඛන සුරක්ෂිත කර අනාගත පරපුරට භාර දීමේ වගකීම වර්තමානයේ අප සතු බවත් එහි සැඟවී ඇති සැබෑ බුද්ධිය සහ ඥානය උකහා ගන්නට ශ්‍රී ලාංකිකයන්ට ඉඩ සලසමින් නව තාක්ෂණික ලෝකයට යාමේ අභියෝගය භාරගෙන පුස්තකාල සේවා මණ්ඩලය මේ ඉටුකර ඇත්තේ ජාතික යුතුකමක් බවත් ඔහු ප්‍රකාශ කළේ ය.

ශ්‍රී ලංකාවේ සිංහල සමාජයේ බොහෝ දෙනා මාර්ටින් වික්‍රමසිංහයන්ගේ නවකතා, කෙටිකතා, සාහිත්‍ය විචාර, විද්‍යාත්මක ලේඛන, සමාජ සහ කලා විචාර, පුවත්පත් ලිපි සහ පර්යේෂණ ග්‍රන්ථ යන සෑම අංශයක ම පොත් කියවා ඔහුගේ ආභාසය වඩාත් පුළුල් ව ලබා ඇත. එය පසුගිය පරම්පරා කිහිපයක ම පොදු අත්දැකීමකි. විශේෂයෙන් මෙරට සිංහල කතා කරන ද්විතීයික අධ්‍යාපනය ලැබූ අයගේ කියවීමේ රුචිය, කලා සාහිත්‍ය රසඥතාව සහ විචාර බුද්ධිය පෝෂණය කිරීමට එදා මෙදා තුර අඛණ්ඩ දායකත්වයක් සැපයීමට ඔහුටත් ඔහුගේ කෘතිවලටත් හැකි විය. එවැනි පිළිගැනීමකට ලක්විය හැකි වෙනත් ලේඛකයකු හෝ ගත් කතුවරයකු නූතන ශ්‍රී ලංකාවේ බිහි වූ බවට නිදසුනක් සොයා ගැනීම අපහසු ය.

'පොත් කියවා පොත් ලිවීම: මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ ආදර්ශය' මැයෙන් එදින සමරු දේශනය පැවැත්වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ සම්මානිත මහාචාර්ය ජයදේව උයන්ගොඩ ය. මහාචාර්යවරයා: "ලංකාවේ යටත්විජිත නූතනත්වයේ වඩාත්ම කල්පවත්නා සබුද්ධික ගමන් මග එළිදරව් කර දුන් බුද්ධිමතා මාර්ටින් වික්‍රමසිංහ මහතා. මෙරට සමාජවාදී, කොමියුනිස්ට්වාදී, මාක්ස්වාදී පක්ෂ බිහිවන්නට පෙර 1910-20 අවධියේත් මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ චින්තනයේ එවැනි ලක්ෂණ සහිත අදහස් තිබූ බව ඔහුගේ නිර්මාණ පරික්ෂා කරන විට පෙනී යනවා. එසේ වන්නට ඇත්තේ ඔහු 1920 ගණන් වන විටත් බටහිර, යුරෝපීය සහ ඉන්දියානු සාහිත්‍ය කියවන්නට පුරුදු වී සිටි බැවින් විය යුතුයි.

**මේ පොත් එකක්වත් මග නොහැර කියවා ඇති බව ඔහු කියවන විට යෙදූ පැන්සල් සටහන් සාක්ෂි සපයනවා. විදේශීය රටවල සිට පැමිණෙන නැවියන් ලවා ද උපනිෂද් ග්‍රන්ථ, සංස්කෘත පත පොත, ඉංග්‍රීසි සහ වෙනත් භාෂාවලින් පළවූ ග්‍රන්ථ ගෙන්වා ගැනීමත් 'ඇපොතිකර්'පොත් සමාග මේ අයිතිකරු වන සුදු ජාතික මහත්මයකු සිය සාප්පුවේ විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබා තිබූ පොත් මිලට නොගෙන,සාප්පුවේ සිට ම කියවීමට අවසර ලබා ගැනීමත් ඔහුගේ කියවීමේ උනන්දුව පෙන්වන නිදසුන්.**




උසස් අධ්‍යාපනය නොලැබූ පුද්ගලයකු මෙතරම් නිවැරදි ව විද්‍යාත්මක චින්තනය, විද්‍යාත්මක විධික්‍රමය, මානව විද්‍යාත්මක විග්‍රහය වැනි දේවල් විශ්ලේෂණය කරමින් නිර්මාණ කිරීම විශ්වාස කළ නොහැක්කක්. බටහිර විද්‍යාත්මක දර්ශනවාද සේ ම මාක්ස්වාදී පතපොත ද ඔහු හදාරා තිබෙනවා. මාර්ටින් වික්‍රමසිංහ පොත් එකතුව හඳුනා ගැනීමෙන් අපට ඔහුගේ බුද්ධිමය තත්ත්වයේ වර්ධනය සිතියම්ගත කරන්න පුළුවන්. ඉංග්‍රීසි කියමනක් තියෙනවා Who are you is just by the friends you associate with (ඔබ කවුදැයි කියා නිශ්චය කරන්නට වන්නේ ඔබ ඇසුරු කරන යාලුවන් කවුදැයි කියා හඳුනාගෙන ය.) යනුවෙන්. ඒ නිසා අපට කියන්න පුළුවන් Who are you is just by the books you collect (ඔබ කවුදැයි කියා හඳුනා ගැනීමට තියෙන මග, ඔබ එකතු කරන පොත් මොනවාදැයි කියා හඳුනා ගැනීම) යනුවෙන්.

පොත් එකතුවක් අපේ චරිතයේ කැඩපතක්. මාර්ටින් වික්‍රමසිංහ නිර්මාණ එකතුව එතුමාගේ රසඥතාව, ශාස්ත්‍රීය නැඹුරුව, දාර්ශනික සහ සංකල්පීය සිතීම්වලට බලපෑ මූලාශ්‍ර, එතුමාගේ බුද්ධිමය රුචි අරුචිකම්, කලාත්මක පෞරුෂය, විචාර බුද්ධිය යන මේවා පිළිඹිඹු වන දර්පණතලයක් වගෙයි.

එතුමා ජාත්‍යන්තර පොත් කියවන්නට පටන් ගන්නේ අද වැනි දියුණු මුද්‍රණ තාක්ෂණයක් සහ පත පොත සුලබ නැති කාලයක වීමත් වයස අවුරුදු විසිගණන් වන්නට කළින් වීමත් සිතා ගත නොහැකි කාරණාවක්.

අපට ඔහුගේ බුද්ධිමය අනන්‍යතා හඳුනාගත හැකි වන්නේ එතුමා ලියූ පොත්පත්වලින් සහ එතුමා එකතු කළ පොත්වලින්. ඒ අනුව පෙනී යන විශේෂත්වය වන්නේ එතුමා වෘත්තීය වශයෙන් ග්‍රන්ථ කර්තෘවරයකු වූ බව. අප දන්නා තරමින් 'ලංකාවේ පළමු වැනි ඉතාම සාර්ථක වෘත්තීය පොත් ලියන්නා' ඔහු. සාමාන්‍යයෙන් වෘත්තීය ලේඛකයන් ලෙස සලකන්නේ පුවත්පත් කලාවේදීන්. එතුමා ජනමාධ්‍යවේදී වෘත්තිය සම්පූර්ණයෙන්ම නවත්වා ග්‍රන්ථකරණය වෘත්තිය බවට පත්කර ගත්තා. ඔහුගේ වෘත්තීය සාර්ථකත්වය තිබෙන්නේ ශාස්ත්‍රීය හා කලාත්මක වශයෙන් තම කෘතිවලින් පෙන්වූ ස්වීයත්වය සහ නව්‍යතාව රැකගෙන අඛණ්ඩ ව එය පවත්වා ගැනීමට දැක්වූ කැපවීම හා ශක්තිය මතයි.

වික්‍රමසිංහයන්ට පසු පැමිණි සාහිත්‍යධරයන්

බහුතර දෙනා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ අය. එහෙත් ඔවුන්ගේ ග්‍රන්ථකරණයේ විෂය ප්‍රදේශය සහ බලපෑම එවැනි අධ්‍යාපනයක් නොලැබූ වික්‍රමසිංහයන්ට වඩා පටු සහ සීමිත බව නිරීක්ෂණය වනවා. ඔහුගේ තවත් විශේෂත්වයක් වන්නේ නිර්මාණකරණයට අදාළ කර ගත් ගැඹුරු සහ විචාරාත්මක අවබෝධයයි. ඔහුගේ ශෛලිය ද ශාස්ත්‍රාලීය පුහුණුව ලැබූවන්ගේ ශෛලියක් නොවෙයි. එය ඊට වඩා නිදහස් වූවක්. ඒ නිදහස එතුමාට ලැබුණේ ඔහු සතු ස්වීයත්ව ගුණයෙන් සහ අව්‍යාජත්වයෙන් (Authenticity).

එතුමාගේ කෙටිකතා, නවකතා, කලා, සාහිත්‍ය සහ සමාජ විචාර සියල්ලක ම එතුමාටම සුවිශේෂ ලෝක දෘෂ්ටියක් (World View/ Personal Philosophy) ගැබ්වෙනවා. ඒ සියල්ල එකට බැඳ තබන හුය ඔහුගේ ලෝක දෘෂ්ටියයි. එය 1914දී පළ කළ ඔහුගේ මුල් ම කෘතිය වූ 'ලීලා' නවකතාවේ සිට 1973දී පළ කළ එතුමාගේ අවසාන කෘතිය වන 'බවතරණය' දක්වා වූ සියලු ෂානරවලට අයත් කෘතිවල අන්තර්ගත ව තිබෙනවා. එය ඔහු විසින් ම හඳුන්වා දී තිබෙන්නේ 'යථාර්ථ රීතිය' යනුවෙන්. එය මානුෂවාදී යථාර්ථ රීතියක් (Human Centric Realism) ලෙස හැඳින්විය හැකියි."









මේ නව පුස්තකාල පරිශ්‍රයේ වැදගත්කම පවතින්නේ තනි තනි පොත රැගෙන ගොස් බැලීමේ සාමාන්‍ය පුස්තකාල පිළිවෙත අනුගමනය නොකිරීම මත ය. එතැනට ගොස් එතැන සිට බලන්නට තිබෙන අවස්ථාව වැදගත් ලෙස ප්‍රයෝජනයට ගනිමින් සංරක්ෂිත පොත් එකතුවේ හිමිකරු වන ලේඛකයාගේ ම ඇසුරේ සිට ඔහු සමග ළඟ සංවාදයක් කිරීමට හැකි ස්ථානීය අගය ප්‍රයෝජනයට ගැනීම මත ය. ලේඛකයකු වශයෙන් එතුමාගේ අනන්‍යතාව හැඩගැසීමට බල පෑ බුද්ධිමය මූලාශ්‍ර සහ බලවේග මොනවාද? යන්න දැන ගැනීමට පහසු වන්නේ ද එවැනි පරිසරයකදී ය.

'මා දුටු මාර්ටින් වික්‍රමසිංහ: මාර්ටින් වික්‍රමසිංහ ජනලේඛන එකතුව සහ කෞතුකාගාරය' මැයෙන් මාර්ටින් වික්‍රමසිංහ භාරයේ පරිපාලන ලේකම් සහ ප්‍රවීන ලේඛක දයාපාල ජයනෙත්ති විසින් විශේෂ ආරාධිත දේශනයක් ද පවත්වන ලදී. ඔහු: "වයස අවුරුදු 17 සිට මාර්ටින් වික්‍රමසිංහයන් මේ පොත් ප්‍රවේශම් කළේ දරුවන් රක්ෂා කරන ආකාරයේ සෙනෙහසකින්. මේ පොත් එකක්වත් මග නොහැර කියවා ඇති බව ඔහු කියවන විට යෙදූ පැන්සල් සටහන් සාක්ෂි සපයනවා. විදේශීය රටවල සිට පැමිණෙන නැවියන් ලවා ද උපනිෂද් ග්‍රන්ථ, සංස්කෘත පත පොත, ඉංග්‍රීසි සහ වෙනත් භාෂාවලින් පළවූ ග්‍රන්ථ ගෙන්වා ගැනීමත් 'ඇපොතිකරි'පොත් සමාගමේ අයිතිකරු වන සුදු ජාතික මහත්මයකු සිය සාප්පුවේ විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබා තිබූ පොත් මිලට නොගෙන, සාප්පුවේ සිට ම කියවීමට අවසර ලබා ගැනීමත් ඔහුගේ කියවීමේ උනන්දුව පෙන්වන නිදසුන්. උසස් විදුහලකින් අධ්‍යාපනය නොලද ඔහු දැනුම ලබාගෙන ඇත්තේ අත්දැකීමෙන් සහ ආශාවෙන් පොත් කියවීමෙන්. එසේ එක් රැස් කළ මහාර්ඝ සම්පත මෙසේ ජාතික පුස්තකාලයේ සංරක්ෂණය කරන්නට ලැබීම වාසනාවක්."

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මෙසේ ස්ථාපිත කෙරුණේ මීට සිය වසකට පමණ එපිට පටන් කොග්ගල නිවසේ 'කන්තෝරු කාමරය' නමින් හැඳින්වූ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ පොත්ගුලයි. 1990දී එහි කොටසක් ජාතික පුස්තකාලයට රැගෙන ඒමෙන් ජාතික පුස්තකාලයේ ආකර්ෂණය සහ වටිනාකම වර්ධනය වූ අතර මෙවර සිදුවූ සංරක්ෂණ සහ ප්‍රතිෂ්ඨාපන කාර්යය නිසා එහි වටිනාකම මෙන්ම අන්තර්ගතය වඩාවර්ධනය වූ බව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ පත්මා බණ්ඩාරනායක පෙන්වා දුන්නා ය. මෙය සිය ආයතනයට ලැබුණු සුවිශේෂ බුද්ධිමය එකතුවක් වන අතර ඥාන නිධානයක් බඳු නිර්මාණ ගබඩාවක් බව ද ඇය පැවැසුවා ය.

මෙහිදී සාකච්ඡාවට බඳුන් වූ කරුණු අනුව එතුමාගේ කෘති පිළිබඳ ප්‍රබල විචාරාත්මක අධ්‍යයනයක් මෙතෙක් සිදු වී නොමැති අඩුව පෙනී යයි. 'මාර්ටින් වික්‍රමසිංහ නව ජන ලේඛන එකතුව සහ කෞතුකාගාරය' විවෘත වීම ඒ අඩුව පිරවීම සඳහා ලේඛක විචාරක පාර්ශ්ව උනන්දු කරන ප්‍රබල උත්තේජකයක් වනු ඇත. තව ද මේ ලේඛන සහ අනෙකුත් උපකරණ පවත්නා තත්ත්වයෙන් තව චිරාත් කාලයක් පවත්වා ගැනීම නව භාරකරුවන්ගේ දැඩි වගකීමකි. ඒවාට සුළු හෝ හානියක් නොවන පරිදි පරිශීලනය කිරීම පාඨක සහ ශාස්ත්‍රාභිලාෂී පරිශීලක සැමගේ ප්‍රබල යුතුකමක් මෙන්ම වගකීමකි.

**ඡායාරූප - චමෝද් පෙරේරා**

# සාහිත්‍යයට පැලඳි මල්දම

කපිල එම්. ගමගේ

සාහිත්‍ය පරිවර්තනයක් යනු වෙනත් සංස්කෘතියකට, වෙනස් භූගෝලීය අවකාශයකට පිවිසෙන්නට ලබාදෙන භාෂාත්මක කවුළුවකි. එය යම් ආකාරයකට භාෂා බාධකය ජය ගැනීමකි. එම නිසා නිරන්තරයෙන් පාඨකයාගේ පරිකල්පනීය අවකාශය මෙන් ම අත්දැකීම් කෝෂ්ඨාගාරය ද ජීවනාවබෝධය ද එමගින් පුළුල් වේ. එහෙත් පරිවර්තන කාර්යය යනු අභියෝගාත්මක වූවකි. එයට හුදු භාෂා අවබෝධය හෝ සාක්ෂරතාව පමණක් ප්‍රමාණවත් නොවේ. මුල්කෘතියේ අඩංගු සමාජ පරිසරය ගැන ද ප්‍රමාණාත්මක අවබෝධයක් අවශ්‍ය වේ. මන්ද කිසියම් භාෂාත්මක ප්‍රකාශනයක අරුත් ජනනය වන්නේ එය භාවිත වන සමාජ සංස්කෘතික ගෝලයේ වීම නිසා ය. සමකාලීන පරිවර්තනවලින් විවිධ ජීවන රටා පිළිබඳ නව අවබෝධයක් නිවැරදි ව භුක්තිවිඳීමට ලැබෙන්නේ එවිට ය. එහෙත් වර්තමාන ශ්‍රී ලාංකික පරිවර්තන සාහිත්‍යයේ එය එසේ වෙනවාදැයි යන්න විවාදපන්න කාරණයකි. ශ්‍රී ලංකාවේ ඇතැම් පරිවර්තකයන් කෘති පරිවර්තනය කරන වේගය අනුව එය එසේ කළ හැකි ද යන්න ගැටලුසහගත වේ. ඇතැම් පරිවර්තන එහි මුල්කෘතිය හා සමග සසඳමින් කියවන විට මේ සැකය තවදුරටත් සාධාරණීකරණය වේ. ඇතැම් විට ඒ පරිවර්තන සිදුකොට ඇත්තේ අන්තර්ජාලයේ භාෂා පරිවර්තක යෙදුම් භාවිත කරමින් බව පදානුගත අර්ථ විමසීමේදී පැහැදිලි වේ. මෙය පරිවර්තන සාහිත්‍යය කෙරෙහි දිගුකාලීන ව අනිටු පලවිපාක ඇතිකරන්නක් විය හැකි ය.

ශ්‍රී ලාංකික පාඨක සමාජය පරිවර්තන සාහිත්‍යය කියූ සැනින් අත තබන්නේ විදෙස් සාහිත්‍යකරුවන්ගේ කෘති වෙත ය. රුසියානු, ප්‍රංශ, චීන, ඉංග්‍රීසි, ජපන්, ඉන්දීය, ජර්මානු වැනි සාහිත්‍යකරුවන්ගේ කෘතිවලට මෙන් ම ලතින් ඇමරිකානු කලාපයේ කතුවරුන්ගේ කෘති කෙරෙහි පාඨක අවධානය දශක ගණනාවක් තිස්සේ බෙහෙවින් යොමු වී තිබේ. එහෙත් සියවස් ගණනාවක් ජීවත්වන ශ්‍රී ලාංකික දෙමළ හා මුස්ලිම් කතුවරුන්. කතුවරියන් විසින් විරචිත සාහිත්‍යය ගැන අපේ අවධානය යොමු වී ඇත්තේ අල්ප වශයෙනි. එක ම භාෂාවක් පරිහරණය කරන ජනවාර්ගික කණ්ඩායම් දෙකක් වන මේ කණ්ඩායම් අතර කෙමෙන් වැඩෙන අපූරු සාහිත්‍යයක් වෙයි. විශේෂයෙන් වර්ග සාංහාරික බිහිසුණු යුද්ධයකින් පසු ව මේ ජනවාර්ගික කණ්ඩායම් දෙක අතර පශ්චාත් යුද සාහිත්‍යයක් ද කෙමෙන් වර්ධනය වේ. මේ සාහිත්‍ය ප්‍රකාශ ඔවුන්ගේ ජීවන සංස්කෘතියට මෙන් ම වර්තමානයේ ඔවුන්ගේ ජීවන ගැටලු තේරුම් ගැනීමට ගැඹුරු කැනීමක් කර දෙයි. අප බොහෝ විට මේ ජනවාර්ගික කණ්ඩායම්වල චර්යා හා සංස්කෘතික භාවිත පිළිබඳ විවේචනය කරන්නේ ඒවායේ ගැඹුරු ඓතිහාසික පදනම ගැන නොදැන මතුපිටින් ඒවා ස්පර්ශ කිරීමෙන් පමණි. එය නිවැරදි වටහා ගැනීමකට බාධා පමුණුවයි.

දමිළ භාෂාවෙන් සිංහල බසට සාහිත්‍ය කෘති පරිවර්තනය කිරීමට දැන් දැන් වැඩි උනන්දුවක් ඇති වී තිබීම පෙර කියූ රික්තය යම් ආකාරයකට පුරවාලීමකි. සම්මානලාභී පරිවර්තකයකු වන ජී. ජී. සරත් ආනන්ද මෙහිදී කැපී පෙනෙන සමාජ වගකීමක් ඉටු කරන සාහිත්‍යකරුවෙකි. ඔහු මේ වන විට ශ්‍රී ලාංකික දෙමළ භාෂික සාහිත්‍යකරුවන්ගේ කෘති ගණනාවක් හා ශාස්ත්‍රීය කෘති කිහිපයක් ද සිංහල බසට පරිවර්තනය කර තිබේ. ඔහුගේ නවතම කෘතිය වන්නේ 'මල්දම් පලඳවන්නෝ' නම් වූ දෙමළ කෙටිකතා පරිවර්තන කෘතියයි. ශ්‍රී ලාංකික දෙමළ භාෂිත සාහිත්‍යකරුවන් දස දෙනකුගේ කෙටිකතා 10ක් මෙයට සංගෘහිත කර තිබේ. මේ කෙටිකතා සංග්‍රහයේ එන සුවිශේෂ ලක්ෂණ කිහිපයක් වෙයි.

මූලික ව ම ඔහු දෙමළ රචකයන් හා මුස්ලිම් රචකයන් යන ජනවර්ග නියෝජනය කරමින් මෙන් ම එම රචකයන් පදිංචි භූගෝලීය ප්‍රදේශ සලකා බලමින් ඒ සෑම ප්‍රදේශයක් ම නියෝජනය වන ආකාරයෙන් කෙටිකතා තෝරා ගනී. ශ්‍රී ලංකාවේ උතුරු පළාත, නැගෙනහිර පළාත, දකුණු පළාත, මධ්‍ය කඳුකරය යන ප්‍රදේශවලට බරතැබීම අගය කළ යුත්තකි. වැදගත් ම කාරණය වන්නේ කතුවරුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය (Gender Equality) ගැන උවමනාවෙන් සිය අවධානය යොමු කිරීමයි.

සරත්ගේ මේ පරිවර්තන කෘතියේ දක්නට ලැබෙන තවත් විශේෂ කාරණයක් වන්නේ ආන්තික ජන කණ්ඩායම් ඔවුන්ගේ සමාජ හා වෘත්තීය ජීවිතයේ මෙන් ම ගෘහ ජීවිතයේ මුහුණපාන විවිධ ගැටලු මේ කෙටිකතාවලින් සිංහල පාඨක සමාජයට නිරාවරණය කර දීමයි. කේ. ආර්. ඩේවිඩ්ගේ 'කඳුළු නිමවෙන තුරු' කෙටිකතාවෙන් දරිද්‍රතාවෙන්



පෙළෙන දරුවකුගේ හැඟීම් නිරාවරණය කරන්නේ අප තුළ ද දරුණු සසල වීමක් ඇති කරමිනි. එම කෙටිකතාවේ ගුරුවරයා හා කේසවන් නම් දරුවා අතර ඇතිවන දෙබස මෙහි කොඳුනාරටියයි. කෙටිකතාව අවසානයේ දරුවා පවසන දෙය සමස්තාර්ථය එකට කුළුගැන්වීමකි. "කඳුළු ඉවර වුණා ම අම්මට අඬන්න විදියක් නෑ.. ඒකයි සර්". මෙහි එන තවත් කතාවක ද වර්ග සාංහාරික යුද්ධයේ විෂම ප්‍රතිඵලයක් ලෙස දරුවන් මුහුණදුන් බේදනීය අත්දැකීමක් අප වෙත ගෙන එයි. ආර්. රාජේස්කණ්ණන්ගේ 'තැලෙන මල් කැකුළු' කෙටිකතාව තනිකර ම යුද්ධයේ ගොදුරු බිමක් බවට පත්වූ ගමක දරුවන් මුහුණපාන අත්දැකීමක් පදනම් කරගත්තකි. සිය නැගනියගේ පාසැල් අධ්‍යාපනය වෙනුවෙන් හා ෂෙල් වෙඩි වැදී ආබාධිත වූ මව වෙනුවෙන් සිය අධ්‍යාපනය කැප කළ දරුවකු මෙහි කේන්ද්‍රීය චරිතයයි. සාරංගන් බස්රථවලට නැග රටකජු අලෙවි කිරීමෙන් සිය පවුල රැක ගැනීමට උත්සාහ කරයි. "රටකජු බඳිනවා. අපි ආයෙත් ගෙදර එනකම් බලාගෙන ඉන්නවා." සිය මව ගැන සාරංගන් පවසන මේ දේ යුද්ධයෙන් පීඩාවට පත් උතුරේ පවුලක සමස්තාර්ථය නොවන්නේ ද?

දකුණේ මුස්ලිම් ජනතාවගේ ජීවන අත්දැකීමක් අනුභූතිය ලෙස ගන්නා දික්වැල්ලේ කමාල්ගේ "ගමනක ඇරඹුම" කෙටිකතාව දේශීය ව හා විදේශීය ව ලිංගික සූරාකෑමට උපක්‍රමික ව ලක්වන මුස්ලිම් තරුණියන් ගැන ලියැවුණකි. පාදක චරිතය වන සමීනා විගමනික සේවිකාවක ලෙස විදෙස්ගත වන්නේ සිය පවුලේ ආර්ථික ගැටලුවලට විසඳුමක් පතා ය. එහෙත් ඇය ලිංගික සූරාකෑමට ලක්වීම ඇරඹෙන්නේ සිය රැකියා ඒජන්සිකරුවා අතිනි. සූරාකෑමට ජාතිය, ආගම, කුලය හෝ වෙනත් කිසිවක් අදාළ හේතුවක් නොවේ. එක ම හේතුව සමාජ පන්තියයි.

බාලරංජනී ෂර්මාගේ "මැලවෙන තේ දලු අතර" මධ්‍ය කඳුකරයේ වතු ආශ්‍රිත දමිළ ජනතාවගේ පීඩා පදනම් කර ගත්තකි. දරුවකුගේ කේන්ද්‍රීය දෘෂ්ටිකෝණයෙන් ඇය සිය කතාව ගොඩනගයි. සමාගම් අත්පත්, තේ ආර්ථිකය බිඳවැටීමත් එය හේතුකොට ගෙන වතුකරයේ පවුලක් මුහුණදෙන ආර්ථික පීඩාවත් බාලරංජනී නිර්මාණාත්මක ව ගොඩ නගන ආකාරය අපූරු ය. චන්ද්‍රකාන්තා මුරුගානන්දන්, නයීමා සිද්දික් මේ කෘතියේ එන අනෙක් කාන්තා ලේඛිකාවන් දෙදෙනා ය. චන්ද්‍රකාන්තා උතුර නියෝජනය කරන අතර නයීමා මැදරට මුස්ලිම් ප්‍රජාව නියෝජනය කරයි. නයීමාගේ කෙටිකතාවේ ප්‍රස්තුතය වන්නේ මුස්ලිම් ප්‍රජාවගේ 'දෑවැද්ද' පිළිබඳ ගැටලුවයි. මුස්ලිම් කාන්තාව ජීවිතයේ කිසියම් ම මොහොතක හෝ මේ ආචීර්ණ කල්පීය සංස්කෘතික බරට කරගැසිය යුතු බව ඇය ඉඟි කරයි. චන්ද්‍රකාන්තාගේ නිර්මාණය සෘජු ව ම උතුරේ සාමාන්‍ය ජනතාව යුද වින්දිතයන් ලෙස මුහුණපාන අසාධාරණ ජීවිතය නියෝජනය කරයි. සියලු සාමාජිකයන් අහිමි ව, මව සමග අනාථ කඳවුරක වෙසෙන මයුරන්ගේ එක ම ඥාතියා වන්නේ අම්මා පමණි. ඇය ද ෂෙල් වෙඩි ප්‍රහාරයක් මැද ජීවිතය හැර යයි. මයුරන්ගේ අනාගතය කුමන දිශානතියකට හැරවේ ද? මේ අවිනිශ්චිත මොහොතේ එය කාට නම් කිව හැකි ද?

ජී. ජී. සරත් ආනන්ද පරිවර්තනය කළ මේ කෘතියේ උත්ප්‍රාසජනක කෙටිකතාවක් එයි. එය සම්පූර්ණයෙන් ම සෘජු දේශපාලන කතාවක් වන අතර උමා වරදරාජන් විසින් රචිත 'මල්දම් පලඳවන්නෝ' ඔස්සේ ඔහු ශ්‍රී ලාංකික පුරවැසියා ඉදිරියේ දර්පණයක් අල්ලා සිටී. දමිළ සමාජයේ දෙවියන්ට මල්දම් පැලඳවීම ඔවුන්ගේ සංස්කෘතියේ අංගයකි. මේ දේවත්වය තමන්ට ආරෝපණය කර ගැනීම සඳහා එය දැන් දේශපාලකයන් වෙත රූපාන්තරණය වී තිබේ. එය සංකේතාත්මක බලාරෝපණයකි. නිදහසින් පසු දශක 7කට වැඩිකාලයක් ඡන්දදායකයා හුදු මල්මාලා පලඳවන්නකු බවට පමණක් පත් ව සිටින ආකාරය තියුණු උත්ප්‍රාසයක් ජනිත කරමින් පවසයි. මැතිවරණ සමයක පුරවැසියා තමන්ගේ නියෝජිතයා තෝරා ගැනීම සඳහා ඔහුට හෝ ඇයට මල්මාලා පලඳවන අතර



ජී. ජී. සරත් ආනන්ද

**සරත්ගේ පරිවර්තන කෘතියේ දක්නට ලැබෙන තවත් විශේෂ කාරණයක් වන්නේ ආන්තික ජන කණ්ඩායම් ඔවුන්ගේ සමාජ හා වෘත්තීය ජීවිතයේ මෙන් ම ගෘහ ජීවිතයේ මුහුණපාන විවිධ ගැටලු මේ කෙටිකතාවලින් සිංහල පාඨක සමාජයට නිරාවරණය කර දීමයි.**

ඉන් අනතුරු ව ධුරකාලය පුරා ම අප සිදු කරන්නේ මල්මාලා පැලඳවීම පමණක් නොවේ ද? අපි, අප විසින් පත්කරනු ලබන නියෝජිතයා රාජ්‍යත්වයට ඔසවා තබා අනිසි බල ආරෝපණයක් කර අත පිසදාගන්නෝ නොවෙමු ද? උමා වරදරාජන් අපට ම අපගේ දේශපාලන නිරුවත දැක සිනාවෙන්නට හෝ හඬන්නට හෝ ඉඩ සලසා දෙන්නේ එලෙසිනි. කෙටිකතාවේ සෙංගා මුහුණදෙන උභතෝකෝටිකය නම් එයයි.

මායා යථාර්ථවාදී (Magic Realism) රීතියෙන් ලියැවුණු අපූරු කෙටිකතාවක් මෙහි අන්තර්ගත ය. එම්. රිෂාන් ෂෙරීෆ් විසින් රචිත 'කාක තර්ජිත හිස' කෙටිකතාවේ කිසි ම තැනක සංකේතීය නමක් සඳහන් නොවන තරුණයාගේ හිසට කපුටන් කොටන්නේ ඇයි?. ඒ හිසෙහි කපුටන්ට තිබූ විශේෂත්වය කුමක් ද? කැළයේ අතරමංවී සිටින දරුවකු නිරුපද්‍රිත ව නිවසට ගොස් ඇරලවීමට තරම් වගකීම් සහගත පුරවැසියකු වන ඔහුට කපුටන් කොටන්නේ ඇයි?. යන්ත්‍රමන්ත්‍ර ගුරුකම්වලින් හා ඇස්බැන්දුම්වලින් කපුටන්ගේ කෙටීම නතර නොවන්නේ ඇයි? කෙටිකතාවේ යටිපෙළ යථාර්ථය අප ස්පර්ශ කර ගත යුතු ය. එවිට අපට අපේ සමාජයේ කපුටන් කවුද? පුරවැසියන් කවුද? යන්න වටහා ගත හැකි වේ.

ජී. ජී. සරත් ආනන්ද පරිවර්තකයා නිහඬ ව ඉටු කරන මේ සමාජ වගකීම මහහැර යා නොහැකි ය. තිස් අවුරුදු යුද්ධයකින් පසුව දැවැන්ත මානසික හා භෞතික බේදවාචකයකට මුහුණ දී සිටින්නන් වුව ද අප තවමත් ජාතීන් අතර සමගියට, සංහිඳියාවට ජාතිය හා ආගම ඉදිරියට දමා බාධා පමුණුවන්නන් මිසෙක උගත් දැනුවත් පුරවැසියන් නොවීම කරවර නම් අවාසනාවක් ද? නැතිනම් එය දේශපාලනික නිර්මිතයක් ද?. දූපතෙන් ඔබ්බෙහි සාහිත්‍ය පරිවර්තන ගැන ඇති උනන්දුව අපේ දූපතේ ම අන් බසක් වහරන, ජන කණ්ඩායම්වල ආභ්‍යන්තරික වේදනාවලට කන් නොදෙන්නේ ඇයි ?. සාහිත්‍යය එය මනා ආලෝකයක් ගලා එන කවුලුවකි. සරත් වැනි පරිවර්තකයන් සිදුකරන්නේ ඒ කවුලුව විවිධ අපහසුතා මැද විවර කරදීමයි. ඔහුගේ නිහඬ ඉල්ලීම වන්නේ අඩු ම තරමින් මේ කවුළුවෙන්වත් අනෙකා දෙස බලා ඔහු හෝ ඇය තේරුම් ගැනීමට උත්සාහ කරන ලෙසයි. එබැවින් මල්දම් පැලඳවිය යුත්තේ වගකීම් විරහිත දේශපාලකයන්ගේ ගෙල මත නොව ජී. ජී සරත් ආනන්දලා වැනි වගකීම් සහගත පුරවැසියන්ගේ ගෙල මත බව සටහන් කරමි.



# පය බරවායට පිටිකර බෙහෙත් බැඳීම

වර්නන් ගුණසේකර

නික්ම යන පරම්පරාවකගේ මූලිකත්වයෙන් මීට දස වසරකට පෙර සිදුවූ විස්සයි20 ලෝක කුසලාන ජයග්‍රාහී මෙහෙයුමෙන් පසුව ශ්‍රී ලංකාවේ ඊළඟ ක්‍රිකට් ක්‍රීඩක අස්වැන්නට රටට තවත් කුසලානයක් ගෙන එමින් ඔවුන්ගේ නාමය ඉතිහාසයේ ලියවීමට අවස්ථාවක් උදා වූයේ මෙවර විස්සයි20 ලෝක කුසලාන තරගාවලියෙනි. එහෙත් එම අවස්ථාව ගිළිහී යියේ අවාසනාවන්ත අයුරිනි.

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පුරාවෘත්ත වන කුමාර් සංගක්කාර, මහේල ජයවර්ධන හා ලසිත් මාලිංග ජනප්‍රිය ඉන්දියා කණ්ඩායමට එරෙහි ව බංග්ලාදේශයේ පැවති විස්සයි20 ලෝක කුසලාන අවසාන තරගය උඩුයටිකුරු කළේ 2014 වසරේදී ය. 2024 වසරේ ඇමරිකාවේ හා බටහිර ඉන්දීය කොදෙව් දූපත්හි පැවති විස්සයි20 ලෝක කුසලාන තරගාවලියට සහභාගි වූ වනිඳු හසරංග ප්‍රමුඛ ශ්‍රී ලංකා කණ්ඩායම මීට දස වසරකට පෙර සිටි ශ්‍රී ලංකා කණ්ඩායම තරම් ශක්තිමත් නොවූව ද ඔවුන් සැලකිය යුතු තරමේ දක්ෂතාවක් ප්‍රදර්ශනය කරමින් තරගාවලියේ බොහෝදුරක් ඉදිරියට යනු ඇතැයි ශ්‍රී ලාංකික ක්‍රීඩාලෝලීහු විශ්වාස කළහ. පසුගිය විස්සයි20 ලෝක කුසලාන තරගාවලියෙහි දිස්වූ ශ්‍රී ලංකාවේ දුර්වල ක්‍රීඩාව පසෙක තැබූ ඔවුහු මෙවර තරගාවලියේදී සටන්කාමී ක්‍රීඩාවක් ඔවුන්ගේ ආදරණීය කණ්ඩායමෙන් අපේක්ෂා කළහ.

ශ්‍රී ලංකාව කලක් විස්සයි20 ලෝක කුසලාන තරග බිමේ බලකණුවක් බවට පත් ව සිටියේ ය. ඒ, ඔවුන් 2014 වසරේදී කුසලානය දිනා ගැනීමට පෙර 2009 තරගාවලියේ අවසාන තරගයට, 2010 වසරේදී අවසන් පූර්ව වටයට සහ 2012 වසරේදී අවසාන තරගයට ද පිවිසීම නිසා ය.

එහෙත් 2014 වසරේ අප්‍රේල් මාසයේදී ඉන්දියාව අභිභවා ලබා ගත් ඒ කඩුලු හයක ඓතිහාසික ජයග්‍රහණයෙන් පසුව මේ තරගාවලියේ පිළිමලුන් පිටු දැකීමේ වටයට සුදුසුකම් ලබා ගැනීමට ශ්‍රී ලංකාව මෙතෙක් අසමත් ව තිබේ. දස වසරක ඒ ඉඩෝරය මේ වසරේදී අවසන් වනු ඇතැයි බොහෝ දෙනාගේ පැතුම වී තිබිණි.

ශ්‍රී ලංකාව මෙවර තරගාවලියේ ඇතුළත් ව සිටියේ දකුණු අප්‍රිකාව, බංග්ලාදේශය, නේපාලය හා නෙදර්ලන්තය ඇතුළු කොටසට ය. නායක වනිඳු හසරංගට අවශ්‍ය පරිදි ලැබුණු කණ්ඩායම පන්දු ප්‍රහාරයේ ශක්තිමත් වූව ද එය ක්‍රීඩාවේ අනෙකුත් අංශ සියල්ල ආවරණය වූ සංචිතයක් ද විය. 2014 කුසලාන ජයග්‍රාහී කණ්ඩායමේ ප්‍රබල සාමාජිකයකු ව සිටි ඉතාමත් පළපුරුදු ඇන්ජලෝ මැතිව්ස්ගේ සහභාගිත්වය ද වනිඳුට ලැබී තිබිණි.

මෙවර විස්සයි20 තරගාවලියේ සාර්ථකත්වයක් ලබා ගැනීමට නම් ශ්‍රී ලංකාවට අවශ්‍ය ව තිබුණේ වේග ශක්තිය පමණයි. ශ්‍රී ලංකා කණ්ඩායම තරගාවලියේ සාර්ථක ආරම්භයක් ලබාගෙන ඒ ගැම්මෙන් ම ඉදිරියට ගියා නම් ඔවුන්ට ජයකණුව පෙනෙන තෙක් මානයට යාමට හොඳට ම අවස්ථාව තිබිණි. එහෙත් සිදුවූයේ කුමක් ද? කණ්ඩායමේ පිතිකරණය කඩා වැටී මූලික වටයෙන් ම තරගාවලියෙන් ඉවතට විසිවීම ය.

නිව්යෝක් නුවර පැවති ආරම්භක තරගයේදී දකුණු අප්‍රිකාව හමුවේ ලකුණු

77ක වාර්තාගත අඩු ලකුණු සංඛ්‍යාවකට දැවී ගිය ශ්‍රී ලංකාව ඩලස් නගරයේ පැවති දෙවැනි තරගයේදී බංග්ලාදේශයට එරෙහි ව අසරණ වෙමින් කඩුලු 9කට 124ක මුළු ලකුණු සංඛ්‍යාවකට සීමා විය. ඔවුන් නෙදර්ලන්තයට එරෙහි ව පැවති අවසාන තරගය ලකුණු 83කින් ජයග්‍රහණය කළ ද ශ්‍රී ලංකාවට ඒ වන විට තරගාවලියේ 'සුපිරි අට' වටයේ දොරටු වැසී තිබුණේ ඊට කලින් නේපාලය සමග තරගය වර්ෂාවට සේදී යාම හේතුවෙනි.

මෙවැනි ලෝක වේදිකාවක ලකුණු 77ක් හා ලකුණු 124ක් පමණක් ලබා ගත් පිතිහරඹයේ අසාර්ථක කණ්ඩායමකට තරගාවලියේ සුපිරි කණ්ඩායම් අටෙන් එකක් වීමට අයිතියක් හෝ සුදුසුකමක් කොහෙත් ම නැත. මෙවර විස්සයි20 ලෝක කුසලානය වෙනුවෙන් ශ්‍රී ලංකා කණ්ඩායම ඇමරිකාවට පා තැබුවේ ඔවුන්ගේ පළමු තරගයට දින දහයකට පමණ පෙර ය. තරගාවලියට පෙර නෙදර්ලන්තය හා අයර්ලන්තය සමග පෙරහුරු තරග දෙකක් ක්‍රීඩා කළ ශ්‍රී ලංකා ක්‍රීඩකයන් ඊට පෙර උතුරු කැරලයිනා ප්‍රදේශයේ පුහුණු කඳවුරකට ද සහභාගි වූයේ තරගාවලියට හොඳ සූදානමක් ලබා ගනිමිනි.

එහෙත් අවසානයේ ශ්‍රී ලංකා ක්‍රිකට් ලෝලීන්ට උද්‍යෝග පාඨ කියා කෑගසමින් විනෝද වීමට තරම් ලෝක කුසලාන තරගාවලියක් ඉතිරි වූයේ නැත. මෙවර ලෝක කුසලාන තරගාවලියේ ශ්‍රී ලාංකික ආරම්භය ලජ්ජාවට පත් වූවක් විය. විස්සයි20 ලෝක කුසලානයේ තරග වදින ශ්‍රී ලංකා කණ්ඩායමේ ක්‍රීඩාව දැක ගැනීම පිණිස මැදියම් රාත්‍රිය වන තුරු අවදි ව සිටිමින් සහ අලුයම නැගිටිමින් නිදිමැරූ ක්‍රීඩා ලෝලීන්ට අන්තිමට ඉතිරි වූයේ දැඩි කලකිරීමක් පමණකි.

ශ්‍රී ලංකා පිතිකරුවන් තුළ උද්‍යෝගිමත් ක්‍රියාකාරී බලයක් තිබුණේ නැත. ඔවුන්ගේ පිතිකරණය නවීන විස්සයි20 ක්‍රිකට් මට්ටමට පැමිණ තිබුණු බවක් දිස් නොවිණි. ලකුණු 77ක් හා 124ක් වැනි කුඩා මුළු ලකුණු සංඛ්‍යාවකට දැවී යාම ඊට සාක්ෂි දෙයි.

2014 වසරේ විස්සයි20 ලෝක කුසලාන ජයග්‍රහණයෙන් පසුව මතකයේ තබා ගැනීමට අපහසු තරමේ නායකයෝ හා පුහුණුකරුවෝ ගණනාවක් ම ශ්‍රී ලංකා කණ්ඩායමේ සිටියහ. සෑම පරාජිත තරගාවලියක ට ම පසුව දක්නට ලැබුණේ රෝද පුටු තරගයක් මෙන් නායකයන් හා පුහුණුකරුවන් මෙන් ම තේරීම් නිලධාරීන් ද දොස් අසමින් මාරු වී යාම ය. එහි උග්‍රතම අවස්ථාව වී තිබෙන්නේ ජාතික ක්‍රීඩකයන් රූපවාහිනිය ඉදිරියේ ජාතියෙන් සමාව අයැද සිටීම ය. ඊළඟ වතාවේ මීට වඩා හොඳින් ක්‍රීඩා කරන බවට දිවුරන ඔවුන් නැවත කරන්නේ ද ඒ වැරදි ම ය. ඉක්බිති නැවත ඔවුහු ක්‍රීඩා ලෝලීන්ගෙන් සමාව ඉල්ලා සිටිති. තරගවලි පරාජය වී සමාව ඉල්ලීමේ චක්‍රය දැන් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ මෝස්තරයක් බවට පත් ව තිබෙන සෙයකි.

**සෑම ප්‍රධාන තරගාවලියකින් ම පසුව නායකයන් හා පුහුණුකරුවන්ට දොස් පවරමින් ඔවුන් මාරු කරන රටාවෙන් කෙනකුට තේරුම් යන්නේ ප්‍රශ්න තිබෙන්නේ පිටියේ හෝ නායකත්වයේ නොවන බව ය. ලෝක කුසලාන තරගාවලි සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය යවන කණ්ඩායම් දිගින් දිගට ම දුර්වල වීමේ වගකීම ක්‍රිකට් බලධාරීන් මත පැටවෙන්නේ නිරායාසයෙනි.**

ශ්‍රී ලංකා කණ්ඩායම අසාර්ථක ක්‍රිකට් ක්‍රීඩාවකින් පසුව සමාව අයදිනවාට වඩා කළ යුතු ව තිබුණේ පෙර වැරදි නිවැරදි කරගෙන ඉදිරියට යාම ය. සටන්කාමී ක්‍රීඩාවකින් පසුව ලබන තියුණු පරාජයක් පිළිබඳ සමාව ඉල්ලීමක් අවශ්‍ය වන්නේ නැත. එහෙත් ශ්‍රී ලංකා කණ්ඩායම ඔවුන්ගේ අඩු ම මුළු ලකුණු සංඛ්‍යාවට දකුණු අප්‍රිකාව වෙතින් දැවී යාමෙන් පසුවත් පිතිකරුවන් පාඩමක් ඉගෙන ගෙන තිබුණේ නැත. ක්ෂණික ක්‍රිකට් ක්‍රීඩාවේ දැනුවත් වීමේ අඩුවක් පිතිකරුවන්ගෙන් ප්‍රදර්ශනය විය.

ක්‍රිකට් තරග කෙරෙහි ශ්‍රී ලාංකික ක්‍රීඩා ලෝලීන්ගේ තිබෙන කොන්දේසි විරහිත ආදරය නිසා කොතරම් තරග පැරදුණ ද ඔවුහු ශ්‍රී ලංකා කණ්ඩායමේ ඊළඟ තරගය නැරඹීමට ද රොද බැඳගෙන පැමිණෙති. එහෙත් පසුගිය වසර දහයක් තිස්සේ ශ්‍රී ලංකා කණ්ඩායම ලැබූ සෑම පරාජයකින් ම පසුව ක්‍රීඩා ලෝලීන්ගේ දෝස්මුරය ශ්‍රී ලංකා ක්‍රිකට් බලධාරීන් වෙත යොමු වීම නොවැළැක්විය හැකි කරුණක් බවට පත් ව තිබේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා හිටපු ක්‍රීඩා ඇමතිවරයා අතර මෑතකදී ඇතිවූ බල අරගලය 'ඇවිලෙන ගින්නට පිදුරු දැමීමක්' වී තිබේ.

මේ දේශපාලන ඇඟිලිගැසීම් හේතුවෙන් ශ්‍රී ලංකාව පසුගියදා ජගත් ක්‍රිකට් කවුන්සලයේ තහනමකට ලක්වූවා පමණක් නොව මේ වසර මුල ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත ව තිබූ වටිනා තරගාවලියක් වන වයස අවුරුදු 19න් පහළ ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ සත්කාරකත්වය ද ශ්‍රී ලංකාවෙන් උදුරාගෙන එය දකුණු අප්‍රිකාවට පිරිනැමිණි.

සෑම ප්‍රධාන තරගාවලියකින් ම පසුව නායකයන් හා පුහුණුකරුවන්ට දොස් පවරමින් ඔවුන් මාරු කරන රටාවෙන් කෙනකුට තේරුම් යන්නේ ප්‍රශ්න තිබෙන්නේ පිටියේ හෝ නායකත්වයේ නොවන බව ය. ලෝක කුසලාන තරගාවලි සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය යවන කණ්ඩායම් දිගින් දිගට ම දුර්වල වීමේ වගකීම ක්‍රිකට් බලධාරීන් මත පැටවෙන්නේ නිරායාසයෙනි.

මෙවර විස්සයි20 ලෝක කුසලාන තරගාවලියේදී ශ්‍රී ලංකා කණ්ඩායමට විඳින්නට සිදුවූ අපහසුතා හා ඇමරිකානු තණතීරුවල ඇති නුසුදුසු බව පිළිබඳ ද වාර්තා වී තිබිණි. එහෙත් මේවා තරගාවලියේ ප්‍රතිවාදී කණ්ඩායම්වලට ද පොදු කාරණාවක් වන බැවින් ඊට අනුගත වීම හැර ඒවා පරාජයට හේතු ලෙස හුවා දැක්වීමට වෘත්තීය ක්‍රීඩකයන්ට හැකියාවක් නැත.

කෙසේ වෙතත් පෙර සඳහන් කළ පරිදි ක්‍රිකට් ක්‍රීඩාවට කොන්දේසි විරහිත ව ආදරය කරන ක්‍රිකට් උන්මාදයෙන් පෙළෙන ශ්‍රී ලංකා ක්‍රීඩා ලෝලීන්ගෙන් හෙට දවසේත් ක්‍රීඩාංගණ පිරී ඉතිරී යනු ඇත. කෝඩුකාර කණ්ඩායමක් පරදවා හෝ ශ්‍රී ලංකා කණ්ඩායමක් ලබන ජයග්‍රහණයක් වෙනුවෙන් ඔවුන් ක්‍රීඩාංගණය පුරා දෝංකාර දෙන ඝෝෂාවකින් 'චියර්' කරනු ඇත. අපේ ක්‍රිකට් ලෝකය කැරකෙන්නේ ඒ විලසිනි.



# INS 'KAMORTA' නිල සංචාරය

**බිනූ දිලාරා ගමගේ**

ශ්‍රී ලංකා නාවික නෞකා සමුදුර නෞකාව සමග පැවති ඒකාබද්ධ නාවික අභ්‍යාස පුහුණුවක් (PASSEX) සඳහා ජූනි 20 දින මෙරටට පැමිණි ඉන්දීය හමුදාවට අයත් INS 'KAMORTA' නෞකාව තම නිල සංචාරය සාර්ථක ව නිමා කරමින් ජූනි 23 දින දිවයිනෙන් පිටත් ව ගියේ ය. ඒ, ත්‍රිකුණාමලය වරායේදී නාවික හමුදා සාම්ප්‍රදායානුකූල ව සමුදීමේ කාර්ය අවසන් වීමෙන් පසුව ය.

මේ නිල සංචාරය දෙරටේ නාවික හමුදා අතර සුහදත්වය හා සහයෝගිත්වය වර්ධනය කිරීමටත් නව දැනුම හා අත්දැකීම් ඔස්සේ සාගර කලාපයේ පොදු සමුද්‍රීය අභියෝග සාමූහික ව ජය ගැනීමටත් උපකාරී වනු ඇත.

INS 'KAMORTA' නෞකාවේ අණදෙන නිලධාරී කොමාන්ඩර් 'Prashant Kumar Mishra' සහ නැගෙනහිර නාවික විධානයේ ආඥාපති රියල් අද්මිරාල් කාංචන බාලගොඩ අතර නිල හමුවක් ද නැගෙනහිර නාවික විධාන මූලස්ථානයේදී පැවැත්විණ. මේ ඒකාබද්ධ නාවික අභ්‍යාස පුහුණුව නෞකා පෙළ හැඩ ඔස්සේ ගමන් කිරීම, නෞකා අතර පණිවුඩ හුවමාරුව වැනි පුහුණු අභ්‍යාසවලින් යුක්ත වූ අතර නෞකා අතර ආචාර සමාචාර සිදු කිරීමෙන් අනතුරු ව එම කාර්යය අවසන් විය.

නෞකාවේ නැව් මුළුව දිවයිනේ ස්ථාන කිහිපයක සංචාරයේ යෙදුණු අතර වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් සඳහා සහභාගි වීමත් නෞකා මෙහෙයුම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණයට නාවික හමුදාවට හා පාසල් සිසුන්ට අවස්ථාව ලබා දීමත් මේ නිල සංචාරය අතර සිදු විය.









දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-